2005 දී මගේ අභියෝගය රටට සාමය උදා කිරීම විය.
2010 දී රට යෝධ සංවර්ධන ප්‍රවේශ මාර්ගයකට ගෙන යාමය.
දැන් අපට අවශ්‍ය වී ඇත්තේ සාමයේ සිසිලස භුක්ති විඳින
ජනතාවට ඇති නැති පරතර රේඛාව මකා දමා
සංවර්ධනයේ ප්‍රතිලාභ ගෙන යාමෙන්
සියළු දෙනාම පොහොසත් කරන
ගමන ආරම්භ කරන්නටය.
මේ කියන පොහොසත්කම කොහෙන් කෙසේ හෝ සොයාගන්නා
සල්ලි වලින් සාක්කු පුරවා ගන්නා සල්ලිකාරකමක් නොවේ
දැහැමිව උපයන මුදලින් අතමිට සරු කර ගන්නා
මනුස්සකමෙන් හදවත පුරවා ගන්නා පොහොසත්කමකි.

ඇති අය නැති අය දෙස අවඥාවෙන් බලන,
නැති අය ඇති අය ගැන ද්වේශයෙන් සිතන සමාජ මාවතේ
දැන්ආ දුර හොඳටම ප්‍රමාණවත්ය.
මින්පසු බතක් නොයිදෙන නිවසක් යනු
අතීත මතක කෞතුකාගාරයේ සිතුවිල්ලක් පමණක් වනු ඇත.
මින්පසු අපේ රටේ පැවතියයුත්තේ
පොහොසත් පුරවැසියන් අතර වෙනස්කම් විනා
දුප්පත් සහ පොහොසත් අසමානතාවයක් නොවිය යුතුය.
තමන් ගැන පමනක් වෙහෙසෙන සිතුවිල්ල වෙනුවට
සමාජීය හැඟීමෙන් යුත් පොදු සමාජය ගැන හැඟීමෙන් යුත්
ප්‍රෞඪ ශ්‍රී ලාංකිකත්වය වෙනුවෙන් වෙහෙසී වැඩකර
එහි ආර්ථික ඵල නෙලා ගන්නා නූතන ශ්‍රී ලාංකිකයෙකු
මම නිර්මාණය කරමි.
එම ශ්‍රී ලාංකිකයා ලොව දිනන බව මට විශ්වාසය.

# මහින්ද චින්තන

## ලොව දිනන මග



| මහින්ද රාජපක්ෂ | | X |
|---|---|---|

## සුරක්ෂිත රටක්

සුබ අනාගතයක්

# මහින්ද චින්තන

## ලොව දිනන මඟ

සුරක්ෂිත රටක්

සුබ අනාගතයක්

# මගේ දැක්ම


සියලු ජය මව්බිමට

# අපේ මෙහෙවර

සමගියෙන් රට නඟා

ලොව දිනන මඟ තැනුම

අප
සමගි සම්පන්න ජාතියකි.
අපට
සුරක්ෂිත රටක් ඇත.
අභිමානවත්
ජාතියකට
අදාළ සියලු පදනම්
අප සපුරාගෙන ඇත්තෙමු.
දැන් කළ යුත්තේ
ඒ අභිමානය
ඒ සුරක්ෂිතතාව
තහවුරු කර ගැනීමය.
දිවි හිමියෙන් සුරැකීමය.
රට වැසියන්ගේ
අවශ්‍යතා සහ ප්‍රාර්ථනා,
යහ ගුණදම් රැකෙන
පරිසරයක සපුරා ගැනීම උදෙසා
මාගේ දැක්ම හා අපේ මෙහෙවර අන්තර්ගතවූ
**"මහින්ද චින්තන ලොව දිනන මඟ"**
මගේ ආදරණීය මාතෘ භූමියේ
අති පූජනීය පැවිදි උතුමන්ට,
දයාබර මව්වරුන්ට, පියවරුන්ට,
සොයුරු, සොයුරියන්ට,
දරු දැරියන්ට සහ
මිතුරු මිතුරියන්ට
සෙනෙහසින් පිළිගන්වමි.



# පටුන


| | | පිටුව |
|---|---|---|
| | මෙතෙක් කථාව | 9 |
| 1 | ජාතික ආරක්ෂාව පිළිබඳ ගෝලීය ආදර්ශයක් | 13 |
| 2 | පුළුල් දේශපාලන ප්‍රතිසංස්කරණයක්<br>- අලුත් දේශපාලන සංස්කෘතියක් | 17 |
| 3 | සදාචාර සම්පන්න සමාජයක් | 23 |
| 4 | රටට වැඩකරන ජාතිහිතෛෂී රාජ්‍ය සේවයක් | 27 |
| 5 | පොහොසත් රටක් | 32 |
| 6 | ජාතික කර්මාන්ත න්‍යාය පත්‍රය | 49 |
| 7 | සංවර්ධනයේ මිහිරි ඵල ගමට ගෙන යන දිවි නැගුම | 60 |
| 8 | ජාතික පෞරුෂත්ව අධ්‍යාපනයක් | 66 |
| 9 | නිරෝගීකම පරම ලාභයයි | 74 |
| 10 | දීර්ඝායු පිණිස ක්‍රීඩා | 80 |
| 11 | යසෝදරා පරපුරට පොහොසත් හෙට දවසක් | 82 |
| 12 | තුරුණු හෙටක් පිරුණු රටක් | 84 |
| 13 | ගමනට සුවපහසුව | 89 |
| 14 | පණ සේ සුරකින පරිසරය | 94 |
| 15 | තිරසර ජන සෙවන | 98 |
| 16 | යටිතල පහසුකම් විප්ලවය නොනැවතී ඉදිරියට | 100 |
| 17 | විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදනය | 107 |
| 18 | කලා කෙත අස්වනු මංගල්‍යය | 109 |
| 19 | සමාජ ආරක්ෂණය | 112 |
| 20 | සාමයේ සංහිඳියාවේ ප්‍රතිලාභ ජනතාවට | 115 |

# මෛත්‍රීක් කථාව........................................................

මව්බිමට නිදහස අත්පත් කර ගැනීම පිළිබඳව වූ අතිමහත් ප්‍රාර්ථනාව දශක ගණනින් වයසට යන අයුරු ඔබ ඉතා අසරණව හූල්මින් බලා සිටින අයුරු මම දුටුවෙමි. මහජන නියෝජිතයෙකු ලෙස එය මට ඉවසුම් නොදෙන්නක් විය. තම ජීවිතය නොව ආදරණීයයන්ගේ ජීවිත හා දේපොළ අග්නි ජාලා මැද සුනුවිසුණු වී යන ආකාරය බලා නොසිට ඊට එරෙහිව ඉදිරිපත් වූ සැමටත් මාතෘභූමියටත් හිමි වූයේ පරාජය හා ලතැවිල්ල පමණි. වැළපීම්වලින් අඩුවක් නොවුණු මගේත් ඔබේත් ආදරණීය මාතෘ භූමියට නිදහසේ සහ සාමයේ අරුණළු වැටෙන්නේ කවදා ද යන්න පිළිබඳව කිසිවෙකුටත් නිනව්වක් නොතිබුණි. අතිබිහිසුණු ත්‍රස්තවාදයෙන් අපේ මව් බිම මුදා ගැනීමේ වගකීම මවිසින් භාර ගත යුතුම බව මම දැඩිව සිතට ගත්තෙමි. මගේ එම අධිෂ්ඨානය ඔබ තේරුම් ගත්තේය. ඒ බ වමට පසක් වූයේ 2005 දි කිසිදු චකිතයකින් තොරව ඔබේ ජනවරම මට ලබාදුන් හෙයිනි.

මම ජනාධිපතිධූරයේ දිවුරුම් දෙන මොහොතේ කඳුළු පුරවාගත් දෙනෙතින් කළ හද කකියවන ඉල්ලීම වූයේ අපේ මව්බිම කුරිරු ත්‍රස්තවාදයෙන් නිදහස් කර දෙන ලෙසටය. මව්බිමේ නිදහස සඳහා වන ඒකායන අරමුණ මගේ හදවතේ ගැඹුරෙහි තැන්පත් කළේ ඔබේ එම කඳුළුය. මාවිල්ආරු සොරොව්ව වසා බීමට වතුර පොදක් නොදී මගේ රටේ ජනයා ස්වභාවික මරණයකට පත් කිරීමට ත්‍රස්තවාදීන් ගත් උත්සාහය රට මුදවා ගැනීමේ සටනේ පළමු වෙඩි මුරය කර ගැනීමට මා කටයුතු කළේ එබැවිනි.





2005 දී ඔබ මට භාරදුන් රට ත්‍රස්තවාදයෙන් පමණක් නොව ආර්ථික අපේක්ෂා අතින්ද හෙම්බත්ව තිබුණි. විරැකියාව හා උද්ධමනය ඉහළ අගයක් ගත් අතර, යටිතල පහසුකම් ඉතා දුර්වල මට්ටමක පැවතුණි. ජාතික ආදායම පහළ මට්ටමක පැවති අතර දුගී දුප්පත්කම ඉහල මට්ටමක පැවතුණි. අධ්‍යාපන, වෛද්‍ය සේවා වල කොතරම් පුරප්පාඩු තිබුණද රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සීමාකර තිබුණු බැවින් එකී සේවාවන් පැවතියේ ජාතික අපේක්ෂාවන් තබා පුරවැසියන්ගේ එදිනෙදා අවශ්‍යතාවන් ඉටු කිරීමට නොහැකි අවාසනාවන්ත තත්ත්වයකටය. රාජ්‍ය ණය ප්‍රමාණය ජාතික ආදායම මෙන් 102% ක් විය. එම නිසා ඔබේ ජීවිත ආරක්ෂා කිරීමේ වගකීම මෙන්ම ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ භාරධූර වගකීමද මා වෙත පැවරුණි.

2009 දී ඔබේත් මගේ ආදරණීය මාතෘභූමිය නිදහස හා සාමය ඉපදුණු සොඳුරු කොදෙව්වක් බවට පත්විය. දෙරණ සිසාරා සතුට දෝරේ ගලන්නට පටන් ගත්තේය. ඔබ ප්‍රීතියෙන් උද්දාමය වී ජය සෝෂා නගද්දී මා ඒ දෙස බලා සිටියේ සතුටු කඳුළු පුරවාගත් දෑසිනි. පියෙකු සහෝදරයෙකු ඥාතියෙකු හිතවතෙකුගේ ලෙන්ගතුකමිනි.

2005 දී මට පැවරූ වගකීම ඉටු කලායැයි සතුටු වූ ඔබ ඉන් පසු මගෙන් ඉල්ලන්නේ වේගවත් සමාජ ආර්ථික සංවර්ධනයක් බව මම දැන සිටියෙමි. 2010 දී පළමු වරට වඩා ඉහළ ජනවරමක් ඔබ මට ලබා දුන්නේ එබැවිනි. ඔබගේ එම බලාපොරොත්තු ද සඵල කරමින් දුගීකම 7% දක්වා අඩුවුණු ඒකපුද්ගල ආදායම ඩොලර් 4000 ක් දක්වාත් ආර්ථික වර්ධන වේගය 7% කට වඩා වැඩියෙන් අඛණ්ඩ ආර්ථික වර්ධනයක් සහිත රටක් මම ඔබට උදාකර දුන්නෙමි.

දක්ෂිණ සහ කටුනායක අධිවේගී මාර්ග ප්‍රමුඛව ගම සහ නගර යා වන මහා මාර්ග පද්ධතියක් ජාත්‍යන්තර මට්ටමෙන් ඉදි කළෙමි. සෑම ග්‍රාමීය මාර්ගයක්ම ප්‍රතිසංස්කරණය කළෙමි. අධිරාජ්‍යවාදී යුගයේ ගොඩනැගූ කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක් නොවූ පාලම් ද ත්‍රස්තවාදීන් විසින් කඩා බිඳ දැමූ පාලම් ද ඇතුළු සමස්ත පාලම් පද්ධතියම අලුත් කළෙමි. මාගම්පුර අලුත්

වරාය, දකුණු කොළඹ නව වරාය සහ ගාල්ල, ත්‍රිකුණාමලය, ඔලුවිල් වරාය ඇතුළු වරාය පද්ධතියක් ගොඩනැගුවෙමි. කටුනායක ගුවන්තොටුපොළ මුළුමනින්ම නවීකරණය කළ අතර මත්තල නව ජාත්‍යන්තර ගුවන්තොටුපොළ නිමවා අභ්‍යන්තර ගුවන්තොටුපොළවල් පද්ධතියක් ද බිහි කළෙමි.

කෙලවරපිටිය, නොරොච්චෝලේ සහ ඉහළ කොත්මලේ බලශක්ති නිශ්පාදනාගාර ඉදි කරමින් සැමට විදුලිය ලබා දුන්නෙමි. පොළොන්නරුව, ත්‍රිකුණාමලය, ගාල්ල, කොළඹ අලුතින් ඉදිකළ පානීය නලජල ව්‍යාපෘති මගින් එම ප්‍රදේශවල ජනයාගේ ජල අයිතිය සුරක්ෂිත කළෙමි. අනිකුත් සියලු දිස්ත්‍රිකවල මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කරමින් සැමට ජලය ලබාදීමේ වැඩසටහන ද මම සම්පූර්ණ කරමි. මොරගහකන්ද, උමා ඔය, දැදුරු ඔය, යාන් ඔය, මාදුරු ඔය මහා පරිමාණ වාරි ජලයෝජනා ක්‍රම මගින් කෘෂිකර්මයේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කළෙමි.

නූතන භාෂාගාර, ගණිතාගාර, විද්‍යාගාරවලින් සමන්විත මහින්දෝදය පාසල් 1000 වැඩසටහන මගින් කොළඹ නගරයේ ඉහළම පාසලේ දරුවන්ට ලැබෙන අධ්‍යාපන අයිතිය ඈත පිටිසර ගමේ පාසලේ දරුවන්ට ද ලැබෙන්නට සැලැස්සුවෙමි. ළමා මිතුරු පාසල් සංකල්පය හරහා මූලික පහසුකම්වත් නොමැති පාසල් 5000 කට ජලය, විදුලිය සනීපාරක්ෂක පහසුකම් ලබා දුන්නෙමි. කොළඹ මහා රෝහලේ සිට ග්‍රාමීය රෝහල දක්වාම සමස්ත සෞඛ්‍ය පද්ධතියම සංවර්ධනය කළෙමි. මේ ඔබ මගෙන් අපේක්ෂා නොකළ තරමේ එහෙත් මම රටට ලබා දුන් සංවර්ධනයෙන් බිඳක් පමණි.

බේද නොතකා මාතෘ භූමියේ සියලු තැන් වලට සංවර්ධනයේ අරුණලු වැටුණි. 2005 දුටු කඳුළු වෙනුවට සිනාසෙන මුහුණත් රටවැසියෙක් මම ගොඩ නැගුවෙමි. ඒ සමගම නිදහසේ දේශපාලනය කරන, දිවා රාත්‍රී නොබියව සැරිසරන, යහපාලනය හා දූෂණ වංචා වලට එරෙහිව නිදහසේ කතා කරන ලියන කියන පරිසරයක් මම නිර්මාණය කළෙමි. 1977 සිට ත්‍රස්තවාදී දුම් වලාවෙන් සැඟවී තිබූ සියලු මාතෘකා නිදහසේ එළියට ඒමට

මං පෑදුවේය. ඒ මාතෘකාවලට අදාළ මූලික පදනම්, තීරණ හා ක්‍රියා පටිපාටි ගත් මම ඔබ සමඟ එක්වී උතුරට පළාත් සභාවක් පිහිටුවීමි. පළාත් පාලන මැතිවරණ පැවැත්වීමි. කොටි හටයන් පුනරුත්තාපනය කොට සමාජගත කොට අවතැන් වූවන් යළි පදිංචි කළෙමි. තුන්සිය හැටපස් දවසේම තිබූ හදිසි නීතිය ඉවත් කළෙමි. උගත් පාඩම් කොමිසම පිහිටුවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළෙමි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිහිටුවා සියලු පක්ෂවලට ආරාධනා කළෙමි. මා බලයට පත් වන විට ලක්ෂ 7 නොඉක්මවූ රාජ්‍ය සේවය ලක්ෂ 14 දක්වා පුළුල් කළෙමි. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වූයෙමි. පුද්ගලික හැඳුනුම්පත නැතිව ඇමතිවරයෙකුටවත් ඡන්දය දැමිය නොහැකිවන තරමට නීතිය බලවත් කළෙමි. දරුවන් පැහැරගෙන ගොස් ළමා සොල්දාදුවන් කළ යුගය මම නිමා කළෙමි. රැස්වීමේ, භාෂණයේ නිදහසට වැටබැඳ තිබූ හදිසි නීතිය නිමා කළෙමි. ප්‍රභූ ආරක්ෂාවට වසා තිබූ මාර්ග විවෘත කළෙමි. පාරේ තිබූ හමුදා පොලිස් බාධක ඉවත් කළෙමි. ආරක්ෂාවට තර්ජනයක් නොවන අයුරින් අධි ආරක්ෂිත කලාප ඉවත් කළෙමි. එවැනි දෑ පිරි දීර්ඝ ලැයිස්තුවක් ඇති බව ඔබ නියම ලෙස දන්නා නිසා ඒ ගැන තවත් නොලියමි.

මෙවැනි පසුබිමක තෙවැනි වරටත් ඔබේ ජනාධිපති ලෙස කටයුතු කිරීම සඳහා වන ජනවරම මා ඉල්ලා සිටින්නේ සංවර්ධනයේ සහ ප්‍රජාතන්ත්‍රීය යහපාලනයයේ පරිපූර්ණත්වය ආදරණීය මාතෘ භූමියට ලබාදීමේ තෙවැනි මෙහෙයුම දියත් කිරීමේ උදාර අරමුණෙනි.



# 1 ජාතික ආරක්ෂාව පිළිබඳ ගෝලීය ආදර්ශයක්

ඇතැමුන් පෙන්වාදීමට උත්සාහ කරනුයේ ත්‍රස්ත්‍රවාදය අතීතයට සීමාවූවක් මිස, වර්තමානයට ඒ හා බැඳුණු අනාගත තර්ජනයක් නොමැති බවය. එහෙත් සත්‍යය එය නොවේ. කොටි සංවිධානය යුරෝපය හා බටහිර රටවල කුරිරු බෙදුම්වාදය හිස දරාගෙන තවමත් තම ගොදුරු සොයා නොනිදා සැරිසරන බව මම දනිමි. ඔවුන් නොකරන්නේ එළිපිට අවිදරා සටන් නොකිරීම පමණි.

ජාතික ආරක්ෂාව කෙරෙහි උපරිම අවදානය අප තබා ගත යුතුව ඇත්තේ, පුපුරනු ලබන එක් බෝම්බයකින් ජාතියේ ඉදිරි ගමන යළි ආපස්සට හැරවිය හැකි බැවිනි. එබැවින්, මාතෘභූමියේ ජාතික ආරක්ෂාව සනාථ කිරීම යනු, ආර්ථික හා සමාජ සංවර්ධනයේ අනිවාර්ය පූර්ව කොන්දේසියක් බව මා තරයේ විශ්වාස කරන්නේ එහෙයිනි. ජාතික ආරක්ෂාව කෙරෙහි මෙතෙක් අඛණ්ඩව අපේ රජය තබා ඇති ඉහළ අවදානය තවදුරටත් ශක්තිමත් කොට පවත්වා ගෙන යෑම මම සහතික කරමි.

සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් ආදී සැමට නිදහසේ ජීවත්වීමට හැකි රටක් මම ගොඩනගා දුන්නෙමි. ඔබ අද බියෙන් මිදුණු හදවතින්, සතුටින් සිත පුරවාගෙන ජීවත්වන නමුත් නොනිදන මම කිසිදු ශ්‍රී ලාංකීය පුරවැසියෙකුට ජනවාර්ගිකත්වය, ආගම, භාෂාව හෝ අන් කිසිදු භේදයක් මත වෙනස් කර නොසැලකීම සහතික කරන අතර සමාජයේ පොදු යහපත සහ රටේ ජාතික ආරක්ෂාව සහතික කිරීම උදෙසා ඒකීය රාජ්‍ය ප්‍රතිපත්තිය අඛණ්ඩව ඉදිරියට ගෙනයන්නෙමි. ඊට හානිකර කිසිදු ඉල්ලීමකට හෝ බලපෑමකට ඉඩ නොදෙමි.

- මම කිසිදු ශ්‍රී ලාංකීය පුරවැසියෙකුට ජනවාර්ගිකත්වය, ආගම, භාෂාව හෝ අන් කිසිදු භේදයක් මත වෙනස් කර නොසලකන බව සහතික කරමි.

- ඒකීය රාජ්‍යය ආරක්ෂා කරගැනීම සඳහා අප සැම ගෙවා ඇති මිළ ඉතා අධිකය. එබැවින් සමාජයේ පොදු යහපත සහ රටේ ජාතික ආරක්ෂාව සහතික කිරීම උදෙසා ඒකීය රාජ්‍ය ප්‍රතිපත්තිය අඛණ්ඩව ඉදිරියට ගෙනයන්නෙමි. නැවත වරක් බෙදුම්වාදයට හෝ රට අස්ථාවර කිරීමට කිසිවෙකුටත් ඉඩ නොතබමි.

- මානුෂීය මෙහෙයුමට සම්බන් රණවිරුවන් ඇතුළු කිසිදු ශ්‍රී ලාංකික පුරවැසියෙක් කවර ජාත්‍යන්තර අධිකරණයකට හෝ පරීක්ෂණයකට ඉදිරිපත් නොකරමි. දිවි හිමියෙන් ඔවුන් සුරකිමි.

- මානුෂීය මෙහෙයුමේදී ශ්‍රී ලංකාවේ වෙසෙන කිසිදු පුරවැසියෙකුගේ මානව අයිතිවාසිකමක් කඩවී ඇත්නම් රටේ පවතින නීතිමය රාමුව තුළ දේශීය ක්‍රමවේදයක් යටතේ විනිවිද බවින් යුතුව යුක්තිය සාධාරණය ඉටු කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් ඇති කරමි.

- නූතන අධිරාජ්‍යවාදයේ යකඩ සපත්තුවට පෑගී ඒ අනුව හුස්ම ගනිමින් හෝ මිය යමින් සිටින සහෝදර රාජ්‍යයන්ට ආදර්ශයක් ලෙස යොදා ගත හැකි දේශපාලන ආදර්ශයක් සහිත රටක් මම සකස් කරමි.

## තිරසර විදේශ ප්‍රතිපත්තිය

- ලෝකය බල කඳවුරු දෙකකට බෙදී පවතිද්දීත් වම් ඉවුර බිඳ වැටී ලෝක දේශපාලනය අසමතුළිත වෙද්දීත් අප ආරක්ෂා කර ගත් අපේ නොබැඳි විදෙස් පිළිවත තිරසාර ලෙස ඉදිරියට ගෙන යමි.

- ත්‍රස්තවාදයට එරෙහිව අප නැගී සිටිනා විට අප සමඟ අත්වැල් බැඳගත් සියලු රටවල් සමඟ මෙන්ම ත්‍රස්තවාදය පරාජය කිරීම වරදක් සේ සළකා අපට දඬුවම් කිරීමට බලා සිටින රටවල් සමඟ ද මිත්‍රශීලී ප්‍රතිපත්තයක් අනුගමනය කරමි.

- ඉන්දියාව, පකිස්ථානය ප්‍රමුඛ සාක් කලාපයේ රටවල් සමඟ සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමට ක්‍රියා කරමි.

- ඉන්දියාව, චීනය, රුසියාව සහ ජපානය යන කලාපීය මිතුරන් සමඟ ඇති දේශපාලන, ආර්ථික හා තාක්‍ෂණික සබඳතා ශක්තිමත් කරමි.

- මැද පෙරදිග කලාපය තුළ මෙන්ම අප්‍රිකානු සහ ලතින් ඇමරිකානු රටවල් සමඟ ඇති විදෙස් සබඳතා තවදුරටත් ව්‍යාප්ත කරමි.

- දකුණු ආසියාවේ රටවල් අතර ඉහළම නීතියේ ආධිපත්‍ය සහිත සාමකාමී රටක් ලෙස ලෝක ඇගයීමට ලක්ව ඇති මගේ රට කලාපීය හා ලෝක ගැටුම්වලදී සාම දූතයෙකුගේ කාර්ය සඳහා යොමු කරවමි.

## ආහාර සුරක්ෂිතතාවට මුල්තැන

යම් රටක ආහාර සුරක්ෂිතතාවය එම රටේ ජාතික ආරක්‍ෂාව තරම්ම වැදගත්ය. ඒ අන් කිසිවක් නිසා නොව යම් රටකට අවශ්‍ය ආහාර තොගය නිසි පරිදි රැස් කොට ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව පවත්වාගෙන යාමට අපොහොසත්වීම හෝ හිතා මතා ඊට බාධා කිරීමෙන් එම රටේ දේශපාලන ස්ථාවරභාවයට සහ ජාතික ආරක්ෂාවට බලපෑම් කිරීමට අන් රටවලට හැකි වන බැවිනි. එබැවින් ශ්‍රී ලාංකීය ජනතාවට යළිත් දණින් වැටෙන්නට මම කිසි ඉඩක් නොතබමි.

- රටේ අවශ්‍යතාවට ගැළපෙන අයුරින් ප්‍රමාණවත් ආහාර නිෂ්පාදනයට, අළෙවියට සහ තොග රැස්කොට පවත්වාගෙන යාමට අවශ්‍ය නීතිමය රාමුවක් සකස් කරනු පිණිස ආහාර සුරක්ෂිතතා පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමි.

- රටේ සහල් නිෂ්පාදනය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යන අතර එදා පටන් අපේ දේශීය ආහාර වන විවිධ වර්ගයේ ධාන්‍ය සහ කොස්, දෙල්, අල, බතල යනාදී සම්ප්‍රදායික වගාව ප්‍රවර්ධනය කරවමි.

- ප්‍රතිසංස්කරණය කරන සෑම වැවක් ආශ්‍රිතවම ජලපෝෂිත ප්‍රදේශවල කොස්, දෙල් වැනි දේශීය ආහාර ශාක වගා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- රජය විසින් මිලදී ගන්නා වී ප්‍රමාණය ජාතික අස්වැන්නෙන් 10% දක්වා වැඩිකර එම වී තොග කුඩා සහ මධ්‍යම පරිමාණ මෝල් සඳහා නිකුත් කිරීමට කටයුතු කරමි.

# 2 පුළුල් දේශපාලන ප්‍රතිසංස්කරණයක් - අලුත් දේශපාලන සංස්කෘතියක්

1978 දී නිසි සංවාදයකින් තොරව අප මත පැටවූ ව්‍යවස්ථාවෙන් වසර තිස් හයක් පුරා අපි බැට කෑවෙමු. එමෙන්ම එකිනෙකට නොගැළපෙන සංශෝධන පැලැස්තර මගින් පවතින ව්‍යවස්ථාව විකෘති හැඩයක් ගෙන ඇතැයි මම ද පිළිගන්නමි. එබැවින් තව තවත් පැලැස්තර එකතු කිරීම වෙනුවට ජනතා පැතුම් පිළිබිඹු කෙරෙන නව ව්‍යවස්ථාවක් වසරක් ඇතුළත සම්මත කිරීමට අවශ්‍ය කටයුතු කරමි.

- ජනතා අපේක්ෂාවන් හඳුනාගෙන නව ව්‍යවස්ථාව නිර්මාණය කිරීම සඳහා සියලුම දේශපාලන පක්ෂවලට අයත් මහජන නියෝජිතයින්ගෙන් සමන්විත සමස්ත පාර්ලිමේන්තුවම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් බවට පත් වනු ඇත.

- අලුත් ව්‍යවස්ථාවට පුරවැසි අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුව නියෝජනය නොකරන දේශපාලන පක්ෂ, යොවුන් පාර්ලිමේන්තුවේ නියෝජිතයින්, ආණ්ඩුක්‍රම විශාරදයින්, විද්වතුන් හා වෘත්තීයවේදීන්ගෙන් සමන්විත පුරවැසි උපදේශක සභාවක් පත් කරමි.

- ව්‍යවස්ථා කෙටුම්පත පවතින ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමි. දෙවනුව මෙම කෙටුම්පත ඔබේ අනුමැතිය සඳහා ජනමත විචාරණයකට ඉදිරිපත් කරමි.

- පවතින විධායක ජනාධිපති ක්‍රමය, මැතිවරණ ක්‍රමය, නීතියේ ආධිපත්‍ය, සහ යහපාලනය වැනි ක්ෂේත්‍ර සියල්ලම නව ව්‍යවස්ථාවෙන් ආවරණය කරමි.





- විධායක ජනාධිපති ධූරයේ හොඳ නරක පිළිබඳ සිදුවන විවාදයට මම සාවදානව සවන් දුන්නෙමි. ඒ අනුව පාර්ලිමේන්තු ක්‍රමයේ පවතින දුර්වලතා බැහැර කරමින්ද යහපත් ලක්ෂණ උකහා ගනිමින්ද විධායක ජනාධිපති ක්‍රමය ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ තීරණය අනුව සුදුසු පරිදි සංශෝධනය කරමි.

- පවතින මනාප ක්‍රමයේ ඇති අයහපත් ලක්‍ෂණය ඉවත් කොට ස්ථාවර ආණ්ඩුවක්, සවිමත් විපක්‍ෂයක්, සුළු ජන කණ්ඩායම් ඇතුළු සමාජයේ විවිධත්වය මැති සබය නියෝජනය වීම යන අරමුණු ළඟා කර ගැනීම සඳහා සමානුපාතික නියෝජනය හා කොට්ඨාශ ක්‍රමය මුසු කළ නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දෙමි.

- මහජන නියෝජිතයින් ජනතාව සමඟ අඛණ්ඩ සංවාදයක නිරත විය යුතු බව මම විශ්වාස කරමි. එමෙන්ම නීති සම්පාදන ක්‍රියාවලියට ජනතා අදහස් සෘජුව ලබා ගැනීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය වඩ වඩාත් යහපත් වනු ඇත. ඒ සඳහා මහා සංඝරත්නය හා අනිකුත් ආගමික පූජකවරුන්, වෘත්තීයවේදීන්, විද්වතුන්, යොවුන් පාර්ලිමේන්තු නියෝජිතයින්, වෘත්තීය සමිති නියෝජිතයින් සහ ප්‍රජා මූල සංවිධානයන්හි ජාතික නායකයින්ද සමන්විත පුරවැසියන්ගේ සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

- මහජන නියෝජිත ආයතනවල කාන්තා නියෝජනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත විධිවිධාන නව ව්‍යවස්ථාවට එක් කිරීමට යෝජනා කරමි.

- සංවර්ධන ක්‍රියාවලිය ප්‍රසාරණය වීමත් සමඟ යහ පාලනය පිළිබඳව නව මානයකින් සලකා බැලීමට අපට සිදු වී ඇත. එමනිසා යහපාලනය ළඟා කර ගැනීමේ අරමුණින් පිහිටුවා ඇති ආයතන වල පවතින දුබලතා අධ්‍යනය කර එම ආයතන ප්‍රතිසංස්කරණය කිරීමට කාලය එළඹ ඇතැයි මම සිතමි. එබැවින් තාක්ෂණය, කළමනාකරණය සහ මූල්‍ය විගණන

හැකියාවෙන් යුත් ජාතික විගණන කොමිසමක් ස්ථාපිත කරමි. ස්වාධීනව සිය විමර්ශන සිදුකළ හැකි අයුරින් අවශ්‍ය මූල්‍ය සහ මානව සම්පත් මෙන්ම බලතලද එම කොමිසමට ලබා දෙන්නෙමි.

- දේශපාලඥයින්ගේ පැවැත්ම පිළිබඳ සමාජයේ කථිකාවක් මතුවී ඇති බැවින් සෑම මහජන නියෝජිතයෙකුම සිය තනතුරේ රාජකාරී ඇරඹීමට පෙර යහ පැවැත්ම සුරැකීම පිළිබඳ ප්‍රතිඥාවක් ලබා දීමට විධිවිධාන සලස්වමි. එකී ප්‍රතිඥාව ධූර කාලය තුළ ආරක්ෂා කරන්නේද නැද්ද යන්න පිළිබඳ සුපරික්ෂාවට ලක් කිරීමේ බලය විගණන කොමිසමට ලබා දෙන්නෙමි.

- කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම ව්‍යවස්ථාමය වගකීමක් බවට පත් කරමි.

- ජාතික වටිනාකමක් සහිත යෝජනා පිළිබඳ අදහස් දැක්වීමට තරුණ පරපුරට ඇති අයිතිය සහතික කිරීම සඳහා එවැනි යෝජනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර යොවුන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඔවුන්ගේ මතය විමසමි.

- අනාගත දේශපාලනය පිළිබඳ ප්‍රාර්ථනා දල්වා ගත් යොවුන් පාර්ලිමේන්තු සමාජිකයින්ටද පර්ලිමේන්තුවේ උපදේශක කාරක සභා වලට නියෝජිතයින් පත් කිරීමට ව්‍යවස්ථාමය අවකාශයක් ලබා දෙමි.

## ඉන්දු-ශ්‍රී ලංකා දාර්ශනික උරුමය සහිත යහපාලන වැඩපිළිවෙලක්

යහ පාලනය යනු නව ලිබරල් යටත් විජිතවාදයේ ව්‍යාජ ශික්ෂා පදයක් නොවේ. එහි සැබෑ මූලධර්ම පදනම් වී ඇත්තේ ගහකොළ සතා සීපා පමණක් නොව ඉර හඳ, අව්ව වැස්ස, සුළඟ, ජලය, මහපොළව යනාදී සියල්ල හා බැඳුණු ඉන්දු ලංකා දාර්ශනික උරුමය මත යැයි මම විශ්වාස

කරමි. එබැවින් යහපාලන මූලධර්ම මා උපුටා ගන්නේ නව ලිබරල්වාදයේ අනුශාසක සංවිධාන හෝ අනුකාරක සංවිධානවලින් නොව කල්වැසි වසින, කෙත් වතු සාර වී සමාජය සමෘද්ධිමත් වන, සොබාදහම සහ ශීලාචාර මිනිස් සමාජය එකිනෙකට බැඳ තබන හේතුඵලවාදී ඓතිහාසික උරුමයන් සහිත ඉන්දු ශ්‍රී ලංකා දැහැමි රාජ්‍ය පාලනයන් තුළිනි. වසර 5,000 ක් පමණ පැරණි එම උරුමය නොනැසී විශ්වීය සත්තාවක් බවට පත්ව අද ද අප නියාමනය කරනු ඇතැයි මගේ හැඟීමයි. පුද්ගල කේන්ද්‍රීයව නීතිය පමණක් මත නොනැවතී ධර්මයේ ආධිපත්‍ය දක්වා ඉහළට ඔසවා ඇති එම යහපාලන මූලධර්මවල සැබෑ උරුමකරුවෝ ශ්‍රී ලාංකික අපි වෙමු. මමත්, ඔබත් ඒ උරුමයේ සාඩම්බර අයිතිකරුවන්ය. එකී උරුමය මත අපේ මාතෘ භූමියට අවැසි සැබෑ යහපාලන ක්‍රමයක් ස්ථාපනය කිරීමට මම ඔබට සහතික වන්නෙමි.

## සාංගමික ප්‍රජාතන්ත්‍රවාදය හා ප්‍රජා ආණ්ඩුකරණය

මේ රටේ ඔබත්, මමත් තනි හුදෙකලා මිනිසුන් නොවේ. වසර දහස් ගණනක ඉතිහාසය තුළ අපේ මුතුන් මිත්තන් ජීවත් වූයේ සාමූහිකවය. සාංගමිකවය. රැකවරණය, සුරක්ෂිතතාවය, පෝෂණය, විනෝදය හා අධ්‍යාත්මික පැවැත්ම එකිනෙකා මත එකිනෙකා බැඳ තබන සුන්දර වූත් බරසාර වූත් සංස්කෘතියක් අප සතුව පැවති නිසාය. පවුල, ප්‍රජාව, ගම, ප්‍රදේශය, නගරය මේ සියල්ල එකම දම්වැලක පුරුක් සේ අදටත් යාවී ඇත්තේ ඒ නිසාය. ගම තුළ නගරයත්, නගරය තුළ ගමත් අප දුටු සිහිනක් වුව ද එය අද අප අත්විඳින යථාර්ථයක් බවට පත් වී තිබේ. එකිනෙකා ස්වේච්ඡාවෙන් බැඳුණු කුඩා, අනු කුඩා ප්‍රජා සංවිධාන, සමාගම් මගේ රටේ ප්‍රජා ජීවිතය සමාජ දේශපාලන වශයෙන් සක්‍රීය කොට ඇත. ලෝකයේ අන් කවර රටකටත් වඩා සාමූහික සංවිධානගත ජනතාවක් මේ රටේ ජීවත් වන බව මා කියන්නේ ඊට අවශ්‍ය පරිසරය සකසා දුන් අයෙකු ලෙස නිහතමානීවය. රටේ ආගමික ආයතනත් සිවිල් සමාජ සංවිධානත්, අනෙකුත් සියලු ප්‍රජා සංවිධානත්, රාජ්‍ය සංවිධානත් ඒකාබද්ධ වූ වැඩසටහන් මගින් ගමේත්, නගරයේත් සාංගමික ප්‍රජාතන්ත්‍රවාදයේ අනුහස

බලගැන්වීම සඳහා මම කටයුතු කරමි. ඒ සඳහා ආගමික සංවිධාන, ප්‍රජා හා ග්‍රාමීය මට්ටමේ ප්‍රජාමූල සංවිධාන, ප්‍රජාමූල ආයතන, සිවිල් සමාජ ආයතන, රාජ්‍ය සංවිධාන නායකයින් නිලධාරීන් හා ක්‍රියාකාරීන් එකට එකතු වී පිහිටුවා ගත හැකි ග්‍රාමනිලධාරී වසම් මට්ටමේ ග්‍රාම සභා ක්‍රමයක් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාමය නෛතික හා පරිපාලන පරිසරයක් සැකසීමට මා කටයුතු කරමි. ඒ සඳහා වන පර්යේෂණ හා කියවූ වැඩසටහන් දැනටමත් අවසාන කොට ඇත. ඒ දැනුම හා අවබෝධය මත සාංගමික අයිතිය තහවුරු කොට, ග්‍රාම සභා මට්ටමේ සංවර්ධන සමාජ හා සංස්කෘතික තීන්දු තීරණ ගැනීමේත්, ක්‍රියාවට නැගීමේත් ජනතා අවකාශ ඇති කරමි.

පාර්ලිමේන්තු, පළාත් සභා සහ ප්‍රාදේශීය ආණ්ඩු මත පදනම් වූ නියෝජිත ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාමාර්ග තහවුරු කිරීමෙන් නොනැවතී ප්‍රජා හා ග්‍රාමීය මට්ටමේ තීරණ ගැනීම සඳහා ඍජු ප්‍රජාතාන්ත්‍රීය සහ සහභාගිත්ව ප්‍රජාතාන්ත්‍රීය ක්‍රමවේද අනුගමනය කිරීම දිරිගන්වමි. එමගින් මගේ රටේ සහෝදර ජනතාව ප්‍රජාතාන්ත්‍රීය යහපාලන ක්‍රියාවලියේ ඓන්ද්‍රීය කොටස්කරුවන් කොට, මෙරට දේශපාලන සංස්කෘතිය සාර්ව මට්ටමේදීත්, ක්ෂුද්‍ර මට්ටමේදීත් ඉහළට ඔසවා තැබීමට විධිවිධාන සලස්වමි. ප්‍රජා මූල හා සාංගමික ජාලය ඒකාබද්ධ කොට සාංගමික ජාතික සංසදයක් පිහිටුවා රටේ ප්‍රතිපත්ති සම්පාදනයේ අනුශාසක ව්‍යුහයක් බවට පත් කරමි.

## භාෂණයේ නිදහසයි. නිදහස් මාධ්‍යයයි.

භාෂණයේ නිදහස මූලික අයිතිවාසිකමක් ලෙස විශේෂත්වයෙන් පිළිගන්නා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවත්වන අපි මාධ්‍ය ආයතනවල ස්වාධීන පැවැත්ම හැම විටම ආරක්ෂා කරමු. එමෙන්ම සමාජයේ සියලුම සාමාජිකයන්ගේ භාෂණයේ අයිතිය දක්වා මාධ්‍යයේ නිදහස මම හැම විටම ආරක්ෂා කළෙමි. එහෙයින් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නිදහස් හා ස්වාධීන පැවැත්ම තවදුරටත් ආරක්ෂා කිරීමට කැප වෙමි. මාධ්‍යයේ මූලික කාර්යභාරය හුදු සන්නිවේදන සම්බන්ධතාවන්ගෙන් ඔබ්බට යමින් එය

ජාතික සංවර්ධන සහායකයෙකු බවට පත්වීම බව මම විශ්වාස කරමි. අද අප ජීවත්වන මෙම ඩිජිටල් යුගය තුළ මුද්‍රිත මාධ්‍ය, ගුවන්විදුලි මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය හා වෙබ් මාධ්‍ය ක්‍රියාකාරීත්වය රටේ සංවර්ධනයටත්, ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්මටත්, අත්‍යවශ්‍ය සාධකයක් බව ඔබ හොඳින් දන්නවා ඇත.

- සාම්ප්‍රදායිකව පැවැත එන මුද්‍රිත, ගුවන් විදුලි හා රූපවාහිනී ක්ෂේත්‍ර අතර තාක්ෂණික පුහුණුවීම් සඳහා විශේෂ වැඩපිළිවෙලක් හඳුන්වා දෙන්නෙමි.

- ජනමාධ්‍යවේදියා වෘතීයවේදියෙකු බවට පත්කිරීම සඳහා අවශ්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- සියලු ආකාරයේම මාධ්‍යවේදීන් දැනුමෙන් හා වෘත්තීය පුහුණුවෙන් සවිබල ගැන්වීම සඳහා ජනමාධ්‍ය විශ්වවිද්‍යාල විද්‍යා ආයතනයක් පිහිටුවමි.

- ජනමාධ්‍යවේදීන් සඳහා කොළඹ නගරය ආසන්නයේ වෙනම නිවාස සංකීර්ණයක් ඉදිකර දෙන්නෙමි.

- ජනමාධ්‍ය යනු හුදු වෙළඳපොළ ක්‍රියාවලියක් නොව ජාතික අභිලාශ කේන්ද්‍රීයව ක්‍රියාත්මක විය යුතු ජාතික වගකීමක් සහිත ක්ෂේත්‍රයක් බැවින් ඒ සඳහා වූ ජනමාධ්‍ය සංස්කෘතියක් ගොඩ නැගීමට කටයුතු කරමි.





# 3 සදාචාර සම්පන්න සමාජයක්

රටක් භෞතික සංවර්ධනය තුළින් ලබා ගන්නා ජයග්‍රහණ දිගුකාලීනව ආරක්ෂා කරගත හැක්කේ එම ක්‍රියාවලිය සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමේ ක්‍රියාවලිය සමඟ නිසි ලෙස මුසු කරගතහොත් පමණක් බව මම තරයේ විශ්වාස කරමි. අප ලෝකයේ පැරණිම ශිෂ්ඨාචාර කිහිපයකින් එකකට අයත්වන ජාතියකි. ඒ පිළිබඳව වන ආඩම්බරය අප රටේ සිංහල, දෙමළ, මුස්ලිම් මහා ජාතියටම අයත් වෙයි. එම නිසා අප ජාතියක් ලෙස ලබාගෙන ඇති මහා ජයග්‍රහණ අප විසින් තහවුරු කරගත යුත්තේ අපගේ එම අසමසම ශිෂ්ඨාචාරයේ උරුමය මත දෙපා තබාගෙනය. ජාතියේ අඛණ්ඩ දියුණුව හා වර්ධනය පමණක් නොව ජාතික සමගිය සහ ඒකාග්‍රතාවයද රඳා පවතින්නේ අපගේ එම ශිෂ්ඨාචාරගත උරුමයන්ට පණදීමට අප කොතෙක් සමත්වනවා ද යන්න මත බව මම දනිමි. එම උරුමයන්ට පණදීම යනු අන් කිසිවක් නොව ඓතිහාසිකව අප සතු වූ සදාචාර සම්පන්න සමාජය නැවත ගොඩනැගීමයි.

## ආගමික සංවර්ධනය

- සම්බුද්ධ ශාසනය ප්‍රධාන කර අනෙකුත් සියලු ආගමික සංස්ථාවන් පෝෂණය කිරීම සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන්නෙමි.

- සියලුම ආගමික සංස්ථාවන්ගේ ඓතිහාසික සම්ප්‍රදායන් සහ කතිකාවත් අනුව ඒවායේ දියුණුව තහවුරු කිරීම සහා අවශ්‍ය නීතිමය රාමු ආගමික නායකයින්ගේ උපදෙස් පරිදි සකස් කරමි.

- සම්බුද්ධ සාසනයේ දියුණුව සඳහා සාකච්ඡාවට බඳුන් වී ඇති නව විහාරගම් දේවාල පනත ඇතුළු සියලු අන පනත් කඩිනමින් සාකච්ඡාවට ලක් කොට සම්මත කිරීමට කටයුතු කරමි.

- ශ්‍රී ලංකාවේ අවුරුදු 2300 ක් තරම් දිවෙන බෞද්ධ සංස්කෘතියේ ප්‍රධානතම පැතිමානයක් වූ බෞද්ධ පොත පත සහ ලේඛණ ශාසනික උන්නතිය සහ බුදුදමහම ගැන උනන්දුවන විදේශිකයන්ට මෙන්ම වෙනත් ආගමිකයන්ට ද පරිහරණය පිණිස අනාගතයට දායාද කර දීම සඳහා නූතන තත්ත්වයන්ට ගැළපෙන ලෙස සුරක්ෂා කිරීම සඳහා ජාතික බෞද්ධ පුස්තකාලයක් අනුරධපුරයේ ස්ථාපනය කරමි.

- පාසල් අශ්‍රිතව දරුවන්ගේ සදාචාර වර්ධනය මුල්කරගත් ජාතික ව්‍යාපාරයක් ආරම්භ කරමි. එම ව්‍යාපාරය ප්‍රමාණාත්මක වශයෙන් මෙන්ම ගුණාත්මකව උසස් මට්ටමින් ඊට සෑම පාසලකම දරුවන් අදහන ආගම මුල්කර ගනිමින් බිහිවිය යුතු බව මම තරයේ විශ්වාස කරමි. මම එම ව්‍යාපාරයට ඉතා සතුටින් නායකත්වය දීමට කැමැත්තෙමි.

## ළමා සහ කාන්තා හිංසනයට තිත

- දරුවන් අපයෝජනයෙන් හා හිංසනයෙන් මුදා ගැනීම සඳහා අවශ්‍ය දැඩි නීති පද්ධතියක් දණ්ඩ නීති සංග්‍රයට එක් කරමි.

- සෑම ආකාරයේම කාන්තා හිංසනයන වැලැක්වීම සඳහා හිංසන විරෝධී සහ වින්දිත රැකවරණ නව පනතක් ඉදිරිපත් කරමි.

- දරුවන්ට හෝ කාන්තාවන්ට එරෙහිව සිදුවන හිරිහැර පිළිබඳව දැන්වූ සැනින් ක්‍රියාත්මකවීම සඳහා වෙනම ‘‘ජංගම පොලිස් බලඇණියක්’’ ස්ථාපනය කරමි.

- සෑම ගමකම ‘‘*ළමා සහ කාන්තා රැකවරණ කමිටුවක්*’’ පිහිටුවමි.

- අනවශ්‍ය දරුවන් උපතේදීම මරා දැමීම වැළැක්වීම සඳහා එවැනි දරුවන් මවගේ අනන්‍යතාව හෙළි නොවන පරිදි පළාත් ළමා හා පරිවාස මධ්‍යස්ථානවලට භාරදීමට හැකි නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන්නෙමි.

- නිවසේදී හෝ පාසලේදී දරුවන් පහරකෑමට, පීඩාවට හා අපයෝජනයට ලක්වීම වැළැක්වීම සහා දෙමව්පියන් ගුරුවරුන් හා සිසු සිසුවියන්ගෙන් සැදුම්ලත් “ළමා සුරැකුම් පවුර වැඩසටහන” හඳුන්වා දෙන්නෙමි.

- සියලු රජයේ ආයතනවලත්, ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලටත් මනෝ සමාජීය උපදේශකවරුන් පත්කිරීමට යෝජනා කරමි.

- දරුවන්ට අහිතකර ඖෂධ වර්ග අලවිකරණ ඖෂධ අලෙවිසල් හිමියන්ට හා ඒවායේ සේවය කරන්නන්ට හා සමාජ විරෝධී ක්‍රියාවන්ට, දරුවන් පොළඹවන්නන්ට එරෙහිව දැඩි දඬුවම් පැමිණවීම සඳහා අවශ්‍යය නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කරමි.

## පාතාලයට සහ මත් කුඩු උවදුරට සඳහටම නැවතුම

පාතාල නායකයින්ට සාමදාන විනිශ්චකාරකම්වලට සහ කෘත්‍යාධිකාරී මණ්ඩලවලට පත් කළ කාලයට තිත තබා මම ඒ පාතාලය සහ කුඩු අධිරාජ්‍යය දැඩි මර්ධනයකට ලක් කළෙමි. පාතාල කුඩුකාරයන්, කප්පම්කාරයන් ඇතුළු සෑම අපරාධ කල්ලියක්ම සම්පූර්ණයෙන්ම මර්දනය කර ශ්‍රී ලංකාවේ අපරාධ සංස්කෘතිය නැමැති පොතේ අවසන් පිටුව ලියන්නෙමි.

- මත්ද්‍රව්‍ය ජාවාරම් සහ මහා පරිමාණ අපරාධ වැළැක්වීම සඳහා යුදහමුදා සහය සහිත විශේෂ ආරක්‍ෂක බල ඇණියක් පිහිටුවන අතර එම වැරදි විභාග කර කඩිනමින් වැරදිකරුවන්ට දඬුවම් ලබාදීම සඳහා විශේෂ අපරාධ අධිකරණයක් පිහිටුවමි.

- අපේ ගොඩබිමෙහි මෙන්ම මහ මුහුදෙහිත් මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ කිසිදු ක්‍රියාවකට ඉඩ නොලැබෙන පරිදි මත්ද්‍රව්‍ය නාශක නාවුක බලකායක් ගොඩ නගමි.

- මත්ද්‍රව්‍ය මෙරටට ගෙන්වීමත් මෙරට හරහා බෙදාහැරීම වැළැක්වීමටත් පොලීසිය පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය, රේගු දෙපාර්තමේන්තුව සහ අදාළ අනෙකුත් අංශවල නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් හා සම්පත් නොඅඩුව ලබා දෙන්නෙමි.

## සතා සීපාවාට ද සෙනෙහසේ රැකවරණ

අපි දියෙහි වැටුණු කුහුඹුවා පවා ඇඟිල්ලෙන් ඉවත් කරන සෙනෙහෙවන්ත ජාතියක් වෙමු. සෙනෙහස අපේ ජාතිකත්වයේ සංකේතයයි. නිදහසේ සැරිසරන සුනඛයෙකුට පවා හිරිහැර නොකරන අපේ සත්ව කරුණාව උසස් බව මම දනිමි. එබැවින් මිනිසුන්ට පමණක් නොව සතා සීපාවාට පවා දක්වන සෙනෙහසේ රැකවරණය තවදුරටත් පුළුල් කරන සත්ව කරුණා වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- මහමඟ දමා යන පැටවුන් ඇතුළු සුනඛයන් සුරක්ෂිතව රැකබලා ගන්නා මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සත්ව කරුණා සංවිධානවලට ආරාධනා කරමි. ඒ සඳහා අවශ්‍ය ස්ථාන සහ ආධාර රජයෙන් ලබා දෙන්නෙමි.

- අබණ්ඩව සතුන්ට ආදරය කරුණාව දක්වන පුද්ගලයන් ඇගයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

# 4 රටට වැඩකරන ජාතිහිතෛෂි රාජ්‍ය සේවයක්

දිනකට රුපියල් දහයක වැටුප් වැඩි කිරීමක් ඉල්ලා වර්ජනය කළ වැඩකරන පංතිය පැය විසිහතරෙන් ගෙදර යැවූ සහ රජයේ සේවය කප්පාදුකර විශ්‍රාම වැටුප අහිමි කිරීමට වෙර දැරූ අතීතය ඔබේ මතකයේ ඇතැයි මම සිතමි. උපාය මාර්ගික රාජ්‍ය ව්‍යවසායන් විනාශ කළේ ද වැදගත් රාජ්‍ය සංස්ථා කුණු කොල්ලයට විකුණා දැමුවේ ද ඔවුන්ය. ඒ සියල්ල කිරීම සඳහා ඔවුන් බලය ලබා ගත්තේ වචනවලට පමණක් සීමා වූ මහා පරිමාණ වැටුප් වැඩි කිරීමේ පොරොන්දු ලබා දීමෙන් බව ඔබට හොඳින් මතක ඇති බව මම දනිමි. පෞද්ගලීකරණය කිරීම සඳහා ජනතාකරණය වැනි වචන භාවිතා කළ ඔවුන් තමසෙක්කරණය ගැන කථා කරමින් යළි උත්සාහ කරන්නේ රාජ්‍ය සේවය මුළුමනින්ම දිය කර හැරීමේ තම සැඟවුණු න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට බව ඔබට අමුතුවෙන් කිවයුතු නැති බව මම දනිමි. එබැවින් රාජ්‍ය අයිතිය තහවුරු කරමින් රාජ්‍ය සේවය තව දුරටත් බල ගන්වා වාර්ෂික වැටුප් වර්ධක ලබා දෙමින් අප ගෙනියන වැඩපිළිවෙළ කිසිසේත් වෙනස් නොකරන බව මම ඔබට සහතික වන්නෙමි. විශ්‍රාම වැටුප් අයිතිය, අර්ථසාදක අරමුදල් අයිතිය වැනි රාජ්‍ය සේවකයාට හිමි සියලු වරප්‍රසාද තව තවත් ශක්තිමත් කර රාජ්‍ය සේවකයා ගෞරවනීය පුරවැසියෙකු කරන්නට මම ඇපකැපවී සිටින බව ප්‍රකාශ කරමි.

- අනවශ්‍ය මැදිහත්වීම් හා සීමාකිරීම්වලින් තොරව ස්වාධීනව තම සේවය ඉටු කිරීමට හැකි වන පරිදි නව සේවා ආචාර ධර්ම පද්ධතියක් රාජ්‍ය සේවයට හඳුන්වා දෙන්නෙමි.

- නිසි වැටුප්තලයන් හා මාණ්ඩලික තනතුරු සඳහා ප්‍රවේශ විය හැකි ක්‍රමවේදයක් සහිත සේවා ව්‍යවස්ථාවක් උපාධිධාරීන් සහ සංවර්ධන නිලධාරීන් සඳහා සකස් කරමි.

- කළමනාකරණ සහකාර හා සමාන්තර ශ්‍රේණිවල සේවය කරන උපාධිධාරීන් නොවන නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන

පරිපාලන ආයතනය සමඟ ඒකාබද්ධව උපාධි ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කරමි.

- තාක්ෂණික හා විද්‍යාත්මක සේවාවන්හි වර්ධනය සඳහා එකී සේවාවන්වලට බැඳෙන නිලධාරීන් ඇගයීමට ලක් කරන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරමි.

- රජයේ සේවකයින් සඳහා තමන්ගේම නිවාසක අයිතිය සහතික කරන නව නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

- දේපළක ස්ථිර අයිතිය අපේක්ෂා නොකරන නාගරාශ්‍රිතයන්හි රැකියාකරන අයගේ කුලී නිවාස ඉල්ලුම වැඩිවී ඇති නිසාම නිවාසවල කුළිය සාමාන්‍ය ජනයාට දරාගැනීමට නොහැකි තරම් ඉහළ ගොස් ඇති බව මම දනිමි. එබැවින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙයංශයේම ආයෝජනය දායකත්වයෙන් උපනගර ආශ්‍රිතව කුලී මහල් නිවාස පද්ධති ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

- තම සේවකයන්ගේ නවාතැන් පහසුවට උපකාර කිරීමට කැමති පෞද්ගලික සමාගම් සහ ව්‍යාපාරිකයන්ට ද මෙම වැඩසටහන ආයෝජන දායකත්වය සැපයීමෙන් තමන්ට අවශ්‍ය නිවාස ප්‍රමාණය ආරම්භයේදීම වෙන්කරවා ගැනීමට ඉඩ සලසමි.

- ජනතාවට සිදුවන පරිපාලනයේ අතපසුවීම් පිළිබඳව සොයා බලා කාර්‍යක්ෂම සේවාවක් ලබා දීම සඳහා මැදිහත් වීමට "පරිපාලන යුක්තිපතියෙකු" පත් කරමි.

- නීතිවේදීන්ට සහ නොතාරිස්වරුන්ට ඇති ඔප්පු ලීවීමේ අයිතිය සහතික වන ආකාරයට ලේඛණ ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කරමි.

# අභිමානවත් හමුදාවක් සහ ගෞරවාන්විත පොලීසියක්

වීරෝධාර ත්‍රිවිධ හමුදාවක් මෙන්ම අභීත පොලීසියක් සහ සිවිල් ආරක්‍ෂක බලකායක් නොවන්නට ඔබටත් මටත් අද රටක් නොමැති බව මම කිසිදා අමතක නොකරමි. රාජ්‍යයත්, රටවැසියාත් ආරක්ෂා කළ ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක බලකාය එදා මෙන් සැමදා ශක්තිමත් කොට සවිබල ගන්වමි.

- කාර්යක්‍ෂමතාව සහ අපරාධ පරීක්‍ෂණ හැකියාව අතින් අපේ පොලීසිය ලෝකයේ කවර පොලීසියකටවත් නොදෙවෙනි බව පසුගිය සමයේ කරන ලද අපරාධ විමර්ශන මගින් මනාව ඔප්පු කර ඇත. එබැවින් අපරාධ විමර්ශන තවදුරටත් විද්‍යාත්මක හා පහසුකරණය කිරීම සඳහා නවීන උපකරණ, තාක්‍ෂණික පහසුකම් පුහුණු සහ ප්‍රවීණ මානව සම්පත් ලබා දෙන්නෙමි.

- වෙනත් රටවල මෙන් යුද්ධය හෝ ප්‍රබල හමුදා මෙහෙයුම් නිමා වීමෙන් පසු සිදු කරන්නේ විශාල වශයෙන් හමුදා භටයන් ඉවත් කිරීමය. තනතුරු වලින් පහත හෙලීමය. එහෙත් පසුගිය හව වසර පුරාම එබඳු කිසිවක් මම නොකලෙමි. ඉදිරියටත් කිසිදු හමුදාවක ස්ථිර සේවයෙන් යුතු සෙබළුන්, අතිරේක බල හමුදා, ස්වේච්ඡා භටයන් හෝ සිවිල් ආරක්ෂක සේවා බලකායන් ඉවත් නොකරමි.

- කිසිදු හමුදා නිලධාරියෙක් හෝ සෙබලෙක් ඔවුන් දරණ තනතුරු වලින් ඉවත් නොකරමි.

- ආබාධිතභාවයට පත්වුනු සියළු සෙබළුන් ඔවුන්ගේ ජීවිත කාලය පුරා ඔවුනට හිමි සියළු වරප්‍රසාද ලබා දෙමින් රැක බලා ගන්නෙමි.

- විශ්‍රාමික හමුදා සෙබළුනට රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් කරන අතර ඔවුනට හිමි වෛද්‍ය පහසුකම්, විවේක මධ්‍යස්ථාන ආදී පහසුකම් තව දුරටත් වර්ධනය කරමි.

- පොලීසියේ ස්වාධීනත්වය ආරක්‍ෂා කර ගනිමින් රාජකාරිය ඉටුකිරීමේදී ඔවුනට අවශ්‍ය නවාතැන්, වාහන හා අනෙකුත් පහසුකම් නොඅඩුව සැපයීමට කටයුතු කරමි.

- හමුදාවන්ට, පොලීසියට හා සිවිල් ආරක්‍ෂ බලකාය ඇතුළු සියලුම රජයේ සේවයයන්ට අවංකව හා තෘප්තිමත්ව කර ගෙනයාම පහසු කිරීම සඳහා ඔවුන්ගේ පෞද්ගලික ගැටලු පවා තනි තනි වශයෙන් හඳුනාගෙන උපකාර කිරීමේ නව උපදේශන ක්‍රමවේදයක් හඳුන්වා දෙන්නෙමි.

## අර්ධ රාජ්‍ය ආයතන, බැංකු සහ පෞද්ගලික අංශය

රටේ ආර්ථික සංවර්ධනය උදෙසා මෙම අංශයෙන් ලබා දෙන දායකත්වය මම කිසිවිටක ලඝු කොට නොසලකමි.

- සේවක අර්ථසාධක අරමුදල සුරක්‍ෂිත කරන අතර ඒ සඳහා ඔවුන්ගේ අයිතිය කවර කරුණක් නිසා හෝ අහිමි නොකරමි.

- පෞද්ගලික අංශය සඳහා ශක්තිමත් සෞඛ්‍ය රක්‍ෂණ ක්‍රමයක් ලබා දීමට කටයුතු කරමි.

- නැවත ක්‍රියාත්මක කරන ලද බැංකු විශ්‍රාම වැටුප් අයිතිය මෙතෙක් එම අයිතිය නොලද බැංකුවල සේවකයන් සඳහා මෙම වසරේ ජනවාරි මාසයේ සිට වලංගු වන පරිදි ලබා දෙන්නෙමි.

- අර්ථසාධක අරමුදල්වල අයිතියට අමතරව පෞද්ගලික අංශයට ද එම ආදර්ශය අනුව යමින් කැමැත්තෙන් ඇතුළත් විය හැකි ආකර්ෂණීය විශ්‍රාම වැටුප් ක්‍රමයක් මම යෝජනා කරමි.

## විදේශ සේවා නියුක්තිකයන්

- දීර්ඝ කාලයක් විදේශ රටවල සේවය කර ලංකාවේ ස්ථිර පදිංචිය සඳහා පැමිණෙනන් සඳහා බදු සහන වාහන බලපත්‍රයක් ලබා දෙන්නෙමි.
- විදේශයන්හි සේවයේ යෙදී සිටියදී සදාකාලික ආබාධිතව ලංකාවට පැමිණි අයට විදේශසේවා නියුක්ති කාර්යාංශය මගින් මාසික සහන මුදලක් ගෙවීමට සලස්වමි.
- රටවිරු වැඩසටහන හරහා විදේශගතවන සැමගේ නිවාස සිහිනය සැබෑ කර දීම සඳහා ඔවුනට නිවස ඉදිකර දීමේ කාර්යය ඉටු කරදීමේ වැඩසටහන ශක්තිමත් කරමි.
- විදේශ ගතව සේවය කරන්නන්ට දේශීය මැතිවරණවලදී ඡන්දය දීමේ අයිතිය ලබා දෙන්නෙමි.
- විදේශ රැකියා කාර්යාංශයේ ලියාපදිංචි වී වසර හයකට වඩා වැඩිකාලයක් විදේශ රටවල සේවය කර පැමිණෙන්නන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් මේ වසරේදී හඳුන්වා දෙන්නෙමි.
- විදේශ රැකියාවල යෙදී සිටින ගෘහ සේවිකාවන්ගේ පවුල්වල සුබසාධනය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විධිමත් උපදේශන සේවාවක් ආරම්භ කරමි.

# 5 පොහොසත් රටක්

බත බුලතින් සරුව තිබූ ශ්‍රී ලංකා ද්වීපය බටහිර ආක්‍රමණයට නතුවූදාම පරිහාණියේ ද්වාරය විවර කර ගත්තේය. 1948 අප නිදහස ලබන විට අප සතුව පැවති ස්වයංපෝෂිත ආර්ථිකය, යහපාලන රාජ්‍ය ක්‍රමය, උසස් සම්ප්‍රදායානුකූල ශිල්පීය දැනුම සහ පොහොසත් සමාජ සංස්කෘතිය මුළුමනින්ම බිඳ වැටුණි.

නිදහසින් පසු බිහිවූ ආණ්ඩු ද අපට විවර කළේ පැරණි පාරේම යන පරාධීන ආර්ථික ප්‍රවේශ මාර්ගයකි. අපේ ආණ්ඩු කාලවලදී පවා ඉන් මිදීමට අපගත් උත්සහයන් සම්පූර්ණයෙන්ම සාර්ථක කර ගත නොහැකි වූ බව මම නිහතමානීව පිළිගනිමි.

1977 දී ආරම්භ වූ විවෘත ආර්ථිකය මගින් රටේ දොරගුලු ලෝකයටම විවෘත වීමත් සමග ටික දෙනෙක් අතිශයින් පොහොසත් වී බහුතරය දුප්පතුන්ගේ ගොඩට ඇද වැටීමෙන් සමාජ අසමානතාව අහස පොළව තරම් දුරස් විය. 1987 තරුණ නැගිටීම, උතුරේ සන්නද්ධ නැගිටීම් ආදී සියල්ලම මෙකී අසමානතාව විසින් අපේ සමාජ ආර්ථික දේහයට බලහත්කාරයෙන් කාවද්දනු ලැබූ භයානක රෝගීත්වයන්ගේ සළකුණුය.

2005 දී මගේ අභියෝගය රටට සාමය උදා කිරීම විය. 2010 දී රට යෝධ සංවර්ධන ප්‍රවේශ මාර්ගයකට ගෙනයාමය. දැන් අපට අවශ්‍ය වී ඇත්තේ සාමයේ සිසිලස භුක්ති විඳින ජනතාවට ඇති නැති පරතර රේඛාව මකා දමා සංවර්ධනයේ ප්‍රතිලාභ ගෙන යාමෙන් සියලු දෙනාම පොහොසත් කරන ගමන ආරම්භ කරන්නටය. මේ කියන පොහොසත්කම කොහෙන් කෙසේ හෝ සොයා ගන්නා සල්ලිවලින් සාක්කු පුරවා ගන්නා සල්ලිකාරකමක් නොවේ. දැහැමිව උපයන මුදලින් අතමිට සරු කර ගන්නා මනුස්සකමෙන් හදවත පුරවා ගන්නා පොහොසත්කමකි.

ඇති අය නැති අය දෙස අවඥාවෙන් බලන, නැති අය ඇති අය ගැන ද්වේශයෙන් සිතන සමාජ මාවතේ දැන් ආ දුර හොඳටම ප්‍රමාණවත්ය.

බතක් නොඉදෙන නිවසක් යනු අතීත මතක කෞතුකාගාරයේ සිතුවිල්ලක් පමණක් වනු ඇත. මින්පසු අපේ රටේ පැවතිය යුත්තේ පොහොසත් පුරවැසියන් අතර වෙනස්කම් විනා දුප්පත් සහ පොහොසත් අසමානතාවයක් නොවිය යුතුය. තමන් ගැන පමණක් වෙහෙසෙන සිතුවිල්ල වෙනුවට සමාජීය හැඟීමෙන් යුත් පොදු සමාජය ගැන හැඟීමෙන් යුත් ප්‍රෞඩ ශ්‍රී ලාංකිකත්වය වෙනුවෙන් වෙහෙසී වැඩකර එහි ආර්ථික පල නෙළා ගන්නා නූතන ශ්‍රී ලාංකිකයෙකු මම නිර්මාණය කරමි.

2010 දී, මම ඔබට පොරොන්දු වූයේ 2016 වන විට අපේ රටේ ඒක පුද්ගල ආදායම ඇ.ඩො. 4,000 ක් බවට පත් කිරීමටය. මා දුන් එම පොරොන්දුව, 2015 දීම ඉෂ්ට කරන්නට මට ඉඩ ලැබීම ගැන මම නිහතමානීව ආඩම්බර වන්නෙමි. එලෙස, 2020 වන විට ආර්ථික සංවර්ධන වේගය අඛණ්ඩව 7% කට වඩා වැඩි වේගයකින් පවත්වාගෙන යමින්, රටේ ඒක පුද්ගල ආදායම ඇ.ඩො. 7,500 ක් නැත්නම් රුපියල් දශ ලක්ෂයකට වඩා ඉහල මට්ටමකට පත් කරන්නට මම කටයුතු කරමි. එමගින් මිලියන 20 ජනතාවක් පොහොසතුන් බවට පත් කරමි.

## පරිසර හිතකාමී තාක්ෂණික කෘෂි ප්‍රවේශයක්

මගේ පියා ගොවියෙකි. ඔහුගේ පියාත් ගොවියෙකි. මා තෝරාගත් කෙත ඔවුන් වගා කළ කුඹුරට වඩා මඩ ගොහොරින් පිරී තිබුණ ද මම එය අස්වැද්දුවෙමි. අද ඔබ භුක්ති විඳින්නේ මා නෙලූ එහි අස්වැන්නයි. එහෙත් කුඹුරේ, කෙතේ, නියරේ මඩ සුවඳ මම හොඳින් හඳුනමි. බණ්ඩි ගොයම කිරිවදිනා කෙත්යාය පිස හමනා සුළඟ තරම් මට කිසිත් මිහිරි නැත. එබැවින් ගොවිතැන එදාමෙන් අදත්, හෙටත් අපේ ආර්ථිකයේ ජීවනාලිය බව මම විශ්වාස කරමි.

හරිත විප්ලවය මගින් හඳුන්වා දී ඇති බීජ වර්ග, රසායනික පොහොර සහ කෘෂි රසායනවලින් තොරව නොවැවෙන නිසා අපේ බිම්වල මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු විෂ රසායන රහිත කෘෂිකර්මයේ ක්‍රමානුකූලව සහ

සාධනීය වර්ධනයක් තුළින් පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ගොඩනගා ගැනීමේ නව ප්‍රවේශයකට රට යොමු කරමි. වගාවට බිම, නිසි කලට වතුර, පැළ ගොයමට පොහොර, අස්වැන්න නෙළූ විට නිසි මිලක් ඇති වෙළඳපොළක් ඇත්නම් කුඹුරේ සිටියදීත් සෑම ගොවියෙකුම රජකු වන බව මම දනිමි.

## වගාවට ඉඩම්

- නිසි පරිදි භාවිතයට නොගන්නා ඉඩම් ආහාර නිෂ්පාදනය සඳහා යොදා ගැනීම පිණිස ජනතාවට ලබාදීම සඳහා ඉඩම් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ නිර්දේශ ක්‍රියාවට නංවමි.
- එවැනි ඉඩම් හඳුනා ගෙන ලියාපදිංචි කිරීම සඳහාත් ඉඩම් අපේක්ෂා කරන්නන් ලියාපදිංචි කිරීම සඳහාත් ඉඩම් බැංකුවක් පිහිටුවමි. එකී ඉඩම් කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායනට බදු පදනම යටතේ ලබා දෙන්නෙමි.

## ගහකොළට සතා සීපාවාට දියවර

ජලය අපේ මව්බිමේ පූජනීයත්වයයි. මුණි සිරිපා පහස ලද සමනළ කන්දෙන් පැන නැඟ රටේ සිව්කොණ ගලා යන මහවැලි, කළු, කැළණි, වලවේ යන ගංගා එම පූජනීයත්වයේ සජීවී සංකේතයන්ය. එබැවින් මහා පරාක්‍රමබාහු රජතුමා කී පරිදි ජල බිඳුවක් හෝ අපතේ නොයැවිය යුතු බව මම ද විශ්වාස කරමි. මිනිසුන්ට පමණක් නොව, ගහ කොළ, සතා සීපාවට ද ජලය කෙරෙහි ඇති අයිතිය තහවුරු කරමි.

## යාපනයට ගඟක් - අලිමංකඩට වැවක්

එක් යුගයක දකුණේ ගොවියා මිරිස්, ලූණු වගා කිරීම සඳහා ඉගෙන ගත්තේ යාපනයේ ගොවීන්ගෙනි. එම ගොවීන්ගේ ජල අවශ්‍යතාවය සැපිරීම මගේ

වගකීමක් බව මම දනිමි. 1920 ගණන්වලදී කනකරායන් ආරුඹය හරහා අලිමංකඩ කලපුවට ගලා ගිය ජලය රඳවා ගනිමින් මිරිදිය විලක් නිර්මාණය කිරීමට උත්සාහ කර තිබූ ආකාරය මම අධ්‍යයනය කිරීමෙන් එහි ශක්‍යතාව මම හඳුනා ගත්තෙමි.

- අක්කර 19,000 ක් පමණ වන අලිමංකඩ කලපුව නැගෙනහිර දිශාවෙන් දිග වැලි වැටියකින් වැසී ඇති නිසා චුන්ඩිකුලම් අසලින් කලපුවට ඇතුළුවන මුහුදු වතුර වලක්වා ගැනීමෙන් කරදිය ඇතුළත් නොවන අලිමංකඩ වැව ගොඩ නැගීමේ මහා ව්‍යාපෘතිය ආරම්භ කරමි. ඒ සඳහා දේශීය දැනුම භාවිත කර පුළුල් අධ්‍යයනක් කිරීම අපේ වාරි විශේෂඥයින්ට පවරමි.

- වව්නියාවේ සිට වැසි ජල ධාරාවන්ගෙන් ද පෝෂිතව අලිමංකඩ වැවට කිලෝ මීටර් 90 ක් දුර ගෙවා විශාල ජල ධාරිතාවක් සහිත කනකරායන් ආරුඹය පුළුල් කර යාපනය ගඟ නිර්මාණය කරමි. එමඟින් ජලහීනතාවයෙන් පීඩා විඳින උතුරු පළාතේ ජනයාගේ වගාවට අවැසි ජලය සපයා දෙන්නෙමි.

## රටටම ජලය

- මොරගහකන්ද - කළු ගඟ ජලාශ යෝජනා ක්‍රම යටතේ උතුරුමැද ඇළ ව්‍යාපෘතිය 2015 දී ක්‍රියාත්මක කිරීමෙන් ඒ මහා ජල සම්පත උතුරු මැද පළාතට ගෙන යමි.

- පහළ මල්වතු ඔය හැරවීමේ ව්‍යාපෘතිය මගින් මන්නාරම් දිස්ත්‍රික්කයට ජලය සපයමි.

- ලංකාවේ පළමුවරට ජල පොම්ප කිරීමේ ව්‍යාපෘතියක් මගින් ත්‍රිකුණාමලයෙන් නිකරුනේ මුහුදට ඇදීයන ජල කඳ නැවත පොම්පකර කාලිංගනුවර, අඟමැඩිල්ල, මින්නේරිය යන ප්‍රදේශ ජලයෙන් පෝෂණය කරමි. එයින් උතුරුමැද ජල අවශ්‍යතා සම්පූර්ණ කරමි.

- 2014 වසරේ ජනතාවට පවරා දුන් දැදුරුඔය යෝජනා ක්‍රමය වඩාත් පුළුල් කිරීමෙන් වයඹ පළාත් ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට හැකිවනු ඇත.

- උමාඔය ව්‍යාපෘතිය හරහා මොණරාගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක දෙකේම ජනතාවට නැවතත් ජල හිඟයෙන් පීඩා විඳින්නට ඇති ඉඩකඩ වසා දමමි.

- ගිං ගඟ ව්‍යාපෘතිය හරහා දකුණු පලාතේ ජල ගැටලුව නිමා කරමි.

- භූගත ජලය පිළිබවඳ මෙතක් අපේ රටේ විශ්වසනීය ඇස්තමේන්තුවක් සිදුකර නොමැති බැවින් පළමු වතාවට භූගත ජලය පිළිබඳ විධිමත් සිතියමක් නිර්මාණය කිරීමට කටයුතු කරමි. ජල සම්පතට හෝ පරිසරයට හානි නොවන පරිදි ඉහත කිසිදු ව්‍යාපෘතියකින් ජලය නොලැබෙන ප්‍රදේශවලට භූගත ජලය සැපයීමට කටයුතු කරමි.

- සියලුම ප්‍රධාන ගංගා සහ ඒවායේ දෙපස ඉවුරු ශුද්ධ පවිත්‍ර කිරීමේ වැඩසටහනක් ආරම්භ කරමි.

- දිවයිනේ ඇති සියලු වැව් හා ඇලවේලි ඒ ඒ ගම්වල ජීවත්වන අයගේ ශ්‍රම දායකත්වයෙන් ප්‍රතිසංස්කරණය කොට ආරක්ෂා කිරීමේ වගකීම නිලධාරීන්ට නොව ඒවායේ අගය මැනවින් දන්නා ගොවි සංවිධානවලට පවරමි. එම වාරිපද්ධති නිසි පරිදි නඩත්තු කටයුතු පවත්වාගෙන යාම සඳහා “ජාතික වැව් අරමුදලක්” පිහිටුවමි.

- දිවිනැගුම මග පෙන්වීම යටතේ 30000 අධික ගම් මට්ටමේ කුඩා වැව් සහ අමුණු එකක් නැර ප්‍රතිසංස්කරණය කිරීමෙන් ගමේ කෙතේ දියවරට ඇති බාධා නිම කරමි.

- එමගින් වියළි කලාපයේ භූගත ජල මට්ටම ඉහළ නැංවීමට සහ මිනිසාට පමණක් නොව සතා සීපාවාට සහ ගහකොළවලට ද සුවයේ ජීවත්විය හැකි පරිසර පද්ධතියක් ගොඩ නගමි.

## වගාවට බීජ සහ පොහොර

- ගොවියාගේ බීජ අයිතිය සහ සුරක්ෂිතතාවය සහතික වන පරිදි බීජ නිපදවීම සහ බෙදාහැරීම පිළිබඳ රජයේ වගකීම තවදුරටත් සහතික කෙරෙන නව නීතිමය රාමුවක් සහිතව ජාතික වැඩපිළිවෙළක් ඉදිරිපත් කරමි.
- සැබෑ ශ්‍රී ලාංකීය රසයක් සහිත දෙමුහුන් බීජ රට තුළම අභිජනනය කිරීමට හැකි වන පරිදි කෘෂිබීජ පර්යේෂණ මධ්‍යස්ථාන නූතන තාක්ෂණයෙන් පරිපූර්ණ කරමි.
- කෘෂි රසායන භාවිතය අවම කරමින් ස්වභාවික ගොවිතැන් ක්‍රම මගින් දේශීය බීජ ප්‍රභේද ප්‍රචලිත කිරීම සඳහා මූලිකත්වය දෙන්නෙමි.
- කිලෝ 50 පොහොර මිටිය රුපියල් 350 බැගින් තව දුරටත් ලබා දෙන්නෙමි. ඒ සමඟම කාබනික පොහොර නිෂ්පාදන දිරිගැන්වීම සහ භාවිතය ඉහළ නැංවීමේ වැඩසටහනක් දියත් කරමි.

## ගොවියාට ප්‍රාග්ධනය

- ගොවියා වෙළඳපොළ වියගසට බැඳ තබන ණයගැති කමෙන් ගළවාගැනීම මුල්කරගෙන ගොවි ණය සහාම වෙන්වූ ගොවි ජන බැංකු ක්‍රමයට යළි පණ දෙන්නෙමි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සම්පත් යොදා ගනිමින් ඉතා අඩු පිරිවැයක් යටතේ කාර්යක්ෂමව ණය දීම සඳහා බැංකු යාන්ත්‍රණය සකස් කරමි.

## වගාව සහ වෙළඳපොළ

- අපේ කෘෂිකර්මය දැන් අධිතාක්ෂණික යාන්ත්‍රීකරණ ක්‍රියාවලියට ප්‍රවේශ වී ඇති බැවින් යන්ත්‍රාණුසාරයෙන් පැළ ඉන්දවීම, වල් පැලෑටි මර්ධනය, අස්වනු නෙළීම සහ සැකසීම යන නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කරන සහ වැඩිදියුණු කරන ව්‍යවසායකයින්ට පස් අවුරුදු බදු සහනයක් ලබා දෙන්නෙමි.

- ස්වභාවික ගොවිතැන් ක්‍රම යාන්ත්‍රීකරණ ක්‍රියාවලියන් මගින් වැඩි දියුණු කරමින් කෘෂිකර්මයේ යෙදීමට කැමති තරුණ ව්‍යවසායකයන්ට රුපියල් 2,500,000 ක ආයෝජන ණයක් අවම පොළී අනුපාතයක් යටතේ ලබා දෙන්නෙමි.

- කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ මෝල් හිමියන් නඟා සිටුවීම සඳහා නිශ්චිත ජාතික වැඩපිළිවලක් හඳුන්වා දෙන්නෙමි.

- උසස් මට්ටමේ සහල් පිටි නිපදවීම සහ පරිභෝජනය වර්ධනය කිරීමට එම කර්මාන්තය නවීකරණය කිරීම සඳහා සහන පොලියට ණය මුදලක් ලබා දෙන්නෙමි.

- කෘෂි රසායන භාවිතය අවම කිරීම සඳහා කාබනික පොහොර භාවිතයෙන් නිෂ්පාදනය කරන වී කිලෝවක් සඳහා ඉහළ මිලක් පියවරෙන් පියවර නියම කරමි.

- වස විසෙන් තොර ආහාර වේලක් ජනතාවට සපයන්නන් දිරිගැන්වීම සඳහා කෘෂිකාර්මික අමාත්‍යාංශය යටතේ වෙනම ම අංශයක් ආරම්භ කරමි.

- සහල් සහ බඩඉරිඟු නිෂ්පාදනයෙන් ස්වයංපෝෂී තත්ත්වයට පැමිණි පරිදිම 2020 වනවිට මුංඇට, කව්පි, සෝයා බෝංචි, කුරක්කන්, මිරිස් සහ උඳු වැනි අනෙකුත් ආහාර භෝගවලින් රට ස්වයංපෝෂිත කරමි.

## අවාරේ පළතුරු සහ එළවළු

- ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප 46 කට බෙදා එක් එක් කලාපයේ එක් එක් පළතුරු හා එළවළු එලදාව ලැබෙන ආකාරය හඳුනාගෙන අස්වනු ලිත සකස් කරමි.

- එම ලිත අනුව වගා කිරීමට ගොවීන්ට මඟපෙන්වීමෙන් හා තාක්ෂණික පහසුකම් සැපයීමෙන් දේශීය සහ විදේශ වෙළඳපොළ ඉලක්ක කරමින් එළවළු සහ පළතුරු වගාව අවුරුද්ද පුරාම එලදාව ලැබෙන ආකාරයට වගා කිරීමේ වැඩසටහනක් ආරම්භ කරමි.

- ඒ සඳහා අවශ්‍ය බීජ වර්ග නිපදවන හෝ පැල තවාන් පවත්වාගෙන යන ගොවීන්ට සියලු පහසුකම් සහ සහන ලබා දෙන්නෙමි.

- විවිධ විරෝධතා හේතුවෙන් මෙතෙක් කල් පමා වූ උඩරට එළවළු ගොවීන්ගේ අස්වනු සුරක්ෂිතව කල්තබා ගැනීමට අවශ්‍ය ශීතාගාර පද්ධතිය 2016 වන විට ඉදිකරමි.

- එළවළු ප්‍රවාහනය සඳහා අඩු වියදම් යාන්ත්‍රණයක් සකස් කිරීම පිණිස මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් පෙළඹවීම සඳහා දිරිගැන්වීම් සහිත වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

## පශු සම්පත් සංවර්ධන වැඩසටහන

- පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණික මඟපෙන්වීම සහ සහයෝගය යටතේ දීපව්‍යාප්ත සත්ව අභිජනන ගොවිපළ ජාලයක් පිහිටුවන්නෙමි. ඊට අමතරව සත්ව අභිජනන ගොවිපළවල් පිහිටුවීම සඳහා තරුණ ගොවීන් දිරිගැන්වීම සඳහා විශේෂ සහන පැකේජයක් හඳුන්වා දී දේශීයව කිරිගවයින් අභිජනන කටයුතු වර්ධනය කරමි.

- පශු වෛද්‍ය උපාධිය සඳහා විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීමෙන් මෙම කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය වෘත්තිකයන්ගේ සංඛ්‍යාව පුළුල් කරමි. ඒ හරහා ගවපට්ටිවල සරුබව හා කිරිදෙනුන්ට බහුලව වැළඳෙන රෝග අවම කිරීමට පියවර ගන්නෙමි.

- කිරිගොවියන් සඳහා අධ්‍යාපන පුහුණු වැඩසටහන් සහ පර්යේෂණමය ව්‍යාපෘති කටයුතු පිළිබඳ දැනුවත් කිරීම තුළින් තරුණ වෘත්තීය කිරි ආශ්‍රිත ව්‍යවසායකයන් බිහිකිරීම සඳහා ජාතික මට්ටමේ වැඩසටහනක් ආරම්භ කරමි.

- ගව ආහාර නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ලෙස යොදා ගනු ලබන පුන්නක්කු සහ තිවුඩු තිරිඟු තරඟකාරී මිළක් යටතේ දේශීයව මිළට ගැනීම දිරිමත් කිරීමට අවශ්‍ය සහන රජය මගින් ලබා දීමට කටයුතු කරමි.

- අද අප රටට අවශ්‍ය කුකුළු නිෂ්පාදන ප්‍රමාණය දේශීයව සම්පූර්ණ වී ඇති බැවින් අපේ නිෂ්පාදන සඳහා ඉන්දියාව, දකුණු අප්‍රිකාව සහ මැදපෙරදිග රටවල හොඳ වෙළඳපොළක් ඇති බැවින් අදාළ ව්‍යාපාරිකයන්ට එම වෙළඳපොළ ජයගැනීම සඳහා අවශ්‍ය වටපිටාව සකස් කර දෙන්නෙමි.

- උතුරු හා නැගෙනහිර ජනතාවගේ සම්ප්‍රදායික පශු කර්මාන්තයක් වන එළුවන් ඇති කිරීමේ කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය පැටවුන් සෑම පවුලකටම ලබා දීම සඳහා අවශ්‍ය වැඩසටහනක් දිවිනැගුම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරමි.

## වැවිලි ආර්ථිකයේ තාක්ෂණික මාවත

### තේ වගාව

අතීතයේ පටන්ම ශ්‍රී ලංකාවේ කීර්තිනාමය ලොව පුරා බබලවන්නට මුල් වූ ප්‍රධාන සාධකය අපේ තේ වගාවය. එබැවින් තේ වගාව දියුණු කොට අනාගතයේත් ජාත්‍යන්තර වෙළඳපොළේ ශ්‍රී ලංකා නාමය මුල් තැනේ රැඳවීමට අවශය පියවර ගන්නෙමි.

- තේ වගාවට විද්‍යාත්මක ඥාණය සහ අධිතාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සඳහා මහා පරිමාණ තේ නිෂ්පාදකයන් දිරිගැන්වීමට රාජ්‍ය මැදිහත්වීම ලබා දෙන්නෙමි.

- නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය කුඩා තේ වතු හිමියන් අතර ප්‍රචලිත කිරීමට රජයේ අනුග්‍රහය ලබා දෙන්නෙමි.

- වැඩි අස්වනු ලබාගත හැකි ගුණාත්මක බවින් යුතු බද්ධ පැළ ලබා ගැනීමට හැකි වන සේ තවාන් සංවර්ධනය කිරීමටත් ඒවායේ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීමටත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නෙමි.

- කුඩා තේවතු හිමියන්ගේ සංවිධානය ශක්තිමත් කිරීම සඳහා සමිති බල ප්‍රදේශයක් තුළ දළු ඒකතු කිරීමේ මධ්‍යස්ථානයක් ඇති කිරීමට අවශ්‍ය පහසුකම් සපයන්නෙමි.

### රබර් වගාව

- රබර් මිල පහත වැටීමට පිළියමක් ලෙස සෙස් බද්ද සංශෝධනය කොට සහතික මිල ක්‍රමය ස්ථාවර කර අඛණ්ඩව පවත්වාගෙන යන්නෙමි.

- මොණරාගල, අම්පාර, වව්නියාව, මුලතිව් සහ හම්බන්තොට වැනි සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා එම ප්‍රදේශවල රජයේ පැළ තවාන් ස්ථාපිත කොට නව පොහොර මිශ්‍රණයක් හඳුන්වාදීමට කටයුතු කරමි.
- රබර් වගාව කුඩා ගොවීන් අතර ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය සහන පැකේජයක් හඳුන්වා දෙන්නෙමි.
- ප්‍රාදේශීය මට්ටමින් රබර් සමූහ සැකසුම් මධ්‍යස්ථාන ආරම්භ කරන අතර තාක්ෂණික භාවිතය පුළුල් කර අගය එකතු කල රබර් භාණ්ඩ නිෂ්පාදනය ඉහළ නැංවීමට ලබා දෙමි.

## පොල් වගාව

- ගසකින් ලැබෙන ගෙඩි ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා උසස් ජානමය පැළ වර්ග පිළිබඳව පර්යේෂණය කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතන බලගන්වමි.
- පොල් වගා ක්ෂේත්‍රයන් තුළ ඵලදායීතා සංකල්ප ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත්වන ව්‍යාපාරිකයනට අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාදීමට කටයුතු සලස්වමි.
- තේ, රබර්, පොල් වගාවන්ට අදාළ සියලු අණපනත් නූතන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමට පියවර ගන්නෙමි.
- නූතන තාක්ෂණික භාවිතාවන් ඇසුරෙන් රබර් කිරි කැපීම, තේ දළු නෙළීම සහ පොල් කැඩීමේ නව ක්‍රමවේදයන් හඳුන්වා දෙන්නෙමි.
- භූගෝලීය තොරතුරු මත පදනම්ව තේ, රබර් හා පොල් ඉඩම් සිතියම් ගත කිරීමට කටයුතු කරමි.

- විදේශ රටවල දායකත්වය ඇතිව තේ, පොල් සහ රබර් ආශ්‍රිත සියලුම පර්යේෂණ ආයතන නූතන තාක්ෂණයෙන් පරිපූර්ණ කරමි.

## අපනයන භෝග වගාව

- ශ්‍රී ලංකාව ලෝක වෙළඳපොළට උසස්ම වර්ගයේ කුරුඳු සපයන්නා බවට පත්වී ඇති බැවින් කුරුඳු වගාව නැංවීමේ ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කරමි. ඒ යටතේ කුරුඳු තැලීමේ ශ්‍රම ඌණතාව මඟහැරීම සඳහා අධිතාක්ෂණික නව උපකරණ සොයා යන දේශීය විද්‍යාඥයන්ට පූර්ණ සහය ලබා දෙන්නෙමි.

- මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවල ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන සාදික්කා වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීමට හා පළදාව ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සපයන්නෙමි.

- කරාබුනැටි, කොකෝවා සහ පුවක් වගාව නැංවීම සඳහාත් ගොවියන්ට විශේෂ සහන ණය ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

- පොල් සහ රබර් ඉඩම්වල විදේශීය වෙළඳපොළ පදනම් කරගෙන කටුවැල්, වැල්අල සහ කිරිඅල වැනි භෝග වගාවන් ව්‍යාප්ත කිරීමට අයවැය සහනවලට අමතරව ආයෝජන සහන ණයක් ලබා දෙන්නෙමි.

## සාගර ආර්ථිකයක් මුතු පංතියේ ජීවිතයක්

බෙල්ලෙකුට මුතු සේ දිවයිනකට ඇති ඉහළම සම්පත මහ සාගරයයි. නමුත් ඉන්දියන් සාගරයේ මුතු ඇටය තවමත් ඉන් නිසිඵල නෙළාගෙන නොමැති

බව මගේ විශ්වාසයයි. 2020 වන විට ශ්‍රී ලංකාව සාගර ආර්ථිකයක් සහිත රටක් බවට පත් කිරීමට මම දැඩි සේ අධිෂ්ඨාන කරගෙන සිටින්නෙමි.

- 2007 දීම ශ්‍රී ලංකාවට අයත් මුහුදු බිම් ප්‍රමාණය හෙවත් මහාද්වීප තටාකය මැන අවසන් කිරීමට ලැබීම ගොඩබිම් යුද්ධය නිමා කිරීමට පෙර අප විසින් අත්කරගත් විශිෂ්ට ජයග්‍රහණයක් බව මම සිතමි.

- ශ්‍රී ලංකාවට හිමි මුහුදු සීමාව දීර්ඝ කර ගැනීම සඳහා මා විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට කරන ලද ඉල්ලීම පිළිගැනීම ගැන මම අතිශයින් ආඩම්බර වන්නෙමි. එමගින් නුදුරු අනාගතයේදී අපට හිමි මුහුදු සීමාව අපේ ලංකාව මෙන් 23 ගුණයක් පමණ වනු ඇත.

- එම මුහුදු බිම් සීමාව තුළ ඇති ඛනිජ තෙල්, ගෑස් හා ඛනිජ වැලි යන සම්පත් අත්පත් කරගැනීමෙන් අපට හිමිවන ආර්ථික වටිනාකම ඇ. ඩො. ට්‍රිලියනය ඉක්මවා යනු ඇත.

- මන්නාරම් ද්‍රෝණියේ දැනටමත් සොයා ගෙන ඇති ස්වභාවික ගෑස් වාණිජමය වශයෙන් නිස්සාරණය කර එහි ප්‍රතිලාභ මහජනයාට අත්පත් කර දෙන්නෙමි.

- මුහුද ආශ්‍රිත ඖෂධ නිෂ්පාදනය, මත්ස්‍ය සහ මූදු ශාක ආශ්‍රිත නිෂ්පාදන, අගය එකතුකරන ලද වරාය සේවාවන් සහ මුහුදු තාප බලශක්ති තාක්ෂණය නිෂ්පාදනයන්ට රාජ්‍ය මැදිහත්වීම තුළ ප්‍රමුඛ ස්ථානයක් ලබා දෙන්නෙමි.

- උපාය මාර්ගික කර්මාන්තයක් ලෙස ටින් මාළු කර්මාන්තය සංවර්ධනය කරමි. ඒ සඳහා සුදුසු මත්ස්‍ය අස්වැන්න බහුල ප්‍රදේශ 5 ක කර්මාන්ත ශාලා 5 ක් ආරම්භ කරමි.





## සැබෑ වූ සේද මාවතේ සිහිනය

- කොළඹ හා හම්බන්තොට ආශ්‍රිත අංග සම්පූර්ණ නාවික පහසුකම්වලින් සමන්විත "වරාය නගර දෙකක්" ඉදිකරමි. එමගින් රට තුළ වෙළඳ නාවික ක්ෂේත්‍රයට අදාළ මහා පරිමාණ ව්‍යවසායකයන්ගේ කාර්යාල සංකීර්ණයක් ඇති කරමි.

- සංචාරක හෝටල්, සාප්පු සංකීර්ණ, විනෝද මධ්‍යස්ථාන, ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ ශාලා පහසුකම් යනාදියෙන් සමන්විත "කලාපීය වෙළඳ කේන්ද්‍ර දෙකක්" වරාය නගරාශ්‍රිතව ගොඩ නඟමි.

- "නිදහස් වරාය සංකල්පය" යථාර්ථයක් බවට පත්කරමින් කොළඹ හා හම්බන්තොට නිදහස් වරායන් බවට පත්කළ පරිදිම ත්‍රිකුණාමල වරාය ද තවදුරටත් සංවර්ධනය කර නිදහස් වරායක් බවට පත් කර දේශීය හා විදේශීය ආයෝජකයින් දිරි ගන්වන විශේෂ වැඩපිළිවෙළක් සකස් කරමි. එමඟින් භාණ්ඩ නිෂ්පාදනය, එකලස් කිරීම සහ වටිනාකම් එකතු කිරීමේ කලාපීය කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කරමි.

- මහා පරිමාණ නාවුක සහ වරාය කර්මාන්තයන්ට අවශ්‍ය සහය සේවාවන් සැපයීම සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ දේශීය ව්‍යවසායකයන් දිරිමත් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් සකස් කරමි.

- නෞකා කාර්ය මණ්ඩලවල අපේ දේශීය ආහාර කෙරෙහි විශේෂ ප්‍රියතාවයක් දක්වන බැවින් දෙල්, කොස්, අල, බතල වැනි දේශීය ආහාර සකස් කර වටිනාකම එකතු කිරීමේ ක්‍රමයක් මගින් නෞකාවලට සැපයීමෙන් ගොවි ජනතාවට ආදායමක් ලබා ගැනීමට හැකි වන පැහැදිලි වැඩපිළිවෙළක් දැනටමත් සකස්

කර ඇත්තෙමි. ඒ යටතේ සකස්කල ආහාර සැපයුම් භාර ගන්නා මධ්‍යස්ථාන 10ක් රටපුරා ඇති කිරීමට කටයුතු කරමි.

- දැනට සැලසුම් කර ඇති ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය මගින් සංචාරක ආකර්ෂණය සහිත ප්‍රදේශයක් බවට ගාලු වරාය පැවති ප්‍රදේශය පත් කරමි. එමගින් ජීවන වෘත්තිය කරගත් දකුණු පලාතේ ජීවත්වන විශාල පිරිසකගේ අතමිට වඩා සරුවනු ඇත.

- අලුතින් ඉදිකළ ඔලුවිල් වරාය, නවීකරණය වෙමින් පවතින කන්කසන්තුරේ වරාය සහ ත්‍රිකුණාමල වරාය භාවිතා කරමින් උතුරු නැගෙනහිර පළාත්වල ජීවත් වන ජනතාවගේ නිෂ්පාදන කොළඹ ප්‍රධාන වානිජ කේන්ද්‍රයට පහසුවෙන් හා අඩුම මිලකින් ගෙනයාමට හැකි වන සේ "මුහුදු ප්‍රවාහන සේවාවක්" ආරම්භ කිරීමට කටයුතු කරමි.

- වරාය ක්ෂේත්‍රය ආශ්‍රිත මෙම සංවර්ධනය තුළින් "ඉහළ වැටුප් සහිත ඍජු රැකියා ලක්ෂ තුනක්" හා "වක්‍ර රැකියා ලක්ෂ දෙකක්" ඉදිරි වසර 6 තුළ නිසැකවම නිර්මාණය කරමි.

- මේ සියලු සංවර්ධන ව්‍යාපෘති මගින් ඉදිරි වසර 6 තුළ අපේ ආර්ථිකයට අලුතින් එකතුවන විදේශීය ආයෝජන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 10 ඉක්මවීමට කටයුතු කරනු ලැබේ.

- වරාය හා නාවික ක්ෂේත්‍ර ආශ්‍රිතව සහ සාගර ආශ්‍රිත විද්‍යාත්මක දැනුම වර්ධනය කිරීම සහ තරුණ තරුණියන් අතර බෙදාහැරීම සහ එම කේෂත්‍රය තුළ ගවේශන හා පරීක්ෂණ සිදු කිරීමට හැකි වන පරිදි සාගර විශ්වවිද්‍යාලය ශක්තිමත් කරමි.

- කොළඹ වරාය අධික කාර්ය බහුල වරායක් වීමත් සමග ඇතිවී තිබෙන සේවා බහාලුම් පිටත ගෙනයාමේ දී සිදුවන ප්‍රමාදය වැළැක්වීම සඳහා අවශ්‍ය කාර්යක්ෂම ක්‍රමවේදයක් වහාම ක්‍රියාවට

නංවමි. එමඟින් රියදුරන්ගේ හා අනෙකුත් ඊට සම්බන්ධ සේවකයන්ගේ කාලය අපතේ යාම සහ මානසික අතෘප්තිය මගහැරවීමට කටයුතු කරමි.

- කොළඹ සහ හම්බන්තොට ප්‍රධාන ජාත්‍යන්තර වරායන් දෙකෙහිම භෞතික සම්පත් හා පහසුකම් ජාත්‍යන්තර වරාය අවශ්‍යතාවයන්ට අනුකූල ප්‍රමිතියෙන් යුක්තව අඛණ්ඩව නවීකරණය කිරීමෙන් ශ්‍රී ලංකාව ලෝකයේ නාවික ක්ෂේත්‍රයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට කටයුතු කරමි.

## ධීවර ප්‍රජාවට අලුත් ජීවිතයක්

මම ද වරක් මේ රටේ ධීවර ඇමතිවරයාව සිටි නිසා මුහුද සිය ජීවිතය කරගත් අඩු පහසුකම් යටතේ ජීවත්වන ධීවර ජනතාවට සමාජ වටිනාකමක් සහිත අලුත් ජීවිතයක් ලබාදීම සඳහා ඔවුන් ආර්ථික වශයෙන් ඔසවා තැබීම පිණිස අලුතින් ගොඩ නැගෙන ශ්‍රී ලංකාවේ සියලු දොරටු විවෘත කරමි.

- ධීවර භාර්යාවෝ තම සැමියා දියඹට ගිය මොහොතේ පටන් වැටෙන වැස්සට සහ හමන සුළඟට ද බියෙන් පසුවෙති. ඒ එදිනෙදා ධීවර කර්මාන්තයේ යෙදෙන අපේ ධීවරයන්ගේ ඔරු සහ කුඩා බෝට්ටුවල ඇති අනාරක්ෂිත බව නිසාය. එබැවින් එවැනි ධීවරයින්ගේ පහසුව සඳහා සන්නිවේදන සහ ගබඩා පහසුකම් සහිත කෙටි දින යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සඳහා ඉදිරිපත් වන සමාගම් දිරිගන්වමි. මූලික ගෙවීමකින් තොරව සහන ගෙවීමේ පදනම මත ධීවරයන්ට එම කෙටි දින යාත්‍රා ලබා දීමට කටයුතු කරමි.
- තරුණ පරම්පරාවට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ධීවර කර්මාන්තයේ යෙදීම සඳහා අවශ්‍ය නූතන ක්‍රමවේදයන් පිළිබඳ දැනුම සහ පුහුණුව අලුතින් සංවර්ධනය වන සාගර සම්පත් සහ නාවුක විශ්වවිද්‍යාලයෙන් අදාළ පුහුණුව ලබාදීමට කටයුතු කරමි.

- කරවල, උම්බලකඩ සහ ජාඩි නිෂ්පාදන කර්මාන්තය සඳහා කාන්තා ව්‍යවසායක පංතියක් බිහිකිරීම පිණිස දිවිනැගුම බැංකුව යටතේ වෙනම සහන ණය ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි. එම නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට යොමු කළ හැකි ආකාරයට අගය එකතු කිරීමේ ව්‍යාපාරයන්ට ප්‍රවේශවීම සඳහා ධීවර තරුණ ප්‍රජාවට අවස්ථාව සලසා දෙන්නෙමි.

- මුහුදු මාර්ග සහ මාළු අයින් පිළිබඳ අධ්‍යයනයක් කර මත්ස්‍යය සම්පත් සහ මුහුදු මාර්ග පිළිබඳ සිතියමක් නිර්මාණය කරමි.

- අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ මත්ස්‍ය අස්වනු අළෙවිය සම්බන්ධයෙන් මතුවන අභියෝගවලට මුහුණදීම සඳහා නව වෙළෙඳපොළ සොයා යන ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අභ්‍යන්තර ජලාශ යොදාගෙන ජාතික මට්ටමින් පුළුල් ජලජීවී සංවර්ධන වැඩසටහනක් රට පුරා ක්‍රියාත්මක කරමි.

# 6 ජාතික කර්මාන්ත න්‍යාය පත්‍රය

කෘෂිකර්මයෙන් මෙන්ම කර්මාන්ත අංශයෙන් ද රට ඉදිරියට ගැනීම ඉදිරි සය වසර තුළ මගේ ප්‍රමුඛ ඉලක්කයයි. ඒ සඳහා රටේ ආර්ථිකයට උපාය මාර්ගික වශයෙන් වැදගත් කර්මාන්ත හඳුනා ගැනීමටත්, එම කර්මාන්ත කරුවන්ට ඇති විවිධාකාර බාධා ඉවත් කර ඔවුන් දිරි ගැන්වීමටත්, රැකියා ලක්ෂ තුනක් සහ ජීවනෝපාය අවස්ථා පන්ලක්ෂයක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය ජාතික කර්මාන්ත න්‍යාය පත්‍රයක් සකස් කරමි. ඊට පහසුකම් සැලසීම සඳහා නව නීතිමය රාමුවක් ද හඳුන්වා දෙමි. ඒ සඳහා පූර්ණ බලතල සහිත කර්මාන්ත සංවර්ධන පනතක් ගෙන එන්නෙමි.

- බදුකරණය තවදුරටත් සරල සහ පහසු කිරීම, රජයෙන් ලබාගත යුතු සියලු අනුමැතීන් එක්වහලක් යටදී ලබාගැනීම සහ ඒ සඳහා ගතකරන කාල රාමු නිශ්චය කිරීම, අමුද්‍රව්‍ය සපයා ගැනීම පහසු කිරීම, මානව සම්පත් කළමනාකරණය, පරිසරයට සංරක්ෂණය, නව දැනුම සහ නවීන තාක්ෂණ භාවිතය සහ අපනයන වෙළඳපළ වාසි ආදී සියලු ක්ෂේත්‍රයන් මෙම පනතින් ආවරණය කරමි.

- රාජ්‍ය ආයතනවල විගණනයේ පළමු මූලධර්මය විය යුත්තේ තම ආයතනවල සේවා හෝ ප්‍රාග්ධන සැපයුම කොතරම් කාර්යක්ෂමව ජාතික අරමුණ සඳහා සඵලදායී ලෙස යොදා ගෙන ඇත් ද යන්නයි. ඒ නිසා මෙම අරමුණු මත පදනම්ව සෑම ආයතනයකම සංයුක්ත සැලසුම් 2015 සිට අලුතින් සකස් කිරීමට යෝජනා කරමි.

- මහා පරිමාණ කර්මාන්ත සහ උපාය මාර්ගික කර්මාන්තවලට දේශීය හෝ විදේශීය බැංකුවලින් ප්‍රාග්ධන ආයෝජන ලබා ගැනීමට හැකි වන පරිදි සුරැකුම් වගකීම්පත් හා බැඳුම්කර නිකුත් කිරීම සඳහා අපනයන බැංකු ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරමි.

- කර්මාන්තකරණය සඳහා අවශ්‍ය ව්‍යුහයන් සංවර්ධන අපේක්ෂාවට අනුකූල කරවීම සඳහා පවතින නීති අණපනත්වල වෙනස්කම් ඇති කරමි.

- කර්මාන්තකරණයට යොමු වී සිටින බොහෝ දෙනාගේ මැසිවිල්ල නම් කවර පහසුකම් රජයෙන් ලබා දුන්න ද එම සේවා ලබාගැනීමට යාමේදී මාස ගණනක් ප්‍රමාද වන බවයි. එබැවින් එක් වහලක් යටතේ සියලු අනුමැතීන් ලබා ගැනීමට මෙන්ම අදාළ ක්‍රමවේද ලිහිල් කිරීමටත් අවශ්‍ය දැඩි පියවර නොපමාව ගත්තෙමි.

## මහා පරිමාණ කර්මාන්තකරණයට අනුබල

### සංචාරක කර්මාන්තය

ලෝකයේ බොහෝ රටවල් තවමත් දරුණු ත්‍රස්තවාදයෙන් ගිනි ගන්නා විට සහ බොහෝ රටවල් ආර්ථික වශයෙන් කඩා වැටී සිටින විට ස්වභාව සෞන්දර්යයේ අසිරිය නිසා ද අලුත් ශ්‍රී ලංකාව තුළ ගොඩනැගෙන ප්‍රභාමත් සංවර්ධනය නිසා ද සංචාරක කර්මාන්තය ජාතික ආර්ථිකයේ ඉහළම ස්ථානයක් අත්පත් කර ගනු ඇත.

- පුළුල්වන සංචාරක කර්මාන්තයට ප්‍රමාණවත් හෝටල් කාමර 80,000 ක් ගොඩනැගීමට අවශ්‍ය සියලුම සහය ලබාදීමෙන් ලංකාවේ හෝටල් කර්මාන්තය අන්තර්ජාතික මට්ටමට ඔසවා තබමි. ඒ ඇසුරෙන් සංචාරකයන් සඳහා අවශ්‍ය අනෙකුත් සේවා සැපයීම තුළින් ජීවනෝපාය අවස්ථා 100,000 පමණ ගොඩ නැගෙනු ඇත.

- කල්පිටිය, කුච්චවේලි, යාල සහ පාසිකුඩා යන ප්‍රදේශ මුහුදු ක්‍රීඩා පදනම් කරගත් වෙරළ සංචාරක කර්මාන්තයට ගැළපෙන පහසුකම්වලින් යුක්තව දියුණු කරමි.

- කෘෂි සංචාරක කර්මාන්තය, පරිසර ලෝලී සංචාරක කර්මාන්තය, වනාන්තර ලැදි සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා තරුණ ව්‍යවසායකයින් සහ වෘත්තිකයින් දිරිමත් කරමි.

- තරුණ සංචාරකයින්ගේ සිත් බැඳ ගන්නා ත්‍රාසජනක ක්‍රීඩා අවස්ථා ඉහළ නැංවීමට පියවර ගන්නෙමි.

- අපේ රටට පැමිණෙන සංචාරකයන්ට අපට ආවේණික ආගන්තුක සත්කාරයෙන් සැලකීම තුළින් ශ්‍රී ලංකාවේ කීර්තිනාමය ලොව පුරා ප්‍රචලිත කරන වැඩසටහනක් ක්‍රියාවට නංවමි.

- කාබනික ආහාර, දේශීය ආහාර හා පාන වර්ග ආදියට සංචාරකයන්ට සපයන කුඩා ව්‍යාපාරිකයන් රුපියල් 500,000 ක සහන ණය මුදලක් ලබා දීමෙන් දිරිමත් කරමි.

- අවිධිමත් ලෙස සංචාරකයන්ට සේවා සපයන්නන් හට විධිමත් පුහුණුවක් ලබා දෙන්නෙමි.

- දේශීය වෛද්‍ය සේවා සැපයීම මුල්කර ගත් සංචාරක ව්‍යාපාරයක් සුවිශේෂී ලෙස රටපුරා ප්‍රචලිත කිරීම සඳහා දේශීය වෛද්‍යවරුන් දිරිමත් කරන්නෙමි. ඒ සඳහා සහන සැපයීමේ සහ නියාමනය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කරමි.

## ඉදිකිරීම් කර්මාන්ත පිළිවෙත

- දේශීය ඉදිකිරීම් කර්මාන්තය දැනට ලබා ඇති ජයග්‍රහණයන් ඉදිරියට පවත්වාගෙන යාම හා ප්‍රවර්ධනය කිරීම සඳහා නව ඉදිකිරීම් සංවර්ධන පනත යටතේ සියලු සේවාදායකයින්, වෘත්තිකයින් ඉදිකිරීම්කරුවන් හා ඉදිකිරීම් ශිල්පීන්ගේ පූර්ණ දායකත්වය ලබාගැනීමේ ජාතික ඉදිකිරීම් ක්‍රියාපිළිවෙතක් නිර්මාණය කරමි.

- කලාපයේ අන් රටවල් අභිබවා ඉදිරියට යාමට අවශ්‍ය අභියෝග ජයගැනීම සඳහා දේශීය ඉදිකිරීම් කර්මාන්ත ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කරමි.

- මෙම කර්මාන්තයේ සේවයේ යෙදෙන ලක්ෂ 6 කට පමණ ආසන්න සියලුම ශිල්පීය ශ්‍රේණීන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමටත් ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමටත් ඔවුනට නිසි සමාජ පිළිගැනීම අත්පත් කරදීමටත් මහාභිමානී ජාතික විශ්‍රාම සුබසාධන සහ රක්ෂණ වැඩසටහන හඳුන්වා දීමටත් අපේක්ෂා කරමි.

- ඉදිකිරීම් ශිල්පීන්ට විදේශ රැකියා අවස්ථා ලබා දීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමි.

- ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යය උසස් ප්‍රමිතියකින් යුතුව නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් හඳුන්වා දෙන්නෙමි.

- ජාතික ඉදිකිරීම් තොරතුරු ජාලයක් නිර්මාණය කරමි.

## ඇඟළුම් කර්මාන්තයේ හැරවුමක්

- තත්වයෙන් උසස් ඇඟළුම් ඉහළ පාරිභෝගික වෙළඳපොළ සඳහා නිපදවීමටත් අලුත් ජාත්‍යන්තර වෙළඳපොළ සොයා යාමටත් ඇගළුම් කර්මාන්තශාලා හිමියන්ට රජයේ පූර්ණ අනුග්‍රහය ලබා දෙන්නෙමි.

- සෞඛ්‍යය ක්ෂේත්‍රයේ භාවිතයට ගනු ලබන සියලු රෙදිපිළි (Medical Textiles) නිෂ්පාදන සහ විවිධ කාර්යයන් සඳහා යොදා ගන්නා සුවිශේෂ රෙදිපිළි (GeoTextiles) නිෂ්පාදන කර්මාන්තය ශ්‍රී ලංකාවේ ඇගළුම් කර්මාන්තයට හඳුන්වා

දෙන්නෙමි. එම කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සියලු පහසුකම් රජය මගින් ලබාදීම සහතික කරමි.

- මඩකලපු දිස්ත්‍රික්කයේ දේශීය රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය නූතන තාක්ෂණයෙන් යුක්තව දියුණු කිරීමට තරුණ ව්‍යවසායකයන්ට අවශ්‍ය ප්‍රාග්ධනය හා දැනුම ලබා දීමට කටයුතු කරමි.

## උපාය මාර්ගික කර්මාන්ත පද්ධතියක්

- වාර්ෂිකව විදේශ රටවලට ඇදී යන නමුත්, අපිට නිෂ්පාදනය කරගත හැකි, දේශීය නිෂ්පාදන පදනම් කරගත් කර්මාන්ත පද්ධතියක් ස්ථාපනය කරමි. එවැනි කර්මාන්ත රාජ්‍ය අනුග්‍රහයෙන් හා රටේ ඉහළ පෞද්ගලික කර්මාන්තකරුවන්ගේ දායකත්වයෙන් ගොඩ නගමි.

- කොටස් වෙළඳපොළේ ඉහළින්ම සිටින සමාගම් 200 ද ඇතුළුව අප රටේ ඉහළම ව්‍යාපාරිකයන් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම එක් බැගින් අගය එක්කිරීමේ කර්මාන්ත සහ දේශීය අමුද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ඇතුළු කර්මාන්ත ශාලා 325 ක් ආරම්භ කිරීමට ආරාධනා කරමි. ඒ සඳහා ඔවුනට අවශ්‍ය පහසුකම් හා දිරි දීමනා සියල්ල සපයමි.

- මෙම වැඩසටහන යටතේ තමන්ගේම ජීවන ප්‍රදේශ තුළ සිටම කළ හැකි රැකියා 100,000 ක් නිර්මාණය කරමි.

- ජාතික කර්මාන්ත පද්ධතිය තුළ නව දැනුම සහ දේශීය නව සොයාගැනීම් වඩ වඩාත් දිරිගැන්වීම සඳහා තාක්ෂණික පර්යේෂණ විද්‍යාගාර පද්ධතියක් රට පුරා විශ්වවිද්‍යාල ආශ්‍රිතව පිහිටුවමි.

- විවිධ විද්‍යාඥයින් පර්යේෂකයන් එවැනි නව සොයා ගැනීම් සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා පෙළඹවීම සඳහා ජාතික පර්යේෂණ සහ සංවර්ධන අරමුදලක් පිහිටුවමි. එම අරමුදල මගින් කර්මාන්තකරුවන්ට සහ පර්යේෂකයන්ට අවශ්‍ය මූල්‍ය සහය ලබා දීමට කටයුතු කරමි.

## සීනි කර්මාන්තය

නව උපායමාර්ගික පනත යටතේ රාජ්‍ය සහ පෞද්ගලික හවුල් ආයෝජන කර්මාන්තයක් ලෙස සීනි කර්මාන්තය සංවර්ධනය කරමි. 2020 වන විට ලංකාවේ සීනි අවශ්‍යතාව දේශීයව සම්පූර්ණ කිරීමට අවශ්‍ය සැලැස්ම දැනටමත් සකස් කර ඇත්තෙමි.

- පවතින සීනි සමාගම් සතු වගා කළ හැකි සම්පූර්ණ භූමියෙන්ම උක් වගාව සංවර්ධනය කිරීමෙන් දේශීය සීනි නිෂ්පාදනයන් 40% දක්වා ඉහළ නංවමි.

- පැල්වත්ත, සෙවණගල හා හිඟුරාණ කර්මාන්තශාලා සම්පූර්ණයෙන්ම නවීකරණය කරමි. එම ප්‍රදේශවල දැනට හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්න මෙට්‍රික් ටොන් 100 දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය අධි පළදා බීජ වර්ග සහ නූතන වගා ක්‍රම ප්‍රචලිත කරමි.

- අනුරාධපුරය, වව්නියාව, මඩකලපුව, මුලතිව්, මන්නාරම සහ බිබිල යන ප්‍රදේශවල හෙක්ටයාර් 120,000 අලුතින් උක් වගාවට එකතු කරමි. එම සෑම ප්‍රදේශයකම අති නවීන කර්මාන්ත ශාලා පද්ධතියක් ආරම්භ කරමි.

- මෙම අලුත් කර්මාන්තශාලා ඇසුරෙන් සෘජු රැකියා 25,000 ක් ඇති කරමි ඊට අමතරව දැනට පවතින කෘෂිකර්මයෙන් නිසි ඵල නොලබන එම ප්‍රදේශවල ගොවීන් ඇසුරෙන් අලුත් උක් වගා

පන්තියක් ගොඩ නගමි. අවම වශයෙන් ප්‍රදේශයේ ගොවි පවුල් 100,000 කට අතිරේක ජීවනෝපාය මාර්ග උදා වනු ඇත.

- සීනි නිෂ්පාදනයේ අතිරේකයක් වන එතනෝල් මත්පැන් සඳහා නොව ඉන්ධන මුසුවක් ලෙස භාවිත කිරීමට අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කරමි.
- කාඩ්බෝඩ්, කඩදාසි සහ ප්ලාස්ටික් ඇසුරෙන් අතුරු නිෂ්පාදන ගණනාවක් රට තුළ ගොඩ නගමි.
- සීනි කර්මාන්ත ශාලා ඇසුරෙන් පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය ජාතික විදුලිබල පද්ධතියට එකතු කරමි.

## කිරි කර්මාන්තය - ධවල විප්ලවය

දීර්ඝ කාලයක් තිස්සේ දේශීය කිරි කර්මාන්තයට කුඩම්මාගේ සැලකිලි ලැබීමෙන් බිඳවැටී තිබුණු දේශීය කිරි නිෂ්පාදන කර්මාන්තය තුළ විප්ලවීය වෙනසක් කරමින් දේශීය කිරි නිෂ්පාදනය 13% සිට 40% දක්වා වර්ධනය කිරීමට හැකිවීම අප ලැබූ විශිෂ්ට ජයග්‍රණයකි. එමගින් ලත් ආත්ම ධෛර්යයෙන් යුක්තව 2020 දී ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත කරමි.

- දැනට ලංකාවේ කිරි එළදෙනුන් ලක්ෂ 12 ක් සිටින බව වාර්තා වී ඇතත් ඊට සාපේක්ෂ කිරි නිෂ්පාදනයක් සිදු වන බව බව මම නොදකිමි. ඊට හේතුව දියර කිරි එකතු කිරීමේ හෝ අළෙවි කිරීමේ නිසි ක්‍රමවේදයක් රට පුරා ව්‍යාප්ත නොවන බැවින් රට පුරා පැතුරුණු කිරි එකතු කිරීමේ ජාලයක් සහ ගබඩාකරණ මධ්‍යස්ථාන සමූහයක් ස්ථාපනය කරමි.
- සෑම පළාතකටම එක බැගින් ප්‍රධාන කිරි ආශ්‍රිත කර්මාන්ත ශාලා 9 ක් ආරම්භ කරමි.

- එම කාර්මාන්ත ශාලාවල කිරි නිෂ්පාදන අදාළ පළාතේ නමින් අලෙවි කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන්නෙමි. එමඟින් නිෂ්පාදන අලෙවි කිරීම ප්‍රවර්ධනය කරමි.

- ප්‍රධාන පිටි කිරි නිෂ්පාදන කර්මාන්ත ශාලා 4 ක් පිහිටුවමි. එමඟින් ආනයනික පිටි කිරි සමඟ තරඟ කිරීමට වස විසෙන් තොර දේශීය පිටි කිරි කර්මාන්තයට හැකි වනු ඇත.

## මධ්‍ය පරිමාණ පාෂාණ කර්මාන්ත පද්ධතියක්

බොහෝ දෙනා කල්පනා කරන්නේ ලෝකයේ ඇති වටිනාම භූගත සම්පත් වන්නේ රත්තරන්, දියමන්ති සහ ඛනිජ තෙල් පමණක් බවයි. අපේ රටේ බොහෝ දෙනා ද තවමත් පසුවන්නේ එම පරිකල්පනයේම බව මගේ හැඟීමයි. එමනිසා අපට උරුම වී ඇති මැණික් ඉල්මනයිට් මිනිරන්, සිලිකා, හිරිගල් වැනි භූගත සම්පත්වලින් අප තවමත් නිසිඵල නෙළාගෙන නැති බව මම දනිමි. එබැවින් පරිසර පද්ධතිය ද ආරක්ෂා වන පරිදි දැඩි පාලනයක් යටතේ ජාතික පාෂාණ කර්මාන්ත සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරමි.

### මැණික් කර්මාන්තය

- නිල් මැණික් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළේ අප දිනා ඇති කීර්තිනාමය පදනම් කරගෙන ශ්‍රී ලංකාව ලෝකයේ අංක එකේ නිල්මැණික් වෙළඳ මධ්‍යස්ථානය බවට පත් කරමි.

- ලොව ප්‍රමුඛ පෙළේ මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන් ආකර්ෂණය කරගැනීමෙන් ශ්‍රී ලංකාව මැණික් කර්මාන්තයේ ප්‍රමුඛ රටක් බවට පත්කරමි.

- නවීන විද්‍යුත් තාප පිරියම් කිරීමේ තාක්ෂණය මෙරටට හඳුන්වාදී ගෙවුඩ සහ කුරුවින්ද මැණික් සඳහා අගය එක් කිරීමෙන් මෙම

ක්ෂේත්‍රයේ නියැළෙන්නන්ට අලුත් ව්‍යාපාරික දොරටුවක් විවෘත කරමි.

- තවමත් අපේ රටේ භාවිත නොවන *"අධිතාක්ෂණික සූක්ෂම කැපුම් තාක්ෂණය"* (Precision Cutting) මෙරටට හඳුන්වා දී ගැරුම් වට්ටියේ වැඩිපුරම ඇති වටිනාකමෙන් අඩු කුඩා මැණික්වලට අගය එක් කිරීමෙන් ඉහළ ආදායමක් උපයා ගැනීමට අවස්ථාව උදාකරමි.

- මැණික් කර්මාන්තයට සම්බන්ධ කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා රළු මැණික් නිෂ්පාදන වර්ධනය කර ඒ සඳහා විදේශ වෙළඳපොළ විවෘත කර දෙන්නෙමි.

## දියුණුවේ නොදුටු සම්පත

- අප සතු මිනිරන්, පොස්පේට්, යකඩ, යපස්, ඛනිජ තෙල්, ස්වභාවික ගෑස් සහ ඛනිජ වැලි යන සම්පත්වල නිසිඵල නෙළාගැනීම සඳහාත් අගය එකතු කළ නිමි කර්මාන්ත බිහිකිරීම සඳහාත් ජාතික තිරසර ඛනිජ සම්පත් කර්මාන්ත ප්‍රතිපත්තියක් සකස් කරමි.

- එප්පාවල පොස්පේට් නිධිය වැනි සම්පත්වලින් දේශීය ගොවිතැනේ හා වැවිලි කර්මාන්තයේ අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය රොක් පොස්පේට්, සිංගල් සුපර් පොස්පේට් සහ ට්‍රිපල් සුපර් පොස්පේට්, නිපදවීම නූතන තාක්ෂණයෙන් මුසු කර්මාන්තයක් ලෙස සංවර්ධනය කරමි.

- මෙම කර්මාන්ත සඳහා ජීව තාක්ෂණය, නැනෝ තාක්ෂණය, විද්‍යුත් තාක්ෂණය, රොබෝ තාක්ෂණය, තොරතුරු හා අභ්‍යවකාශ තාක්ෂණය ආදිය භාවිතයෙන් නිෂ්පාදන ධාරිතාව නැංවීම සඳහා පර්යේෂණ කටයුතු දිරිමත් කරමි.

- ශ්‍රී ලංකාවේ වෙරළ තීරවල විසිරුණු ඛනිජ සම්පත් එකතු කරන අය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ලෙස දියුණු කිරීමට පියවර ගන්නෙමි.

- අවදානම හිසින් දරාගෙන පතල්වල වැඩෙහි යෙදෙන ශ්‍රමිකයන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කරන අතර ඔවුනට ජීවිත රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

## කුඩා ව්‍යාපාර සංවර්ධන වැඩසටහන

- ගෘහ, කුඩා සහ මධ්‍ය පරිමාණ නිෂ්පාදන විදේශ වෙළඳපොළට යොමු කිරීම පදනම් කරගෙන "ජයබිම ලංකා" වැඩසටහන ක්‍රියාත්මක කරමි.

- කාර්මික සංවර්ධන මණ්ඩලය වඩාත් ශක්තිමත් කර මෙම ව්‍යාපාරිකයන් සඳහා අවශ්‍ය පුහුණුව, තාක්ෂණය හා වෙළඳපොළ තොරතුරු පහසුවෙන් ලබා දෙන වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කර කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට නිවැරදිව යොමුකරන වැඩසටහනේ නියමුවා බවට පත් කරමි.

- සියලුම රාජ්‍ය බැංකු හරහා සහන පොලියක් සහ පළමු වසර දෙක තුළ වාරික අය නොකරන විශේෂ සංවර්ධන ණය යෝජනා ක්‍රමයක් මෙම ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාත්මක කරමි.

- කුඩා ව්‍යාපාරිකයන්ගේ විවිධ අවශ්‍යතා ඉටුකිරීම සඳහා ස්ථාපනය කර ඇති සියලුම රාජ්‍ය ආයතන සහ අදාළ ව්‍යවසායකයන්ගේ ද නියෝජනය සහිත ජාතික සභාවක් පිහිටුවන්නෙමි.

# සම්ප්‍රදායික උරුමයෙන් නූතන වෙළඳපොළ ජයගැනුම

විවෘත ආර්ථිකය තුළ වෙළඳපොළ වසාගෙන තොරොම්බල් වෙළඳාම පැතිරෙන විට වඩාත් අසරණ වූ සම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ගෝලීයකරණයේ ජාත්‍යන්තර නිර්මාතෘවරුන්ගේ නිවෙස්වල අලංකාරය පිණිස තබා ඇති හෙට දවසක් දැකීම මට ඉමහත් සතුටකි. එම නිසා සම්ප්‍රදායික නිෂ්පාදන කර්මාන්තය ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කරමින් සංවර්ධනය කරන වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- ජාතික මෝස්තර මධ්‍යස්ථානය ව්‍යුහාත්මකව හා ගුණාත්මකව වෙනස්කර පැරණි සම්ප්‍රදායානුකූල භාණ්ඩ නිෂ්පාදනය කරන ගම්මාන සමඟ සෘජුව සම්බන්ධ කරමි.
- හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ රජයේ මැදිහත්වීම දරන ප්‍රධාන ආයතනයක් වන ලක්සල හරහා පෙර ඇණවුම් (Forward Contract) ලබා දීම ඔස්සේ දේශීය වෙළඳපොළ ස්ථාවර කරමි.
- ඒ සඳහා චක්‍රීය අරමුදලක් ආරම්භ කොට මෙම අංශය කෙරෙහි උනන්දුවක් දක්වන තරුණ තරුණියන් ජාත්‍යන්තර වෙළඳපොළට අවශ්‍ය උසස් මට්ටමේ භාණ්ඩ නිපදවීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීමට පියවර ගන්නෙමි.
- ග්‍රාමීය කෘෂි නිෂ්පාදනයේ යෙදෙන කුඩා පරිමාණ ගොවියාගේ, ව්‍යවසායකයාගේ නිෂ්පාදන රැස්කිරීම සහ බෙදා හැරීම සඳහා වයස 35 ට අඩු තරුණ ව්‍යවසායකයන් 25,000 ක් සඳහා කුඩා ලොරි රථයක් හෝ මිලට ගැනීම සඳහා සහන පොලියක් යටතේ ණය මුදලක් ලබා දෙන්නෙමි.
- මෙම වෘත්තීන්හී නියැළුණු වයෝවෘද්ධ අයට පිළිසරණ වියයුතු අවස්ථා හඳුනා ගෙන ජීවන දීමනාවක් ගෙවීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

# 7 සංවර්ධනයේ මිහිරි ඵල ගමට ගෙන යන දිවි නැගුම

## දිවි නැගුමෙන් ලස්සන නගරයක්, සුපිරි ගමක්

පැරණි සුන්දරත්වය සපිරි ගම, පොදු පහසුකම්වලින් පිරුණු වත්කම් ඇති මිනිසුන්ගේ ජීවන වාසස්ථානය බවට පත් කිරීම සඳහා ගමනැගුම වැඩසටහනේ සිට දිවිනැගුම දක්වාම කටයුතු කරන්නේ මම ද ගැමියෙක් බැවිනි. නගරය අලංකාර තැනක් බවට පත් වන්නේ ඉන් පසුවය. අද මගේ ගමේ අය ද ඉල්ලා සිටින්නේ නගරයට සමාන පහසුකම්වලින් හා පිරිසිදුකමින් සපිරි ගමකි.

- ගම නැගුම වැඩසටහනේ ඉලක්කය වූයේ සංවර්ධිත සහ අලංකාරවත් ප්‍රවේශ මාර්ග, පිරිසිදු වාරි ජලසැපයුම් මාර්ග, පහසුකම් සපිරි සෞඛ්‍යය මධ්‍යස්ථානය, නවීකරණය වූ සමූපාකාරය, සිඟිති උයන මැදිකරගත් පෙර පාසල, අලංකාරවත් පාසල ඇතුළු පොදු පහසුකම් සියල්ලම සෑම ගමකටම ලබා දීමයි.

- දිවිනැගුම ක්‍රියාත්මක වන සපිරි ගම්මාන 25,000 වැඩසටහනේ අරමුණ වන්නේ ගමනැගුමෙන් දියුණු කළ පොදු පහසුකම් සපිරි ගමේ ජීවත්වන සෑම පවුලක්ම පොහොසත් කිරීමයි.

- සෑම පවුලකටම ස්ථිර වහලක් සහිත නිවසක අයිතිය සහතික කරන අතර ඒ සෑම නිවසකටම අවම වශයෙන් විදුලිය, පිරිසිදු පානීය ජලය, විධිමත් සනීපාරක්‍ෂක පහසුකම් ලබා දෙන්නෙමි.

- දියුණු කළ සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සෞඛ්‍යය රැකවරණය එම ගමේ වෙසෙන සෑම ගැබිනි මවකටම, දරුවෙකුටම ලබා දෙන අතර පොදු ප්‍රවාහන සේවයේ, නැණසල ආදී සේවා මධ්‍යස්ථානවල සේවය සෑම පවුලකම අදාළ සාමාජිකයින්ට අඩු නැතිව ලබාදීම අනිවාර්ය කරමි.

# 6 ජාතික කර්මාන්ත න්‍යාය පත්‍රය

කෘෂිකර්මයෙන් මෙන්ම කර්මාන්ත අංශයෙන් ද රට ඉදිරියට ගැනීම ඉදිරි සය වසර තුළ මගේ ප්‍රමුඛ ඉලක්කයයි. ඒ සඳහා රටේ ආර්ථිකයට උපාය මාර්ගික වශයෙන් වැදගත් කර්මාන්ත හඳුනා ගැනීමටත්, එම කර්මාන්ත කරුවන්ට ඇති විවිධාකාර බාධා ඉවත් කර ඔවුන් දිරි ගැන්වීමටත්, රැකියා ලක්ෂ තුනක් සහ ජීවනෝපාය අවස්ථා පන්ලක්ෂයක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය ජාතික කර්මාන්ත න්‍යාය පත්‍රයක් සකස් කරමි. ඊට පහසුකම් සැලසීම සඳහා නව නීතිමය රාමුවක් ද හඳුන්වා දෙමි. ඒ සඳහා පූර්ණ බලතල සහිත කර්මාන්ත සංවර්ධන පනතක් ගෙන එන්නෙමි.

- බදුකරණය තවදුරටත් සරල සහ පහසු කිරීම, රජයෙන් ලබාගත යුතු සියලු අනුමැතීන් එක්වහලක් යටදී ලබාගැනීම සහ ඒ සඳහා ගතකරන කාල රාමු නිශ්චය කිරීම, අමුද්‍රව්‍ය සපයා ගැනීම පහසු කිරීම, මානව සම්පත් කළමනාකරණය, පරිසරයට සංරක්ෂණය, නව දැනුම සහ නවීන තාක්ෂණ භාවිතය සහ අපනයන වෙළඳපළ වාසි ආදී සියලු ක්ෂේත්‍රයන් මෙම පනතින් ආවරණය කරමි.

- රාජ්‍ය ආයතනවල විගණනයේ පළමු මූලධර්මය විය යුත්තේ තම ආයතනවල සේවා හෝ ප්‍රාග්ධන සැපයුම කොතරම් කාර්යක්ෂමව ජාතික අරමුණ සඳහා සඵලදායී ලෙස යොදා ගෙන ඇත් ද යන්නයි. ඒ නිසා මෙම අරමුණු මත පදනම්ව සෑම ආයතනයකම සංයුක්ත සැලසුම් 2015 සිට අලුතින් සකස් කිරීමට යෝජනා කරමි.

- මහා පරිමාණ කර්මාන්ත සහ උපාය මාර්ගික කර්මාන්තවලට දේශීය හෝ විදේශීය බැංකුවලින් ප්‍රාග්ධන ආයෝජන ලබා ගැනීමට හැකි වන පරිදි සුරැකුම් වගකීම්පත් හා බැඳුම්කර නිකුත් කිරීම සඳහා අපනයන බැංකු ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරමි.

- කර්මාන්තකරණය සඳහා අවශ්‍ය ව්‍යුහයන් සංවර්ධන අපේක්ෂාවට අනුකූල කරවීම සඳහා පවතින නීති අණපනත්වල වෙනස්කම් ඇති කරමි.

- කර්මාන්තකරණයට යොමු වී සිටින බොහෝ දෙනාගේ මැසිවිල්ල නම් කවර පහසුකම් රජයෙන් ලබා දුන්න ද එම සේවා ලබාගැනීමට යාමේදී මාස ගණනක් ප්‍රමාද වන බවයි. එබැවින් එක් වහලක් යටතේ සියලු අනුමැතීන් ලබා ගැනීමට මෙන්ම අදාළ ක්‍රමවේද ලිහිල් කිරීමටත් අවශ්‍ය දැඩි පියවර නොපමාව ගත්තෙමි.

## මහා පරිමාණ කර්මාන්තකරණයට අනුබල

### සංචාරක කර්මාන්තය

ලෝකයේ බොහෝ රටවල් තවමත් දරුණු ත්‍රස්තවාදයෙන් ගිනි ගන්නා විට සහ බොහෝ රටවල් ආර්ථික වශයෙන් කඩා වැටී සිටින විට ස්වභාව සෞන්දර්යයේ අසිරිය නිසා ද අලුත් ශ්‍රී ලංකාව තුළ ගොඩනැගෙන ප්‍රභාමත් සංවර්ධනය නිසා ද සංචාරක කර්මාන්තය ජාතික ආර්ථිකයේ ඉහළම ස්ථානයක් අත්පත් කර ගනු ඇත.

- පුළුල්වන සංචාරක කර්මාන්තයට ප්‍රමාණවත් හෝටල් කාමර 80,000 ක් ගොඩනැගීමට අවශ්‍ය සියලුම සහය ලබාදීමෙන් ලංකාවේ හෝටල් කර්මාන්තය අන්තර්ජාතික මට්ටමට ඔසවා තබමි. ඒ ඇසුරෙන් සංචාරකයන් සඳහා අවශ්‍ය අනෙකුත් සේවා සැපයීම තුළින් ජීවනෝපාය අවස්ථා 100,000 පමණ ගොඩ නැගෙනු ඇත.

- කල්පිටිය, කුච්චවේලි, යාල සහ පාසිකුඩා යන ප්‍රදේශ මුහුදු ක්‍රීඩා පදනම් කරගත් වෙරළ සංචාරක කර්මාන්තයට ගැළපෙන පහසුකම්වලින් යුක්තව දියුණු කරමි.

- කෘෂි සංචාරක කර්මාන්තය, පරිසර ලෝලී සංචාරක කර්මාන්තය, වනාන්තර ලැදි සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා තරුණ ව්‍යවසායකයින් සහ වෘත්තිකයින් දිරිමත් කරමි.

- තරුණ සංචාරකයින්ගේ සිත් බැඳ ගන්නා ත්‍රාසජනක ක්‍රීඩා අවස්ථා ඉහළ නැංවීමට පියවර ගන්නෙමි.

- අපේ රටට පැමිණෙන සංචාරකයන්ට අපට ආවේණික ආගන්තුක සත්කාරයෙන් සැලකීම තුළින් ශ්‍රී ලංකාවේ කීර්තිනාමය ලොව පුරා ප්‍රචලිත කරන වැඩසටහනක් ක්‍රියාවට නංවමි.

- කාබනික ආහාර, දේශීය ආහාර හා පාන වර්ග ආදියට සංචාරකයන්ට සපයන කුඩා ව්‍යාපාරිකයන් රුපියල් 500,000 ක සහන ණය මුදලක් ලබා දීමෙන් දිරිමත් කරමි.

- අවිධිමත් ලෙස සංචාරකයන්ට සේවා සපයන්නන් හට විධිමත් පුහුණුවක් ලබා දෙන්නෙමි.

- දේශීය වෛද්‍ය සේවා සැපයීම මුල්කර ගත් සංචාරක ව්‍යාපාරයක් සුවිශේෂී ලෙස රටපුරා ප්‍රචලිත කිරීම සඳහා දේශීය වෛද්‍යවරුන් දිරිමත් කරන්නෙමි. ඒ සඳහා සහන සැපයීමේ සහ නියාමනය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කරමි.

## ඉදිකිරීම් කර්මාන්ත පිළිවෙත

- දේශීය ඉදිකිරිම් කර්මාන්තය දැනට ලබා ඇති ජයග්‍රහණයන් ඉදිරියට පවත්වාගෙන යාම හා ප්‍රවර්ධනය කිරීම සඳහා නව ඉදිකිරීම් සංවර්ධන පනත යටතේ සියලු සේවාදායකයින්, වෘත්තිකයින් ඉදිකිරීම්කරුවන් හා ඉදිකිරිම් ශිල්පීන්ගේ පූර්ණ දායකත්වය ලබාගැනීමේ ජාතික ඉදිකිරිම් ක්‍රියාපිළිවෙතක් නිර්මාණය කරමි.

- කලාපයේ අන් රටවල් අභිබවා ඉදිරියට යාමට අවශ්‍ය අභියෝග ජයගැනීම සඳහා දේශීය ඉදිකිරීම් කර්මාන්ත ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කරමි.

- මෙම කර්මාන්තයේ සේවයේ යෙදෙන ලක්ෂ 6 කට පමණ ආසන්න සියලුම ශිල්පීය ශ්‍රේණීන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමටත් ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමටත් ඔවුනට නිසි සමාජ පිළිගැනීම අත්පත් කරදීමටත් මහාභිමානි ජාතික විශ්‍රාම සුබසාධන සහ රක්ෂණ වැඩසටහන හඳුන්වා දීමටත් අපේක්ෂා කරමි.

- ඉදිකිරීම් ශිල්පීන්ට විදේශ රැකියා අවස්ථා ලබා දීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමි.

- ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යය උසස් ප්‍රමිතියකින් යුතුව නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් හඳුන්වා දෙන්නෙමි.

- ජාතික ඉදිකිරීම් තොරතුරු ජාලයක් නිර්මාණය කරමි.

## ඇඟළුම් කර්මාන්තයේ හැරවුමක්

- තත්වයෙන් උසස් ඇඟළුම් ඉහළ පාරිභෝගික වෙළඳපොළ සඳහා නිපදවීමටත් අලුත් ජාත්‍යන්තර වෙළඳපොළ සොයා යාමටත් ඇඟළුම් කර්මාන්තශාලා හිමියන්ට රජයේ පූර්ණ අනුග්‍රහය ලබා දෙන්නෙමි.

- සෞඛ්‍යය ක්ෂේත්‍රයේ භාවිතයට ගනු ලබන සියලු රෙදිපිළි (Medical Textiles) නිෂ්පාදන සහ විවිධ කාර්යයන් සඳහා යොදා ගන්නා සුවිශේෂ රෙදිපිළි (GeoTextiles) නිෂ්පාදන කර්මාන්තය ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයට හඳුන්වා

දෙන්නෙමි. එම කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සියලු පහසුකම් රජය මගින් ලබාදීම සහතික කරමි.

- මඩකලපු දිස්ත්‍රික්කයේ දේශීය රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය නූතන තාක්ෂණයෙන් යුක්තව දියුණු කිරීමට තරුණ ව්‍යවසායකයන්ට අවශ්‍ය ප්‍රාග්ධනය හා දැනුම ලබා දීමට කටයුතු කරමි.

## උපාය මාර්ගික කර්මාන්ත පද්ධතියක්

- වාර්ෂිකව විදේශ රටවලට ඇදී යන නමුත්, අපිට නිෂ්පාදනය කරගත හැකි, දේශීය නිෂ්පාදන පදනම් කරගත් කර්මාන්ත පද්ධතියක් ස්ථාපනය කරමි. එවැනි කර්මාන්ත රාජ්‍ය අනුග්‍රහයෙන් හා රටේ ඉහළ පෞද්ගලික කර්මාන්තකරුවන්ගේ දායකත්වයෙන් ගොඩ නගමි.

- කොටස් වෙළඳපොළේ ඉහළින්ම සිටින සමාගම් 200 ද ඇතුළුව අප රටේ ඉහළම ව්‍යාපාරිකයන් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම එක් බැගින් අගය එක්කිරීමේ කර්මාන්ත සහ දේශීය අමුද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ඇතුළු කර්මාන්ත ශාලා 325 ක් ආරම්භ කිරීමට ආරාධනා කරමි. ඒ සඳහා ඔවුනට අවශ්‍ය පහසුකම් හා දිරි දීමනා සියල්ල සපයමි.

- මෙම වැඩසටහන යටතේ තමන්ගේම ජීවන ප්‍රදේශ තුළ සිටම කළ හැකි රැකියා 100,000 ක් නිර්මාණය කරමි.

- ජාතික කර්මාන්ත පද්ධතිය තුළ නව දැනුම සහ දේශීය නව සොයාගැනීම් වඩ වඩාත් දිරිගැන්වීම සඳහා තාක්ෂණික පර්යේෂණ විද්‍යාගාර පද්ධතියක් රට පුරා විශ්වවිද්‍යාල ආශ්‍රිතව පිහිටුවමි.

- විවිධ විද්‍යාඥයින් පර්යේෂකයන් එවැනි නව සොයා ගැනීම් සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා පෙළඹවීම සඳහා ජාතික පර්යේෂණ සහ සංවර්ධන අරමුදලක් පිහිටුවමි. එම අරමුදල මගින් කර්මාන්තකරුවන්ට සහ පර්යේෂකයන්ට අවශ්‍ය මූල්‍ය සහය ලබා දීමට කටයුතු කරමි.

## සීනි කර්මාන්තය

නව උපායමාර්ගික පනත යටතේ රාජ්‍ය සහ පෞද්ගලික හවුල් ආයෝජන කර්මාන්තයක් ලෙස සීනි කර්මාන්තය සංවර්ධනය කරමි. 2020 වන විට ලංකාවේ සීනි අවශ්‍යතාව දේශීයව සම්පූර්ණ කිරීමට අවශ්‍ය සැලැස්ම දැනටමත් සකස් කර ඇත්තෙමි.

- පවතින සීනි සමාගම් සතු වගා කළ හැකි සම්පූර්ණ භූමියෙන්ම උක් වගාව සංවර්ධනය කිරීමෙන් දේශීය සීනි නිෂ්පාදනයන් 40% දක්වා ඉහළ නංවමි.

- පැල්වත්ත, සෙවණගල හා හිඟුරාණ කර්මාන්තශාලා සම්පූර්ණයෙන්ම නවීකරණය කරමි. එම ප්‍රදේශවල දැනට හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්න මෙට්‍රික් ටොන් 100 දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය අධි පළඳා බීජ වර්ග සහ නූතන වගා ක්‍රම ප්‍රචලිත කරමි.

- අනුරාධපුරය, වව්නියාව, මඩකලපුව, මුලතිව්, මන්නාරම සහ බිබිල යන ප්‍රදේශවල හෙක්ටයාර් 120,000 අලුතින් උක් වගාවට එකතු කරමි. එම සෑම ප්‍රදේශයකම අති නවීන කර්මාන්ත ශාලා පද්ධතියක් ආරම්භ කරමි.

- මෙම අලුත් කර්මාන්තශාලා ඇසුරෙන් සෘජු රැකියා 25,000 ක් ඇති කරමි ඊට අමතරව දැනට පවතින කෘෂිකර්මයෙන් නිසි ඵල නොලබන එම ප්‍රදේශවල ගොවීන් ඇසුරෙන් අලුත් උක් වගා

පන්තියක් ගොඩ නගමි. අවම වශයෙන් ප්‍රදේශයේ ගොවි පවුල් 100,000 කට අතිරේක ජීවනෝපාය මාර්ග උදා වනු ඇත.

- සීනි නිෂ්පාදනයේ අතිරේකයක් වන එතනෝල් මත්පැන් සඳහා නොව ඉන්ධන මුසුවක් ලෙස භාවිත කිරීමට අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කරමි.

- කාඩ්බෝඩ්, කඩදාසි සහ ප්ලාස්ටික් ඇසුරෙන් අතුරු නිෂ්පාදන ගණනාවක් රට තුළ ගොඩ නගමි.

- සීනි කර්මාන්ත ශාලා ඇසුරෙන් පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය ජාතික විදුලිබල පද්ධතියට එකතු කරමි.

## කිරි කර්මාන්තය - ධවල විප්ලවය

දීර්ඝ කාලයක් තිස්සේ දේශීය කිරි කර්මාන්තයට කුඩම්මාගේ සැලකිලි ලැබීමෙන් බිඳවැටී තිබුණු දේශීය කිරි නිෂ්පාදන කර්මාන්තය තුළ විප්ලවීය වෙනසක් කරමින් දේශීය කිරි නිෂ්පාදනය 13% සිට 40% දක්වා වර්ධනය කිරීමට හැකිවීම අප ලැබූ විශිෂ්ට ජයග්‍රණයකි. එමඟින් ලත් ආත්ම ධෛර්යයෙන් යුක්තව 2020 දී ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත කරමි.

- දැනට ලංකාවේ කිරි එළදෙනුන් ලක්ෂ 12 ක් සිටින බව වාර්තා වී ඇතත් ඊට සාපේක්ෂ කිරි නිෂ්පාදනයක් සිදු වන බව බව මම නොදකිමි. ඊට හේතුව දියර කිරි එකතු කිරීමේ හෝ අළෙවි කිරීමේ නිසි ක්‍රමවේදයක් රට පුරා ව්‍යාප්ත නොවන බැවින් රට පුරා පැතුරුණු කිරි එකතු කිරීමේ ජාලයක් සහ ගබඩාකරණ මධ්‍යස්ථාන සමූහයක් ස්ථාපනය කරමි.

- සෑම පළාතකටම එක බැගින් ප්‍රධාන කිරි ආශ්‍රිත කර්මාන්ත ශාලා 9 ක් ආරම්භ කරමි.

- එම කාර්මාන්ත ශාලාවල කිරි නිෂ්පාදන අදාළ පළාතේ නමින් අලෙවි කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන්නෙමි. එමගින් නිෂ්පාදන අලෙවි කිරීම ප්‍රවර්ධනය කරමි.

- ප්‍රධාන පිටි කිරි නිෂ්පාදන කර්මාන්ත ශාලා 4 ක් පිහිටුවමි. එමඟින් ආනයනික පිටි කිරි සමඟ තරග කිරීමට වස විසෙන් තොර දේශීය පිටි කිරි කර්මාන්තයට හැකි වනු ඇත.

## මධ්‍ය පරිමාණ පාෂාණ කර්මාන්ත පද්ධතියක්

බොහෝ දෙනා කල්පනා කරන්නේ ලෝකයේ ඇති වටිනාම භූගත සම්පත් වන්නේ රත්තරන්, දියමන්ති සහ ඛනිජ තෙල් පමණක් බවයි. අපේ රටේ බොහෝ දෙනා ද තවමත් පසුවන්නේ එම පරිකල්පනයේම බව මගේ හැඟීමයි. එමනිසා අපට උරුම වී ඇති මැණික් ඉල්මනයිට් මිනිරන්, සිලිකා, හිරිගල් වැනි භූගත සම්පත්වලින් අප තවමත් නිසිඵල නෙළාගෙන නැති බව මම දනිමි. එබැවින් පරිසර පද්ධතිය ද ආරක්ෂා වන පරිදි දැඩි පාලනයක් යටතේ ජාතික පාෂාණ කර්මාන්ත සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරමි.

## මැණික් කර්මාන්තය

- නිල් මැණික් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළේ අප දිනා ඇති කීර්තිනාමය පදනම් කරගෙන ශ්‍රී ලංකාව ලෝකයේ අංක එකේ නිල්මැණික් වෙළඳ මධ්‍යස්ථානය බවට පත් කරමි.

- ලොව ප්‍රමුඛ පෙළේ මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන් ආකර්ෂණය කරගැනීමෙන් ශ්‍රී ලංකාව මැණික් කර්මාන්තයේ ප්‍රමුඛ රටක් බවට පත්කරමි.

- නවීන විද්‍යුත් තාප පිරියම් කිරීමේ තාක්ෂණය මෙරටට හඳුන්වාදී ගෙවුඩ සහ කුරුවින්ද මැණික් සඳහා අගය එක් කිරීමෙන් මෙම

ක්ෂේත්‍රයේ නියැළෙන්නන්ට අලුත් ව්‍යාපාරික දොරටුවක් විවෘත කරමි.

- තවමත් අපේ රටේ භාවිත නොවන *"අධිතාක්ෂණික සූක්ෂම කැපුම් තාක්ෂණය"* (Precision Cutting) මෙරටට හඳුන්වා දී ගැරුම් වට්ටියේ වැඩිපුරම ඇති වටිනාකමෙන් අඩු කුඩා මැණික්වලට අගය එක් කිරීමෙන් ඉහළ ආදායමක් උපයා ගැනීමට අවස්ථාව උදාකරමි.

- මැණික් කර්මාන්තයට සම්බන්ධ කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා රළු මැණික් නිෂ්පාදන වර්ධනය කර ඒ සඳහා විදේශ වෙළඳපොළ විවෘත කර දෙන්නෙමි.

## දියුණුවේ නොදුටු සම්පත

- අප සතු මිනිරන්, පොස්පේට්, යකඩ, යපස්, ඛනිජ තෙල්, ස්වභාවික ගෑස් සහ ඛනිජ වැලි යන සම්පත්වල නිසිඵල නෙළාගැනීම සඳහාත් අගය එකතු කළ නිමි කර්මාන්ත බිහිකිරීම සඳහාත් ජාතික තිරසර ඛනිජ සම්පත් කර්මාන්ත ප්‍රතිපත්තියක් සකස් කරමි.

- එප්පාවල පොස්පේට් නිධිය වැනි සම්පත්වලින් දේශීය ගොවිතැනේ හා වැවිලි කර්මාන්තයේ අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය රොක් පොස්පේට්, සිංගල් සුපර් පොස්පේට් සහ ට්‍රිපල් සුපර් පොස්පේට්, නිපදවීම නූතන තාක්ෂණයන් මුසු කර්මාන්තයක් ලෙස සංවර්ධනය කරමි.

- මෙම කර්මාන්ත සඳහා ජීව තාක්ෂණය, නැනෝ තාක්ෂණය, විද්‍යුත් තාක්ෂණය, රොබෝ තාක්ෂණය, තොරතුරු හා අභ්‍යවකාශ තාක්ෂණය ආදිය භාවිතයෙන් නිෂ්පාදන ධාරිතාව නැංවීම සඳහා පර්යේෂණ කටයුතු දිරිමත් කරමි.

- ශ්‍රී ලංකාවේ වෙරළ තීරවල විසිරුණු ඛනිජ සම්පත් එකතු කරන අය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ලෙස දියුණු කිරීමට පියවර ගන්නෙමි.

- අවදානම හිසින් දරාගෙන පතල්වල වැඩෙහි යෙදෙන ශ්‍රමිකයන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කරන අතර ඔවුනට ජීවිත රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

## කුඩා ව්‍යාපාර සංවර්ධන වැඩසටහන

- ගෘහ, කුඩා සහ මධ්‍ය පරිමාණ නිෂ්පාදන විදේශ වෙළඳපොළට යොමු කිරීම පදනම් කරගෙන "ජයබිම ලංකා" වැඩසටහන ක්‍රියාත්මක කරමි.

- කාර්මික සංවර්ධන මණ්ඩලය වඩාත් ශක්තිමත් කර මෙම ව්‍යාපාරිකයන් සඳහා අවශ්‍ය පුහුණුව, තාක්ෂණය හා වෙළඳපොළ තොරතුරු පහසුවෙන් ලබා දෙන වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කර කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට නිවැරදිව යොමුකරන වැඩසටහනේ නියමුවා බවට පත් කරමි.

- සියලුම රාජ්‍ය බැංකු හරහා සහන පොලියක් සහ පළමු වසර දෙක තුළ වාරික අය නොකරන විශේෂ සංවර්ධන ණය යෝජනා ක්‍රමයක් මෙම ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාත්මක කරමි.

- කුඩා ව්‍යාපාරිකයන්ගේ විවිධ අවශ්‍යතා ඉටුකිරීම සඳහා ස්ථාපනය කර ඇති සියලුම රාජ්‍ය ආයතන සහ අදාළ ව්‍යවසායකයන්ගේ ද නියෝජනය සහිත ජාතික සභාවක් පිහිටුවන්නෙමි.

# සම්ප්‍රදායික උරුමයෙන් නූතන වෙළඳපොළ ජයගැනුම

විවෘත ආර්ථිකය තුළ වෙළඳපොළ වසාගෙන තොරොම්බල් වෙළඳාම පැතිරෙන විට වඩාත් අසරණ වූ සම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ගෝලීයකරණයේ ජාත්‍යන්තර නිර්මාතෘවරුන්ගේ නිවෙස්වල අලංකාරය පිණිස තබා ඇති හෙට දවසක් දැකීම මට ඉමහත් සතුටකි. එම නිසා සම්ප්‍රදායික නිෂ්පාදන කර්මාන්තය ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කරමින් සංවර්ධනය කරන වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- ජාතික මෝස්තර මධ්‍යස්ථානය ව්‍යුහාත්මකව හා ගුණාත්මකව වෙනස්කර පැරණි සම්ප්‍රදායානුකූල භාණ්ඩ නිෂ්පාදනය කරන ගම්මාන සමඟ සෘජුව සම්බන්ධ කරමි.

- හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ රජයේ මැදිහත්වීම දරන ප්‍රධාන ආයතනයක් වන ලක්සල හරහා පෙර ඇණවුම් (Forward Contract) ලබා දීම ඔස්සේ දේශීය වෙළඳපොළ ස්ථාවර කරමි.

- ඒ සඳහා චක්‍රීය අරමුදලක් ආරම්භ කොට මෙම අංශය කෙරෙහි උනන්දුවක් දක්වන තරුණ තරුණියන් ජාත්‍යන්තර වෙළඳපොළට අවශ්‍ය උසස් මට්ටමේ භාණ්ඩ නිපදවීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීමට පියවර ගන්නෙමි.

- ග්‍රාමීය කෘෂි නිෂ්පාදනයේ යෙදෙන කුඩා පරිමාණ ගොවියාගේ, ව්‍යවසායකයාගේ නිෂ්පාදන රැස්කිරීම සහ බෙදා හැරීම සඳහා වයස 35 ට අඩු තරුණ ව්‍යවසායකයන් 25,000 ක් සඳහා කුඩා ලොරි රථයක් හෝ මිලට ගැනීම සඳහා සහන පොළියක් යටතේ ණය මුදලක් ලබා දෙන්නෙමි.

- මෙම වෘත්තීන්හී නියැළුණු වයෝවෘද්ධ අයට පිළිසරණ වියයුතු අවස්ථා හඳුනා ගෙන ජීවන දීමනාවක් ගෙවීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

- වයස 18 වූ පසුව හැඳුණුම්පත පමණක් නොව විභාග සහතික ඇතුළු පොදුවේ රජයෙන් සැපයෙන සේවා නිවසටම ලැබීමේ ක්‍රමයක් සකස් කරමි.

- සෑම ගමකම දරුවන්ට ක්‍රීඩාවේ යෙදීමට අංගසම්පූර්ණ සිඟිති උයනක් ද ඉදිකරමි.

- කිසිදු නිවසක බතක් නොඉදෙන දවසක් තිබෙන්නට මම ඉඩ නොහැරිමි. ඒ සඳහා පවුලේ එක් සාමාජිකයෙකුට හෝ රැකියාවක් හෝ ස්ථිර ආදායමක් සහතික කරමි. ඒ බව සහතික කිරීම සඳහා නීතිමය රාමුවක් ද සකස් කරමි.

- ඒ ඒ ගම්මානවලට අදාළ සාම්ප්‍රදායික කර්මාන්ත යළි පුනර්ජීවන කරන අතර එම කර්මාන්තවල නියැළීමට අවශ්‍ය මිල මුදල් දිවිනැගුම බැංකුවෙන් පොළී රහිතව සහ අවම පොළියකට ලබා දෙන්නෙමි.

- කාන්තා ව්‍යවසායකත්වයට මුල්තැන ලබාදෙන අතර ඔවුනට ගෘහාශ්‍රිතව යෙදිය හැකි මල් වගාව, පැළ තවාන් දැමීම, එළවළු පළතුරු ආශ්‍රිත නිෂ්පාදන, දේශීය ආහාර නිෂ්පාදන, සත්ව පාලනය හෝ වෙනත් ස්වයං රැකියාවක යෙදීමට අවශ්‍ය දැනුම සහ පුහුණුව දිවිනැගුම නිලධාරීන්ගේ මගපෙන්වීම යටතේ ලබා දෙන්නෙමි.

- සෑම තරුණ තරුණියකටම නිවයේ සිට නිතිපතා මුදල් ඉපයිය හැකි ධන ජනනී අන්තර්ජාල වැඩසටහන හඳුන්වා දෙන්නෙමි. අන්තර්ජාලය හරහා විවිධ සේවාවන් සැපයිය හැකි පිරිස් ලියාපදිංචි කර එකී සේවා අවශ්‍යතා ඇති පිරිස් අදාළ සේවා නිවසේ සිටම ලබාදීමෙන් අවම වශයෙන් මසකට රුපියල් 25,000 වඩා උපයා ගැනීමට හැකි තත්වයක් උදා කරමි.

- විදේශගත මව්වරුන් දරුවන්, විශේෂ අවශ්‍යතා ඇති දරුවන්, බිඳවැටුණු පවුල්වල හෝ වැඩිහිටියෙකුගේ නිසි රැකවරණ නොලබන දරුවන් ආදී රැකවරණය අවැසි දරුවන් සඳහා සෑම ගමකම සපිරි සම්පත් මධ්‍යස්ථානයක් ආරම්භ කරමි.

- විශ්‍රාම සුවයේ පසුවන දෙටු පුරවැසියන්ට සහ රැකවරණය අහිමි වැඩිහිටියන් සඳහා ද එකී මධ්‍යස්ථානවලම දිවාසුව පෙදෙසක් වෙන්කරමි. දිනපතා පුවත්පත්, බණ දහම් පොත්, සැහැල්ලු ක්‍රීඩා භාණ්ඩ, දාම්, කැරම්, චෙස් වැනි ගෘහස්ත ක්‍රීඩා උපකරණ සහ ව්‍යායාම උපකරණ එම මධ්‍යස්ථානවලට සපයන්නෙමි. මෙවැනි මධ්‍යස්ථාන ගොඩනැගීමේදී ආගමික ස්ථාන මුල්කර ගැනීමට උපදෙස් දෙමි.

- ආගමික සහ සහජීවන සංවර්ධනය වැඩසටහන් මගින් මතින් දුමෙන් මිදුණු ගමක්, කාන්තා ළමා හිංසනයෙන් තොර ගමක්, අපරාධවලින් තොර ගමක් ගොඩනැගීමට කටයුතු කරමි.

- පිරිසිදු පරිසරය, රක්ෂිත ඉඩම් සහ වන රොද ආරක්ෂා කිරීම, කාබනික පොහොර භාවිතය, කසළ කළමණාකරණය, රුක් රෝපණය ජන ජීවිතයේ අනිවාර්ය කොටසක් බවට පත් කරමි.

- ජාතිකත්ව හෝ කුල පදනම හෝ වෙනත් සමාජීය කරුණු පදනම් කරගෙන කිසිවෙකුටත් මෙම ප්‍රතිලාභ අහිමි වීමට ඉඩ නොතබමි.

## පිරිපුන් ජීවනෝපා සංවර්ධන වැඩසටහන

රටේ ආර්ථික පැවැත්ම සඳහා විශාල දායකත්වයක් සපයන පෙදරේරුවා, වඩුකාර්මිකයා, සංචාරක වෙළඳාමේ යෙදෙන්නා, පොල් ගස් නගින්නා වැනි විවිධසේවා සපයන්නන් සහ දිනපතා කුලී පදනම මත සේවා සපයන්නන් වැනි විශාල පිරිසකට තවමත් අපේ සමාජයේ සමාන





පිළිගැනීමක් නොමැති බව මම පිළිගන්නෙමි. ඔවුනට සමාන සමාජ වටිනාකමක් ලබාදෙන පිරිපුන් ජීවනෝපා සංවර්ධනය වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- නොවිධිමත් රැකියා කරන්නන් ගැන සොයා බැලීම සඳහා නොවිධිමත් රැකියා කාර්යාංශයක් පිහිටුවමි. ඒ යටතේ අදාළ රැකියාවල යෙදෙන්නන් ලියාපදිංචි කර හැඳුනුම්පතක් නිකුත් කරමි.

- ඔවුනට වෘත්තිය පුහුණුව, තොරතුරු සංනිවේදන හැකියාව, තාක්ෂණික භාවිතය දියුණු කිරීම, ගිනුම්කරණය සහ බැංකු කටයුතු පිළිබඳව නිසි පුහුණුවක් ලබා දෙන අතර සමාජ දැනුම දියුණු කරගැනීම සඳහා ඇති ඉඩ ප්‍රස්ථාද පුළුල් කරමි.

- කුඩා ලොරි රථයක් හෝ මෝටර්සයිකලයක්, වෘත්තියට අදාළ උපකරණ හා මෙවලම් සහන මිලට ලබා දීමට කටයුතු කරමි.

- නිවසක හෝ කාර්යාලයක ඉදිකිරීමක් හෝ අලුත්වැඩියාවක් ඇති විට අන්තර්ජාලය හරහා අදාළ සේවා සපයන්නන් හඳුනා ගෙන වැඩෙහි ස්වභාවය අනුව ගෙවීම් එකඟතා ඇතිකර ගැනීමට හා අත්තිකාරම් මුදල් ගෙවීමට අන්තර්ජාලය හරහාම පහසුකම් සැපයෙනු ඇත. අනතුරුව තමන්ගේම ලොරියකින් අදාළ අමුද්‍රව්‍ය, උපකරණ සහ සේවකයන් ද සමඟ අදාළ ස්ථානයට ගොස් ඉදිකිරීම සම්පූර්ණ කිරීමට අදාළ ශිල්පියාට හැකියාව සැලසෙනු ඇත. මෙමගින් සේවාලාභියාට තම කාලය ඉතිරිවන අතර සේවා සපයන්නාට ඉහළ සමාජ වටිනාකමක් සැලසෙනු ඇත.

- මෙම අලුත් ව්‍යවසායකයින්ට උපකරණ සහ මෙවලම් ප්‍රවාහනය කිරීමට අවශ්‍ය කුඩා ලොරි රථයක් සහන මිළට ලබා දීමට කටයුතු කරමි.

## ස්වයං රැකියා ආරක්‍ෂණ වැඩසටහන

- රට පුරා වෙසෙන සියලු ස්වයං රැකියාලාභීන්ගේ රැකවරණය සඳහා "ස්වයං රැකියා කාර්යාංශයක්" දිවිනැගුම දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවමි.

- ග්‍රාමීයව හෝ නාගරිකව ස්වයං රැකියාවල යෙදෙන සියලු දෙනාටම ඇතිවන එදිනෙදා අතමාරු අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා අලුත් බැංකු ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි. ඒ යටතේ වසරකට වැඩි කාලයක් රුපියල් 20 සිට 500 දක්වා වන දෛනික ආයෝජන ගිණුමක් පවත්වාගෙන යන්නෙකුට ඇප සහ පොළී රහිතව මාසයක කාලයක් සඳහා ගිණුමේ ඇති මුදල මෙන් තුන්ගුණයක ආයෝජන ණයක් ලබා දෙන්නෙමි.

- නූතන දැනුම ඇසුරින් තම රැකියාව සංවර්ධනය කරගැනීමට දිරි දීමක් වශයෙන් ණැනසළ මගින් නොමිලේ පරිගණක සාක්‍ෂරතා පුහුණුවක් ලබා දෙන්නෙමි.

- නාගරික ස්වයංරැකියාලාභීන්ට තම නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා අවශ්‍ය ස්ථානයක් සෑම නගරයකින්ම ලබා දෙන්නෙමි. ඒ සඳහා අසාධාරණ බදු මුදල් අය නොකිරීමට පළාත් පාලන ආයතනවලට උපදෙස් දෙමි.

- ත්‍රීරෝද රථ, බජට් ටැක්සි, පාසල් වෑන් රථ, සංචාරක ප්‍රවාහන රථ ආදී සියලු පෞද්ගලික ප්‍රවාහන අංශ පෞද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත් කරමි.

- ප්‍රවාහන කාර්යයේදී කවදත් දුප්පතාගේ හිතවතා ත්‍රීරෝද රථය බව මම හොඳාකාරවම දනිමි. මානුෂික මෙහෙයුම පවතිද්දී රණවිරුවෝ රට රකිද්දී ත්‍රීරෝද රථ නියමුවෝ නගර ආරක්‍ෂා කිරීමට දිවා රෑ කැපවුණු හැටි මම කිසිදා අමතක නොකරමි. එබැවින් ඔවුන් නිතර මුහුණ පාන හදිසි මුදල් අවශ්‍යතා සපුරා

ගැනීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හරහා "දිවි දිරිය" නමින් අලුත් ඉතුරුම් ක්‍රමයක් සහ රුපියල් 50,000 දක්වා ඇප රහිත 6% පොළියෙන් ණය ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි. එසේම අවුරුදු 20 කින් ගෙවා නිම කළ හැකි ලක්ෂ පනහක් දක්වා නිවාස ණයක් අඩු පොළී අනුපාතයක් යටතේ ලබා දෙන්නෙමි.

- කල්බදු ක්‍රමයට ත්‍රීරෝද රථ ලබාගැනීමෙන් පසු වාරිකයක් හිඟතිබීම වැනි කරුණු නොසලකා නිසි වේලාවට ආදායම් බලපත්‍ර සහ රක්ෂණ කටයුතු කරගැනීමට ඇති වී තිබෙන ප්‍රායෝගික ගැටලු විසඳීමට ක්‍රියා කරමි.

- සංචාරක ආවරණ කලාපයන්වල සේවා සපයන ත්‍රීරෝද රථ නියමුවන්ගේ භාෂා හැකියාව සහ අනිකුත් වෘත්තීය හැකියාවන් ප්‍රවර්ධනය සඳහා නොමිලේ විධිමත් පුහුණුවක් ලබා දී ඔවුනගේ සමාජීය මට්ටම ඉහළ නංවා ගැනීමට ද ඉඩ සලස්වමි.

- දිවිනැගුම දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ අංශය මගින් පෞද්ගලික බස් රථ, ලොරී, ත්‍රීරෝද රථ, බජට් ටැක්සි, පාසල් වෑන් රථ සහ සංචාරක ප්‍රවාහන ආදී සියලු ක්ෂේත්‍රවල රියදුරුන් සඳහා සෞඛ්‍ය රක්ෂණ ක්‍රයක් හා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාවට නංවමි.

# 8 ජාතික පෞරුෂත්ව අධ්‍යාපනයක්

රටක අභිමානීය පැවැත්ම යනු එම රටේ භාෂාව මත පදනම් වූ සාර පද්ධතීන්ගේ හරය උරාගත් ජාතික පෞරුෂයයි. ඇමරිකානු, ජපන්, චීන, ඉන්දියානු ආදී වශයෙන් හැඳින්වෙන්නේ එම රටවල භූගෝලීයත්වය හෝ ජනවාර්ගිකත්වයන්ට එහා ගිය ජාතික පෞරුෂ අනන්‍යතාවයි. තිස්වසරක යුද්ධය විසින් අපෙන් උදුරා ඉවත හෙළා ඇත්තේත් මේ ජාතික පෞරුෂත්වයම යැයි මම විශ්වාස කරමි. ගෝලීයකරණ ක්‍රියාවලිය බිඳුණු ජාතික පෞරුෂයන් යටකරගෙන එක පිම්මේ ඉදිරියට ඇදෙමින් තිබේ. එම නිසා අද අපට උවමනා කරන්නේ අයෝමය පෞරුෂයකින් යුත් ජාතිකත්වයකි. ඒ සඳහා අද උපදින පරම්පරාවට ඓතිහාසික උරුමයන් හා වටිනාකම්වලින් සපිරි නූතනත්වය තුළින් ජාත්‍යන්තරය ජයගත හැකි අධ්‍යාපන ක්‍රමයක් අත්‍යාවශ්‍ය බව මම දැඩිසේ විශ්වාස කරමි.

- සියලු පක්ෂ නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් සම්මත කර ඇති “නව අධ්‍යාපන පනත” මෙම වසරේ සිට ක්‍රියාවට නංවමි.

- මෙම පනතෙහි අරමුණ රට ඉදිරියේ තබන දැවැන්ත සංවර්ධන අපේක්ෂාවට ඉලක්කගත වන ආකාරයට දැනුමෙන් හා පුහුණුවෙන් සපිරි උගත් පරපුරක් ගොඩනගා ගැනීමයි.

## පෙර පාසලේ පෙරළිය

ජාතික පෞරුෂ වර්ධනයේ සුබ මොහොත ඇරඹෙන්නේ පෙර පාසලෙනි. එම නිසා පෙර පාසල් අධ්‍යාපනය ගැන මම ඉතා කල්පනාකාරී වෙමි.

- සෑම දරුවෙකුටම පෙර පාසල් අධ්‍යාපන අයිතිය අනිවාර්ය කරමි.

- දැනටමත් සකස්කර ඇති "පෙර ළමාවිය ජාතික අධ්‍යාපනය ප්‍රතිපත්තිය" නැවත සියුම්ව පරීක්ෂා කර බලා නොපමාව ක්‍රියාවට නංවමි.

- "පාසලට පෙර පාසලක්" සංකල්පය යටතේ සෑම පාසලකටම සම්බන්ධ පෙර පාසලක් ඒ ආසන්නයේම ආරම්භ කරමි. එම පෙර පාසලට අවශ්‍ය සම්පත් සහ සහායක සේවා අදාළ පාසලෙන් ලබා දීමට කටයුතු කරමි.

- අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ "පෙර පාසල් පුහුණු ආයතනයක්" ආරම්භ කරමි. එමගින් සෑම පෙර පාසල් ගුරුවරියකටම අවශ්‍ය නූතන පෙර පාසල් අධ්‍යාපන පුහුණුව ලබා දෙන්නෙමි.

## සැමට සම නැණ වරම්

- ප්‍රාථමික පංති පැවැත්වෙන ලංකාවේ මුළු පාසල් සංඛ්‍යාව 10000 ක් දක්වා වර්ධනය කරමි.

- ගමේ දරුවන්ටත් අග්‍රගණ්‍ය පාසලක් හිමි කර දෙන මහින්දෝදය ද්විතීක පාසල් 1000 සේ කටයුතු 2016 වන සම්පූර්ණ කරමි.

- "*මහින්දෝදය පෝෂිත පාසල් සංකල්පය*" යටතේ පාසල් 5000 ක් අංග සම්පූර්ණ පාසල් බවට පත් කරමි.

- අත්හැර දමා තිබූ ගමේ පාසල ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම්, ඇතුළු සියලුම භෞතික පහසුකම්වලින් සමන්විත ළමා මිතුරු පාසලක් බවට පත් කිරීම යටතේ 2016 දී සියලුම ප්‍රාථමික පාසල් ළමා මිතුරු පාසල් බවට පත් කරමි.

- සාමාන්‍ය පෙළ දක්වා පංති ඇති සෑම පාසලකටම විද්‍යාගාරයක් ලබා දෙන අතර විද්‍යා විෂයධාරාව සහිත පාසල් සංඛ්‍යාව 1000 දක්වා වැඩි කරමි.

- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක බැගින් විද්‍යා, වාණිජ, කලා හා තාක්ෂණ පාඨමාලාවන්ගෙන් සමන්විත අංගසම්පූර්ණ මහින්දෝදය ද්විතීයික පාසල් වැඩසටහන යටතේ දැනටමත් පාසල් 100 ක් ආරම්භ කර ඇති අතර 2016 දී එම අරමුණ ද සම්පූර්ණ කරමි. ප්‍රමාණාත්මක ලෙස ද්‍රවිඩ භාෂා මාධ්‍ය පාසල් ද මෙම වැඩසටහන යටතේ ආරම්භ කරමි.

- 2020 වන විට සෑම දිස්ත්‍රික්කයකටම එක බැගින් සුපිරි ජාතික පාසල් 25 ක් ආරම්භ කරමි. 2015 දී නුවරඑළියෙන් මෙම වැඩසටහන ආරම්භ කරමි.

## ගණිතය පවුර බිඳ දැමීම

කවර හෝ හේතුවක් නිසා කොපමණ උපාය මාර්ග යෙදුව ද අපේ දරුවන්ගෙන් අඩක් පමණ තවමත් ගණිත විෂයට සමත්කම් දක්වන්නේ නැත. එබැවින් එවැනි දරුවන්ගේ ජීවන සංවර්ධනයට කිසිදු බාධාවක් ඇති නොවනු පිණිස අවශ්‍ය පියවර ක්‍රියාත්මක කරමි.

- විෂය නිර්දේශය, ඉගැන්වීමේ විධික්‍රම, ගුරුවරුන්ගේ ආකල්ප සහ නූතන ඉගැන්වීම් ක්‍රම පිළිබඳ දැනුවත්කම, දරුවන් කෙරෙහි බලපාන මනෝ සමාජී හේතු ආදී කරුණු පිළිබඳ දීර්ඝ ලෙස සොයා බලා මෙම ගැටලුවට තිරසාර විසඳුමක් සෙවීම පිණිස ජනාධිපති ලේකම්වරයාගේ මූලිකත්වයෙන් යුත් ජනාධිපති කොමිසමක් පත් කරමි.

- උසස් පෙළ විෂයධාරාව හැදෑරීම සඳහා සුදුසුකම් ඇති නමුත් ගණිතය අසමත් සිසුන්ට තාක්ෂණික විෂයධාරාව හෝ කලා විෂයධාරාව හැදෑරීම සඳහා අවස්ථාව සලසා දෙන්නෙමි.

- විෂයන් හයක් සමත්, ගණිතය අසමත් සිසුන්ට වසර දෙකක් තුළ සමත් කරදීමේ පදනම මත උසස් පෙළ හැදෑරීමට අවස්ථාව සලසන අතර එකී දෙවසර තුළ ගණිතය සමත් කිරීම සඳහා විශේෂ පංති පැවැත්වීමට කටයුතු කරනු ඇත.

## ඓතිහාසික දැනුම් විප්ලවය

තාක්ෂණ විෂය උසස් පෙළ විෂය දහරාවට එක් කිරීම අනාගතය උදෙසා අපේ රජය තැබූ ඓතිහාසිකම පියවර ලෙස දිනක ඉතිහාසයේ රන් අකුරෙන් ලියවෙනු ඇති බව මම දැඩිව විශ්වාස කරමි. මක්නිසාද එමගින් විශ්වවිද්‍යාලයට යාමට නොහැකිව උසස් අධ්‍යාපනය අහිමි වීමෙන් සුසුම් හෙළූ දැයේ දුවා දරුවන්ට එම අවස්ථාවත් රැකියාවත් යන දෙකම සම්පූර්ණ වන බැවිනි.

- තාක්ෂණික විෂයදාරාව හදාරන සෑම සිසුවෙකුටම ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් (NVQ) හිමිවනු ඇත. එම සහතිකය උසස් අධ්‍යාපනයට යොමුවීමට අකමැති සෑම සිසුවෙකුගේම රැකියා දොරටුව ප්‍රවේශ පත්‍රය ද වනු ඇත.

- සෑම දිස්ත්‍රික්කයකටම එක බැගින් විශ්වවිද්‍යාල විද්‍යායතන 25ක් ආරම්භ කරමි. 2015 උසස් පෙළ සමත් විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලබන සිසුන් 7500 කට 2016 දී එම විද්‍යා ආයතනවලට බඳවා ගන්නෙමි.

- මහින්දෝදය තාක්ෂණික ශිෂ්‍යත්ව අරමුදලින් තාක්ෂණික අධ්‍යයන පාඨමාලාව හදාරන ආර්ථික දුෂ්කරතා ඇති දරුවන්ට මසකට රුපියල් 1000 ක ශිෂ්‍යත්ව මුදලක් ලබා දෙන්නෙමි. දිවයිනේ සෑම පාසලකම තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉගැන්වීමට පියවර ගන්නෙමි.

## විශේෂිත අවශ්‍යතා ඇති දරුවන්ට විශේෂයි

- විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපනයේ අයිතිය සහතික කිරීම සඳහා අංග සම්පූර්ණ සම්පත් මධ්‍යස්ථානයක් කොළඹ පිහිටුවමි.

- එම දරුවන් සඳහා විශේෂ චිකිත්සක මධ්‍යස්ථානයක් සෑම අධ්‍යාපන කොට්ඨාසයකටම එක බැගින් ආරම්භ කරමි.

- ඉදිරි හය වසර තුළ රජයේ පාසල් 500ක විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සම්පත් මධ්‍යස්ථාන පිහිටුවමි.

- සියලුම විෂය පෙළ පොත් බ්‍රේල් භාෂාවට පරිවර්තනය කර දෘෂ්‍ය සහ ශ්‍රවණාබාධිත දරුවන් සඳහා ඇවැසි ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සියල්ල නොමිලේ ලබා දීමට කටයුතු කරමි.

- එකී පාසල්වල නේවාසික සිසුනගේ මාසික දීමනාව රුපියල් 500 දක්වා වැඩි කරමි.

## පැසල දරුවන් ළඟට

- කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ සහ මහරගම පිළිකා රෝහලේ දීර්ඝකාලීනව ප්‍රතිකාර ලබන දරුවන්ට අඛණ්ඩව අධ්‍යාපනය ලබා දුන් පැසල් පහසුකම්, එවැනි දරුවන් ඇති පිට පළාත්වල රෝහල්වලට ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව ලබා දෙන්නෙමි.

- මාවත්වාසී දරුවන්ට හයහතර කියාදීම සඳහා ජංගම බස් පාසලක් හඳුන්වා දෙන්නෙමි. ඔවුන් සිටින ස්ථානවලට ගොස් බස් පාසලට ගොඩ කරගෙන නියමිත පැය ගණන මූලික අධ්‍යාපනය, පරිගණක දැනුම සහ දෑතේ කර්මාන්තයක් සඳහා වන දැනුම ලබා දෙන්නෙමි.

- ඔත්පලව ඇවිදීමට නොහැකිව සිටින දරුවන් පාසල් වෙත රැගෙන ඒමට දෙමව්පියන් විඳින දුක මම දනිමි. ඔවුන්ගේ වේදනාව අවම කිරීම සඳහා එවැනි දරුවන් සිටින නිවෙස්වලම ගොස් ඔවුනට අධ්‍යාපනය ලබාදීම සඳහා ගම්මාන 5 කට එක් තරුණිය බැගින් තෝරාගෙන ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දෙන්නෙමි. අදාළ සුදුසුකම් සැපිරීමෙන් පසුව එම තරුණියන් ද ගුරු සහායක තනතුරට අනුයුක්ත කරමි.

## සදහම් සුරැකුම් අධ්‍යාපන

- සමස්ථ ආසියාවටම දැනුම පැතිරූ මහවිහාර වංශයේ උරුමය අනාගත සංඝ පීතෘ පරපුරට දායාද කරණු වස් පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලාගේ මහා සම්මේලනයේදී මවෙත ඉදිරිපත් කළ යෝජනා ඇසුරෙන් *ජාතික පිරිවෙන් ප්‍රඥාප්තියක්* සකස් කරමි.
- ඒ යටතේ පිරිවෙන් සංවර්ධන මණ්ඩලයක් සහ පිරිවෙන් සංවර්ධන අරමුදලක් ද ස්ථාපනය කරමි.
- පිරිවෙන්වල සහ උසස් අධ්‍යාපනය ලබන තරුණ ස්වාමීන් වහන්සේලාට මසකට රුපියල් 2500 ක සදහම් සුරැකුම් ශිෂ්‍යත්ව මුදලක් ලබා දෙන්නෙමි. ඒ සඳහා මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට සමාන අරමුදලක් ඇති කරමි.

## අහස සමුදුර ජය ගන්නා උසස් පරපුර

අපේ විශවවිද්‍යාලවල අධ්‍යාපන ක්‍රමය බොහෝ දුරට සමන්විත වී ඇත්තේ සම්ප්‍රදායික බටහිර ආකෘතිය අනුව බව විශ්වවිද්‍යාලයක සේවය කර ඇති නිසාම මම ද දන්නෙමි. අද අපේ රට ලබා ඇති සංවර්ධනය සහ එහි විවිධ ක්ෂේත්‍රවල පැතිරීමට අනුව එම ක්ෂේත්‍රවලට අදාළ උපාධිධාරීන් සහ

දැනුම්වත් වෘත්තීකයන්ගේ හිඟකම දැන් අපට ඇති ප්‍රධාන ගැටලුවකි. එම නිසා අපේ රටේ සංවර්ධනය ඉදිරියට ගෙනයාමට අවැසි බුද්ධිමතුන් අපේ රටෙන්ම නිෂ්පාදනය කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමයේ පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇති කිරීමට මම යෝජනා කරමි.

- එකී අරමුණ සඳහා පවතින විශ්වවිද්‍යාල පුළුල් කර 2020 වන විට වසරකට සිසුන් 100,000 කට විශ්වවිද්‍යාල වරම් ලබා දීමට කටයුතු කරමි.
- උසස් පෙළ සමත් සියලු සිසුන්ට උසස් අධ්‍යාපන අවස්ථා හිමිවන පරිදි රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතන (University Collage) ක්‍රමයක් රට තුළ ස්ථාපනය කරමි.
- නවකවදය අතීතයට පමණක් සීමා කොට ශිෂ්‍යයන්ට නිදහසේ අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ආරක්ෂා කරමි.
- විශ්වවිද්‍යාලයට ඇතුළුවන සෑම ශිෂ්‍යයෙකුටම නේවාසිකාගාර පහසුකම් හා ශිෂ්‍යත්ව හෝ මූල්‍යාධාර ලබා දීම සහතික කරමි.
- තෝරාගත් විශ්වවිද්‍යාල 7ක් ආසියාවේ ප්‍රමුඛ විශ්වවිද්‍යාල 20 අතරට ගෙන ඒම සඳහා අවශ්‍ය වැඩපිළිවලක් සකස් කරමි.
- විශ්වවිද්‍යාල සේවය සඳහා වෙනම සේවා ව්‍යවස්ථාවක් ඇති කරමි.
- විශ්වවිද්‍යාල ගම්මාන ක්‍රමය හරහා සෑම විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකුටම විශ්වවිද්‍යාල පවතින ප්‍රදේශයේම නිවසක ජීවත්වීමේ අයිතිය ලබා දෙන්නෙමි.
- විශ්වවිද්‍යාල ආචාර්යවරු ජාතික සංවර්ධනයට සක්‍රීය ලෙස දායක කරගැනීම සඳහා පර්යේෂණ කටයුතු වෙනුවෙන් නිසි ඇගයීමක් එකී ආචාර්යවරුන්ට ලබා දෙන්නෙමි.

- ජාතික පශ්චාත් උපාධි සරසවිය ආරම්භ කොට අලුතින් සේවයට එක්වන කථිකාචාර්යවරුන්ට ද ජාත්‍යන්තර කීර්තිය සහිත විශ්වවිද්‍යාලවල උපාධි ලබා ගැනීමේ අවස්ථාව උදා කරමි.

## උතුම් දිසාපාමොක් පරපුරට

- ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව 2015 දී ක්‍රියාත්මක කරමි. එමගින් මෙතෙක් ගුරුභවතුන්ට අදාළව උසස්වීම් සහ වැටුප් වර්ධක ආදිය පිළිබඳව පැවති සියලු ගැටලු නිමාවට පත් කරමි.
- තාක්ෂණික විෂයධාරාව ඉගැන්වීම් සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් නොපමාව ආරම්භ කරන අතර ඒ සඳහා ගුරුභවතුන් 2000 කට පුහුණුව ලබා දෙන්නෙමි.
- සියලුම ගුරු භවතුන් සඳහා පහසු මිලට ලැප්ටොප් පරිගණකයක් ලබා දීමට කටයුතු කරමි.
- සෑම ගුරු අත්පොතක්ම සංනිවේදන තාක්ෂණය මගින් පහසුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලස්වමි.
- ජපානය, මැලේසියාව, කොරියාව වැනි රටවල පුහුණුව ලැබීම සඳහා වාර්ෂිකව ප්‍රවීණතා මට්ටම අනුව ශිෂ්‍යත්ව ලබා දෙන්නෙමි.

# 9 නිරෝගීකම පරම ලාභයයි

සෞභාග්‍යයේ පදනම නිරෝගීමත් ජාතියයි. 2006 සිට සෞඛ්‍යය ක්ෂේත්‍රයට කරන ලද අතිවිශාල රාජ්‍ය ආයෝජන නිසා ග්‍රාමීය ප්‍රදේශවල පවා සෞඛ්‍ය සේවා වර්ධනය කළ පරිදිම ඉදිරි හය වසර ඇතුළත සංවර්ධිත රටවල සෞඛ්‍ය සාධන මට්ටමට සමාන සෞඛ්‍ය සේවාවක් ඔබට ලබා දෙන්නට මම බැඳී සිටිමි.

- රෝහල්වලට ඇදෙන ජනතාවක් වෙනුවට රෝහල් ගතවීම අවශ්‍ය නොවන්නාවූ ජනතාවක් බිහි කිරීමට කටයුතු කිරීමෙන් 2020 වන විට උපතේදී ආයු අපේක්ෂණය අවුරුදු 80 දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සලසන සෞඛ්‍ය සේවා පද්ධතියක් ගොඩ නගමි.

- 2020 දී ශ්‍රී ලංකාව ළදරු සහ මාතෘ මරණවලින් තොර රටක් බවට පත් කරන බව මම ආඩම්බරයෙන් කියමි.

- දිවි නැගුම යටතේ ගර්භනී මව්වරුන්ට මාස 9 පුරාම අප දැනට ලබා දෙන පෝෂණ මල්ලේ වටිනාකම රුපියල් 40,000 ක් පමණ වනු ඇත. එම වටිනාකමින් 50% මුදල් වශයෙන් ලබා දීම රජයට ඉතා වාසිදායක නමුත් ඊට වඩා මට වටින්නේ අපේ රටේ අම්මාවරුන්ගේ සහ උපදින්නට සිටින දරුවන්ගේ ආරක්ෂාවය. එබැවින් ගැබිණි මව්වරුන්ගේ පෝෂණ ආධාර වැඩසටහනක් අලුත උපන් දරුවන්ට වසරක් දක්වා ලබා දෙන පෝෂණ වැඩසටහන තව දුරටත් ශක්තිමත් කරමි.

- කාන්තා සහ ගර්භිනී මව්වරුන්ට සංවර්ධිත රටවල ලැබෙන ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබාදීමට අවශ්‍ය වන වෛද්‍යවරුනට විශේෂ පුහුණුව ලබා දීම සඳහා තුන් අවුරුදු විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- එම නව දැනුම භාවිත කිරීම සඳහා අවශ්‍ය උපකරණ සහ පහසුකම් සුදුසු ක්‍රමවේදයක් යටතේ ග්‍රාමීය රෝහල දක්වා ලබාදීමට කටයුතු කරමි.

- විවාහයට සූදානම් වන අවධියේ සිටම සෑම කාන්තාවකටම නිරෝගී දරුවෙකු බිහි කිරීම සහ ජීවිත අවදානම අවම කරගැනීම පිළිබඳ දැනුවත් කිරීමටම හැකිවන පරිදි උපාධිය දක්වා දැනුමෙන් ද සේවය ඉටු කිරීම සඳහා ඇවැසි සම්පත්වලින් ද පවුල් සෞඛ්‍ය සේවය පුළුල් කොට සවිබල ගන්වමි.

- සෑම පලාතකටම එක් ළමා රෝහලක් ඉදිකරමි. ඒ යටතේ ඉපදී මාස 3ක් ඇතුළත දරුවනට අනාගතයේදී ඇතිවිය හැකි මානසික ආබාධ සහ බිහිරිභාවය වැනි රෝග 30ක් හඳුනා ගැනීම සඳහා කරාපිටිය රෝහලේ දැනටමත් සිදුකර ඇති පර්යේෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ උපකරණ රොහල්වලට ලබා දෙන්නෙමි.

- පිළිකා, වකුගඩු රෝග සහ ඩෙංගු වැනි විශේෂිත රෝගාබාධයන් සඳහා සුවිශේෂී අංශයන්ගෙන් සැදුම්ලත් රෝහල් සංකීර්ණයක් බවට සෑම පළාතකම ප්‍රධාන නගරයේ පිහිටුවා ඇති ශික්ෂණ රෝහල පරිවර්තනය කරමි.

- මැලේරියාව, ජලභීතිකාව, කම්මුල්ගාය, රුබෙල්ලා, ලාදුරු, ක්ෂයරෝගය සහ බරවා යන රෝග හත සදාකාලයටම මේ භූමියෙන් තුරන් කිරීමට සෞඛ්‍ය පද්ධතිය දියුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කරමි.

- ඩෙංගු උවදුර සහමුලින්ම නැතිකිරීම සඳහා සක්‍රීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමි.

- මීට පෙර සේවය කළ සෞඛ්‍ය ඇමතිවරයෙකුටම, තම පරිගණකය තුළවත් ආරක්ෂාකර ගැනීමට නොහැකි වූ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සහ පනත සේනක බිබිලේ ප්‍රතිපත්ති වලට

අනුකූල වන ලෙස නැවත සමාලෝචනය කර කඩිනමින් අනුමත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි.

- අනුරාධපුර ශික්ෂණ රෝහලේ වකුගඩු ඒකකය සඳහා සියලු පහසුකම් සහිතව අසාධ්‍ය රෝගීන්ගේ ඥාතීන්ට නවාතැන් ගැනීම සඳහා "සහන සෙවණක්" ඉදිකරමි.

- සෑම වකුගඩු රෝගියෙකුටම මාස්පතා රුපියල් 3000ක ප්‍රතිකාර සහන දීමනාවක් ගෙවමි.

- නුවර, යාපනය, බදුල්ල, අම්පාර, කරාපිටිය, රත්නපුර සහ කුරුණෑගල යන රෝහල්වල පිළිකා ඒකක නවීන පහසුකම්වලින් අංගසම්පූර්ණ කරමි.

- රෝගීන් සඳහා මෙන්ම ඔවුන්ගේ වේදනාකාරී මානසිකත්වය සහ වෙහෙස මහන්සිය ද සැලකිල්ලට ගනිමින් පිළිකා රෝගී ඥාතීන්ගේ පහසුව සඳහා අංග සම්පූර්ණ සහන සෙවනක් මහරගම සහ ඉහත රෝහල් ආශ්‍රිතව පිහිටුවමි.

- නවීන වෛද්‍ය පහසුකම් සහිත අසාත රෝග පර්යේෂණ සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන නමයක් පළාතට එක බැගින් පිහිටුවමි. එම වැඩපිළිවෙල තුළ බටහිර සහ දේශීය වෛද්‍ය ක්‍රම ඒකාබද්ධව ප්‍රතිකාර ක්‍රම හඳුන්වා දීම සඳහා පර්යේෂණ සහ නියමු ව්‍යාපෘති දිරිමත් කරමි.

- සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම එකක් බැගින් ගමේ ආගමික මධ්‍යස්ථානය කේන්ද්‍රගත කරගෙන "ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථානයක්" ගොඩනගමි.

- වෛද්‍ය උපාධිධාරීන් හට උපාධියෙන් පසු පශ්චාත් උපාධි විශේෂඥ දැනුම ලබා ගැනීමට වූ අඩුව නිසා එය සපුරාලීමට පේරාදෙණිය, යාපනය සහ රුහුණු විශ්වවිද්‍යාලවල අලුත් පසු විශේෂඥ පුහුණුවක් ලබා දීමට කටයුතු කරමි.

- කඨිනම් උසස්වීම්, විශේෂ දීමනා දුෂ්කර පලාත්වල සේවය කරන වෛද්‍යවරුන්ට ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කරමි.

- හෙදියන් සහ සෞඛ්‍ය සේවා උපාධිධාරීන් සඳහා විශ්වවිද්‍යාල උපාධි වැඩසටහන් තවදුරටත් පුළුල් කරන අතර ඒ අය සඳහා පශ්චාත් උපාධි අවස්ථාවන් ද ලබාදීමට කටයුතු කරමි.

## දසදෙස විස්කම් පෑ හෙළ වෙද පරපුරේ පුනරාගමනය

දේශීය වෙද පරපුර අදත් ලොව මවිත කරන විස්කම් වෙදකමේ යෙදෙති. අද මුළු ලෝකයේම අවධානය දේශීය වෙදකම දෙස යොමුවී ඇති මොහොතේ අපේ දස්කම් ලෝකයට පෙන්වීමට කාලය උදාවී තිබේ.

- සීමාවාසික පුහුණුව සපුරා ඇති සියලුම දේශීය වෛද්‍යවරුන් දේශීය වෛද්‍ය සේවයට බඳවා ගන්නෙමි.

- දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම සහ ඖෂධ පිළිබඳව පර්යේෂණ පුළුල් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක ජාතික පර්යේෂණ මධ්‍යස්ථානය උසස් මට්ටමට දියුණු කරමි.

- දැනට ක්‍රියාත්මක වන දේශීය වෛද්‍ය ප්‍රජා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වර්ධනය කිරීම සඳහා සහ දේශීය වෛද්‍ය දැනුම් පද්ධතියට අදාළ බිම් මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා නායකත්වය ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට දේශීය වෛද්‍යවරුන් තුන් දෙනෙකු බැගින් පත් කරනු ලැබේ. ඒ සඳහා ක්‍රමානුකූලව උපාධිධාරී දේශීය වෛද්‍යවරුන් 1000 දක්වා බඳවා ගැනීමට උපදෙස් දෙමි.

- අපනයන ප්‍රමිතියෙන් යුත් භාවිතයට පහසු දේශීය ඖෂධ මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ වශයෙන් නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා සහන පොලිය යටතේ රුපියල් මිලියන පහක ණය මුදලක් එකී නිෂ්පාදකයන්ට ලබා දීමට කටයුතු කරමි.

- දේශීය සහ විදේශීය ආයුර්වේද ප්‍රතිකාරලෝලීන්ට ගැළපෙන නවීන පහසුකම්වලින් යුත් පෞද්ගලික ආරෝග්‍යශාලා ආරම්භ කිරීම කැමති දේශීය වෛද්‍යවරුන් සහ ව්‍යවසායකයින් සඳහා බටහිර වෛද්‍ය ආයතනවලට ලබාදෙන සියලුම බදු සහන ලබා දෙන්නෙමි.

- පාරම්පරික දේශීය වෛද්‍යවරුන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීම සඳහා ස්ථිර විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කරමි.

- සම්ප්‍රදායික දේශිය වෛද්‍යවරුන් ලෙස ග්‍රාමීය මට්ටමෙන් සේවය කරන වෛද්‍යවරුන්ට වැඩි දුර අධ්‍යාපනය සහ ලියාපදිංචිය ලබා දීමේ පහසු ක්‍රමයක් හඳුන්වා දෙමි.

- රාජ්‍ය සේවය තුළ බටහිර වෛද්‍යවරුන් සහ දේශීය වෛද්‍යවරුන් අතර වරප්‍රසාද ආශ්‍රිතව පවතින අසමානතා අවම කිරීම සඳහා පියවර ගනිමි.

- වතු ආශ්‍රිත දිස්ත්‍රිකවල සහ උතුරු හා නැගෙනහිර පළාත්වල දිස්ත්‍රිකයට එක බැගින් ආයුර්වේද රෝහල් විවෘත කරමි.

## වතුකරයට නිරෝගය

- අඩු වයසින් විවාහ කිරීම සහ ගැබ් ගැනීම, මන්දපෝෂණය සහ නීරක්තිය වතුකරයේ මූලික සෞඛ්‍ය ගැටලු බව මම දනිමි. එබැවින් මෙම තත්වයන් වැළැක්වීම සඳහා දෙමළ භාෂාව කතා කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් 500 ක් අලුතින් බඳවා ගැනීමට කටයුතු කරමි.

- මෙම ජනතාවට සුවිශේෂ වූ සෞඛ්‍ය ගැටලු හඳුනාගෙන ප්‍රජා සත්කාරයේ යෙදීම සඳහා අවශ්‍ය විශේෂ පුහුණුවක් එම

ප්‍රදේශවල සේවය කරන සියලුම ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන්ට ලබා දීමට කටයුතු කරමි.

- වතු රෝහල් සඳහා අවශ්‍ය ගිලන් රථ, නවීන වෛද්‍ය උපකරණ සහ බෙහෙත් හේත් ප්‍රමාණවත්ව සහ අඛණ්ඩව ලබාදීමට කටයුතු කරමි.

# 10 දීර්ඝායු පිණිස ක්‍රීඩා

නිරෝගිමත් අනාගත පරපුරක් බිහිකිරීම සඳහා මෙතෙක් තරුණයන්ට පමණක් යැයි සිතා සිටි ක්‍රීඩාව සෑම පුරවැසියෙකුගේම ආකර්ෂණයට ලක්වෙන අයුරින් නඟා සිටුවීම හොඳම අනාගත ආයෝජනය බව මගේ විශ්වාසයයි.

- ආසියාවේ ක්‍රීඩාවෙන් පුමුඛ රටක් බවට පත්වීම ඉලක්ක කරගෙන පදක්කම් දිනිය හැකි ඉසව් 6 ක් මුල්කර ක්‍රීඩාව අංශ 46 ක් යටතේ කෙටි, මධ්‍යකාලීන හා දිගුකාලීන සංවර්ධන වැඩපිළිවෙළක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමි.
- සෑම දරුවෙකුටම ක්‍රීඩාව අනිවාර්ය සහ ආකර්ෂණීය විෂයක් බවට පත් කරන අතර ක්‍රීඩාංගණයක් නොමැති සෑම පාසලකටම ප්‍රමිතියකින් යුත් ක්‍රීඩාංගණයක් ලබා දීමට කටයුතු කරමි.
- ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පුහුණු පාසලක් ආරම්භ කරන අතරම 2005 වසරේ කැළණි විශ්වවිද්‍යාලයේ ආරම්භ කරන ලද ක්‍රීඩා උපාධි විෂයක් ලෙස ඉගැන්වීමේ වැඩසටහන පුළුල් කොට ක්‍රීඩා කටයුතු පිළිබඳ වෙනම අධ්‍යයන අංශයක් ආරම්භ කිරීමට කටයුතු යොදමි.
- ජාතික වාර්තා පිහිටුවමින් ජාත්‍යන්තර තලයට පිවිස සිටින සෑම ක්‍රීඩක ක්‍රීඩිකාවකටම මාසිකව රුපියල් 25000 ක දීමනාවක් ලබා දෙන්නෙමි.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පත්කර ඇති ක්‍රීඩා නිලධාරීන්ගේ සේවය නිසි පරිදි ලබාගැනීම සඳහා සහන මිල මෝටර් බයිසිකලයක් ලබාදීමට කටයුතු කරමි.
- අඩුපහසුකම් සහිත සියලු ක්‍රීඩාංගණ නවීකරණය කරන අතර සෑම දිස්ත්‍රිකයකටම ගෘහස්ත ක්‍රීඩා පිටියක්, පිහිනුම් තටාකයක් සහිත අංග සම්පූර්ණ ක්‍රීඩා පිටියක් ඉදිකරමි.





- දේශීය පුහුණුකරුවන්ට ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවල ක්‍රීඩා තාක්ෂණය, ක්‍රීඩා කළමණාකරණ විද්‍යාව පිළිබද උසස් දැනුමක් ලබා දීම සඳහා විදේශ පුහුණුකරුවන්ගේ හා විදේශීය ක්‍රීඩා පුහුණු ආයතනවල සේවය ලබා දීමට කටයුතු කරන අතරම තමා නියැළෙන ක්‍රීඩාවට අදාළව උසස් අධ්‍යාපනයක් ලබා දීමට ද කටයුතු කරමි.

- ක්‍රීඩාව ඉලක්ක කරගත් ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීමට පියවර ගන්නෙමි.

- ක්‍රීඩා උපකරණ හා ඇඳුම් පැළඳුම් නිර්මාණය කිරීමේ කර්මාන්ත සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයින් දිරිගැන්වීම සඳහා ඔවුනට රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන්නෙමි.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක ශාරීරික සුවතා මධ්‍යස්ථාන 331 ක් ආරම්භ කිරීමටත් නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල රජයේ සේවකයන් සඳහා ශරීර සුවතා මධ්‍යස්ථාන පිහිටුවීමටත් පියවර ගන්නෙමි.

- නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බැඩ්මින්ටන්, ටෙනිස්, වොලිබෝල් සහ පාපන්දු ක්‍රීඩා සඳහා පහසුකම් ලබා දීමටත් කටයුතු කරමි.

# 11 යසෝදරා පරපුරට පොහොසත් හෙට දවසක්

අප ශිෂ්ටාචාරයේ පැවැත්ම ඓතිහාසිකව රඳා පැවතියේ යශෝදරා පරමාදර්ශය සහිත උතුම් කාන්තා පරපුර මත යැයි මම විශ්වාස කරමි. අප රටේ මිනිස්කම සහ ශිෂ්ටාචාරය ආරක්ෂා වූයේ දරුවන් උපන් තැන් සිට නිදිවරා ඔවුන් ලෙඩට දුකට පත්වන්නට නොදී රකිනා, හේනේ කුඹුරේ වෙහෙසෙනා, වතුකරයේ තේ දළු ටික නෙළනා, ඇඟළුම් කම්හලේ, මැද පෙරදිග සේවයේ යෙදෙනා සිහළ, දමිළ, මුස්ලිම්, මැලේ, බර්ගර් උතුම් කාන්තා පරපුර නිසාය. යශෝධරා පරපුරේ මව්වරුන් නොවන්නට උපන් බිම රකිනා සිත් ඇති සෙබළ පරපුරක් රටට හිමිවන්නේ නැති බව මම දනිමි.

- සංවර්ධනයේ ප්‍රතිඵල නිසා ඉතිරි වන දරට, වතුරට, ඉයුම් පියුමට වැය කළ යුතුව තිබූ අතිරේක කාලය මුදල් බවට පත්කළ හැකි ගෘහස්ත ආර්ථික වැඩපිළිවෙළක් බිම් මට්ටමේ සිට සකස් කරමි.

- කාන්තා ව්‍යවසායකත්වය වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රාදේශිය බැංකුව මගින් වසරකට කාන්තාවන් 50,000 කට තමන්ගේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා සහන පොලියට ණය ලබා දෙමි.

- තරුණ මව්වරුන් රැකියාවල නියුතුවීම දිරිගැන්වීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම දිවා සුරැකුම් මධ්‍යස්ථානය බැගින් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ආයෝජනය නිසි පුහුණුව සහ දැනුම ලබා දෙන්නෙමි.

- සෑම ආයෝජන කලාපයකම කාන්තා උපදේශන මධ්‍යස්ථානය බැගින් ආරම්භ කර එම මධ්‍යස්ථානය තුළ එම කලාපයේ සේවයේ නියුතු කාන්තාවන්ට අවශ්‍ය උපදේශනය, මග පෙන්වීම සහ රැකවරණය ලබාදෙන්නෙමි.

- නුපුහුණු කාන්තාවන් විදේශ රැකියා සඳහා යොමු කිරීම නතර කරමින් පුහුණු පිරිමි ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා දිරිමත් කිරීම මගින් කාන්තාවන් රැකියා සඳහා විදේශගත වීම නිසා ඇති වන පවුල් ගැටලු අවම කරමි.

# 12 තුරුණු හෙටක් පිරුණු රටක්

එක් කලෙක මේ රටේ තරුණ ප්‍රජාව මුළුමනින්ම අත්හැර දමා සිටීමේ ප්‍රතිඵලය වූයේ ඔවුන් ප්‍රචණ්ඩ දේශපාලනට නැඹුරුවීමෙන් ලක්ෂ ගණනාවක් මරණයට පත්වීමය. ඒ දරුවන්ගේ මව්පියන්ගේ සෝසුසුම් තවමත් මේ වාතලයේ සැරිසරන බව මම දනිමි. 2005 සිට තමන්ට අනාගතයක් ඉල්ලා ලක්ෂ විස්සකට වැඩි තරුණ පරපුරක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානය වූ නිල් පවුරේ හැපෙමින් සිටින්නේ ඒ අඳුරු අතීතයට යළි ගමන් කිරීමට අකමැති නිසා බව මම දනිමි. ඒ තරුණ පරපුරට ජාතික අභිමානයෙන් හදවත පුරවාගෙන ජවසම්පන්නව නැඟීසිටීමට හැකි රටක් මම උරුමකර දෙන්නෙමි.

## හැකියාව සහ රැකියාව

- පාසැලට වාර්ෂිකව ඇතුළු වන දරුවන් 340,000 ක් අතුරින් විශ්ව විද්‍යාලයට ඇතුල් වීම සඳහා සුදුසුකම් ලබන්නේ 25,000 ක් පමණි. තුන් ලක්ෂයකට අධික ඉතිරි දරු පිරිසකගේ අනාගතය පියෙකු සේ මම වගකීමෙන් භාර ගන්නෙමි. වෘත්තීය සහ කාර්මික අධ්‍යාපනය ඔස්සේ උපාධිධාරියෙක් වීම දක්වා වූ අධ්‍යාපනයේ හිණිමඟක් ඔවුනට තනා දෙමි.

- ඒ අනුව රාජ්‍ය නොවන අංශ සමගද එකතුව වසරකට 250,000 ක් දරුවන්ට වෘත්තීය අධ්‍යාපනය ලබා දීම සඳහා වූ ජාතික වැඩපිළිවෙල සක්‍රීය කරමි.

- කිසියම් ආර්ථික ප්‍රශ්නයකට ගොදුරුව අධ්‍යාපනය සමග පොරබදන දූ දරුවන් වෙනුවෙන්ම තරුණ සංවර්ධන අරමුදලක් පිහිටවීම සඳහා නිපුණතා සංවර්ධන අරමුදලක් ශක්තිමත් කරමි.

- දැනට මැද පෙරදිග කලාපය කේන්ද්‍රීව ක්‍රියාත්මක විදේශ රැකියා වෙළඳ පොළ යුරෝපය, උතුරු ඇමරිකාව හා ඔස්ට්‍රේලියා මහා

ද්වීපය වෙත පතුරුවාලීම සඳහාම විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථාන 20 ක් නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය සමග එක්ව පිහිටුවමි.

- දැනට ස්වයංරැකියාවන්හි කටයුතු කරන පෙදරේරු දැව කාර්මික රූපලාවන්‍ය ශිල්පී වැනි අවිධිමත් ක්ෂේත්‍ර වෙත කර්මාන්ත ගුණය ලබා දීම වෙනුවෙන් පෙර දැනුම පිරික්සීමේ ක්‍රමය (PRL) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) ස්ථාපනය කොට වෘත්තීය අධ්‍යාපනය ජයටැඹ කරා රැගෙන යමි

- කෝටි සංඛ්‍යාත මුදල් වැය කරමින් විදේශ අධ්‍යාපනය සඳහා යොමු වන දස දහස් සංඛ්‍යාත ශ්‍රී ලාංකේය දූ පුතුනට ශ්‍රී ලංකාව තුළදීම ජාත්‍යන්තර උපාධි ලබා ගැනීම සඳහා දකුණු ආසියාවේ ප්‍රථම හරිත සරසවිය වන NSBM සරසවිය වඩාත් පුළුල් කොට ලොව ගෞරවනීය විශ්ව විද්‍යාල සමග අනුබද්ධ කරමි.

- 2005 දී මා බලයට පත් වන විට 5% ක්වූ පරිගණක සාක්ෂරතාව අද 42% දක්වා ඉහල දැමීමටද රතුගල වැනි ආදී වාසී ජනපද වලට පවා තොරතුරු තාක්ෂණ විද්‍යාගාර ලබා දීමටද මම කටයුතු කළෙමි. 2020 දී පරිගණක සාක්ෂරතාව 90% දක්වා වැඩි කිරීමට සැලසුම් කරමි. එමෙන්ම එකී දියුණු තාක්ෂණය නගරයට පමණක් සීමා නොකොට තරුණ ප්‍රජාව ප්‍රමුඛ සියළු පුරවැසියන්ට අයිතියක් ලෙස නිදහසේ අන්තර්ජාලයේ සැරිසැරීමට අවකාශ ලබා දෙමි.

- ඉදිරි වසර 5 ඇතුළත භෞතික සම්බන්ධතාවයකින් තොරව අවකාශයේ විසිරෙන තරංග මගින් අන්තර්ජාලයට පිවිසීම සඳහා මුළු රටම දකුණු කොරියාව මෙන්ම "හොට්ස්පොට්" එකක් බවට පත් කිරීම මගේ අරමුණයි.

- ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුව ශ්‍රී ලංකා දේශපාලන ධූරාවලියේ සුවිශේෂී මෙන්ම පරමාදර්ශී ආයතනයක් ලෙස ගොඩනගා එයට අවශ්‍ය පිළිගැනීමද ගෞරවයද ලබා දෙමි.

## තරුණයින්ට රැකියා පන්ලක්ෂයක්

- රාජ්‍ය සේවය පුළුල් කිරීම, රාජ්‍ය කේන්ද්‍රීය කර්මාන්ත, පුළුල් වන බැංකු ක්ෂේත්‍රය, සංචාරක කර්මාන්තය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ඇසුරෙන් ඉදිරි වසර පහ තුළ තරුණයින්ට රැකියා ලක්ෂ 5 ක් නිර්මාණය කරමි.

- රැකියා පුරප්පාඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් හඳුනාගෙන රැකියා අපේක්ෂිත තරුණ තරුණියන්ට ගොනුගත කරගැනීම සඳහා "අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රැකියා බැංකුවක්" ස්ථාපනය කරමි.

- උසස් පෙළ ජීවවිද්‍යා විෂය ධාරාව හැදෑරූ තරුණ තරුණියන් 15,000ට මනෝ උපදේශනය, ප්‍රථමාධාර සේවය, සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග නිවාරණය පිළිබඳ නිසි වෘත්තීය පුහුණුවක් ලබාදීමෙන් "ප්‍රජා සෞඛ්‍යය සහායක" තනතුරු ලබා දෙන්නමි.

## තරුණ ව්‍යවසායකත්වයට අතහිත

- තරුණ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කොට "තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන මණ්ඩලයක්" ස්ථාපනය කරමි.

- අවුරුදු 18-35 අතර තරුණයින් සඳහාම තාරුණ්‍යයට සීමා වූ "තරුණ බැංකු ක්‍රමයක්" ආරම්භ කරමි. ඒ යටතේ ව්‍යවසායකත්වයට, අධ්‍යාපනයට සහ වෘත්තීය පුහුණුව දිරිගැන්වීම සඳහා ලක්ෂ 10 දක්වා අඩු පොළී ණය පහසුකමක් ලබා දෙන්නෙමි.

- අපනයන බෝග වගාවට සහ සත්ව පාලනයට කැමති තරුණ තරුණියන්ට දීර්ඝකාලීන බදු ක්‍රමයක් යටතේ ඉඩම් ලබාදී මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් 15,000 ක් බිහිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමි. ඒ යටතේ කෘෂි සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ද ආයෝජන දිරිගන්වමි.

- ඒ සඳහා අවශ්‍ය ලක්ෂ විසිපහක ණය මුදලක් අවුරුදු තුනක ගෙවීම් රහිත කාලයක් සමඟ අඩු පොළියට ලබා දෙන්නෙමි. ඒ සඳහා අවශ්‍ය දැනුම පුහුණුව සහ සම්බන්ධීකරණය රාජ්‍ය මැදිහත්වීමෙන් ලබා දෙන්නෙමි.

- ග්‍රාමීය නිෂ්පාදන එකතු කිරීම, ප්‍රවාහනය සහ බෙදා හැරීම සඳහා සෑම ගමකටම එක් තරුණ සැපයුම්කරුවෙක් බිහිකිරීම සඳහා කුඩා ප්‍රමාණයේ ලොරි රථයක් මිලට ගැනීම සඳහා අඩු පොළී ණයක් තරුණ බැංකුව හරහා ලබාදෙන්නෙමි. ඔවුන්ගේ භාණ්ඩ මිලට ගැනීම සඳහා එම ප්‍රදේශවල ඇති හමුදා කඳවුරු සහ රෝහල් වැනි රාජ්‍ය ආයතනවලට සැපයීම් කොන්ත්‍රාත් ලබා දෙන ක්‍රමයක් සකස් කරමි.

- කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයට විධිමත්ව තාක්ෂණය භාවිතය සහිත තරුණ ව්‍යවසායකයින්ට අනුග්‍රහයන් ලබා දෙන්නෙමි.

- භාණ්ඩ නිෂ්පාදනය, එකලස් කිරීම සහ අගය එකතු කිරීමේ කර්මාන්ත සඳහා ඉදිරිපත් වන තරුණ ව්‍යවසායකයන් තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේඛණගත කර ඔවුන්ගේ නිෂ්පාදන රාජ්‍ය ආයතන සඳහා මිලදීගැනීමේ ක්‍රමවේදයක් සකස් කරමි.

- මැටි, පිත්තල, ස්වර්ණාභරණ ඇතුළු හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ යුගයේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි නව නිර්මාණාත්මකව අගය එකතු කිරීමෙන් වෙළඳපොළට නිෂ්පාදන ඉදිරිපත් කිරීම උදෙසා තරුණ ව්‍යවසායකයින්ට අවශ්‍ය නූතන ක්‍රමවේද, නවීන තාක්ෂණය සහ අනෙකුත් පහසුකම් ලබා දෙන්නෙමි.

- නව නිර්මාණාත්මක සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් මගින් තරුණ ව්‍යවසායකයන් සඳහා සංචාරක කර්මාන්තය තුළ අලුත් අවස්ථා නිර්මාණය කරමි. විශේෂයෙන්ම කෘෂිකාර්මික සංචාරක කර්මාන්තය තුළ කුඩා සහ මධ්‍යම පරිමාණ ආයෝජන කිරීම සඳහා තරුණයින් දිරිමත් කරමි.

- සංගීත ක්ෂේත්‍රයේ තරුණ කලාකරුවන්, තරුණ සිනමාකරුවන් හා වේදිකා නාට්‍ය නිර්මාණකරුවන් සඳහා නව නිර්මාණ එළිදැක්වීමට තරුණ බැංකුව හරහා රුපියල් මිලියනයක් දක්වා ණය පහසුකම් ලබාදෙන්නෙමි. එසේම ඔවුනට පළාත් පාලන ආයතන සහ රාජ්‍ය ආයතන සතු රංග ශාලා සහන මිලට ලබා ගැනීමට ඉඩ සලසමි.

- තරුණ සිනමාවේදීන්හට අවස්ථාව ලබාදීම සඳහා නවතම සිනමා ප්‍රදර්ශන මණ්ඩලයක් ස්ථාපිත කරමි.

- තොරතුරු තාක්ෂණ නගරයක් මුලතිව්වල ස්ථාපනය කිරීමෙන් උතුරේ තරුණයන්ගේ තොරතුරු තාක්‍ෂණික දැනුම නංවාලමි. තරුණ ව්‍යවසායක සංගම්වල ඉල්ලීම පරිදි වෙනත් ප්‍රදේශවල ද එවැනි නගර ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරමි.

- දේශීය ආහාර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම මගින් නව ආහාර වෙළඳපොළක් ඇති කිරීමට සහ එම අවස්ථා ලබා ගැනීම සඳහා තරුණ තරුණියන් දිරිගැන්වීමට කටයුතු කරමි. සියලුම පාසල් සහ රාජ්‍ය ආයතනවල ආහාර සැපයීමේ කොන්ත්‍රාත් කුඩා පරිමාණ දේශීය ආහාර නිෂ්පාදකයින් වෙත ලබා දීම සඳහා පරිපාලන නීති සහ ක්‍රමවේද හඳුන්වා දෙමි.

- විවෘත ආර්ථිකය විසින් නන්නත්තාර කරන ලද යෞවනය බොහෝ විට නතර වූයේ මත්පැන් සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙනි. එවැනි තරුණයන් පුනරුත්ථාපන කිරීම සඳහා ආගමික සිද්ධස්ථාන කේන්ද්‍රකරගෙන අධ්‍යාපන සහ උපදේශන මධ්‍යස්ථාන ස්ථාපනය කරමි.

- ළමා අපරාධකරුවන් වශයෙන් සිරගතව දීර්ඝ කාලයක් ගතකර සිටින තරුණයින් සමාජයට වෛරකරන පිරිසක් ලෙස සමාජගතවීම වැළැක්වීම සඳහා නිසි විශෝධන ක්‍රමවේදයක් සහිත පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් පිහිටුවන්නෙමි.

# 13 ගමනට සුවපහසුව

පොදු ප්‍රවාහනය පිළිබඳව මා කවදත් සිතන්නේ පොදු මගියාගේ මනසිනි. ත්‍රස්තවාදීන් විසින් බෝම්බ පුපුරුවා පීළි ගලවාගෙන යාමෙන් පසුව තිස්වසරක් තිස්සේ නතර වී යාල්දේවී අභිමානයෙන් ඇගේ දෙවන ගමන අරඹා තිබේ. මම එහි නැඟී යාපනයට යන විට මඟ දෙපස රැස්ව සිටි ලක්ෂ සංඛ්‍යාත ජනයාගේ හදවත් හී නැගුණු ප්‍රීතිය ඔවුන්ගේ මුහුණු පුරා පැතිරුණු සිනාවෙන් හඳුනා ගතිමි. සුපිරි රියෙන් යන තැනැත්තා හා සමානව පොදු මගියාට ද සුවපහසුවෙන් යාම් ඊම් කළ හැකි ප්‍රවාහන සේවාවක් මම ස්ථාපනය කරමි.

- 2018 දී කොළඹ සිට කතරගමට සුවපහසුවෙන් යා හැකි වායුසමනය කළ ලංකාවේ ප්‍රථම විදුලි දුම්රිය ධාවනය කරවමි.
- යාපනයේ නල්ලූර් කන්දසාමි දේවාලය, ත්‍රිකුණාමලයේ කොනේෂ්වරන් දේවාලය, හලාවත මුන්නේෂ්වරම් දේවාලය සහ දෙවුන්දර උපුල්වන් දේවාලය යන සිව්කොන් දේවාල වන්දනාවට පහසුවෙන් යාහැකි පරිදි කතරගම දුම්රිය මාර්ගය ත්‍රිකුණාමලය දක්වා දිගු කරමි.
- කුරුණෑගල සිට හලාවත දක්වා හරස් දුම්රිය මාර්ගයක් ඉදිකරමි.
- මඩකලපුවේ සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමට ද කටයුතු කරමි.
- කොළඹ සිට කටුනායක ගුවන්තොටුපළ තුළටම සහ මාතර සිට මත්තල ගුවන්තොටුපළටම ඕනෑම මොහොතක යාහැකි වන පරිදි නවීන දුම්රිය සේවාවක් ස්ථාපනය කරමි.
- පාසල් සිසුන්ගේ පහසුව සඳහා "සිප් සැරිය" නමින් පාසල් දුම්රිය සේවාවක් ආරම්භ කරමි. උදේ සවස සෑම දුම්රියකම

පාසල් මැදිරියක් හෝ දෙකක අවශ්‍යතාවට ගැළපෙන පරිදි වෙන්කරමි.

- අපට අවශ්‍ය සුව පහසු බස් රථ අපේ රටේම නිෂ්පාදනය කිරීම සඳහා එම කර්මාන්තයට යොමුවීමට කැමති ව්‍යාවසායකයන්ට අවශ්‍ය ඉඩම්, බදු සහන සහ මූල්‍ය ආයෝජන පහසුකම් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

- ප්‍රධාන නගර ආශ්‍රිතව පවතින මාර්ග තදබදය පොදු ප්‍රවාහන සේවයෙන් රාජකාරියට යන එන අයගේ මානසික ආතතිය ඉහළ නංවන බවත් එය මිත්‍රශීලී මහජන සේවයක් සැපයීමට ඔවුනට ඇති අභ්‍යන්තර මානසික බාධාවක් බවත් මම සිතමි. එම නිසා නගරාශ්‍රිත විශේෂ ප්‍රවාහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමි.

- ඒ යටතේ කොටහේන මට්ටක්කුලිය හරහා මාලබේ සිට කැළණියට "මොනෝ දුම්රිය සේවාවක්" ඉදිරි අවුරුදු තුන ඇතුළත ක්‍රියාවට නංවමි.

- මොරටුවේ සිට කොළඹ දක්වා බස් ප්‍රවාහනය සඳහා "වෙනම මං තීරු දෙකක්" වෙන් කරමි.

- කොළඹ නුවර අධිවේගී මාර්ගයේ නුවර ඉම වන ගුහාගොඩ සිට තැන්නේකුඹුර දක්වා ප්‍රධාන නගරයේ තදබදයෙන් මිදී ගමන් කල හැකි වන අයුරින් "කි. මී. 6.6 දිගින් යුත් ලංකාවේ පළමු උමං මාර්ගය" 2018 වන විට ඉදිකර අවසන් කරමි.

- වායු දූෂණය අවම කිරීම සඳහා විදුලි මෝටර් රථ භාවිතය ප්‍රචලිත කිරීමට පියවර ගන්නා අතර විදුලි ආරෝපණ මධ්‍යස්ථාන රටපුරා පිහිටුවීමට පියවර ගන්නෙමි.

- කොළඹ කොටුව, කොට්ටාව අධිවේගී මාර්ග මංසන්ධිය, මහනුවර, කුරුණෑගල සහ අනුරාධපුරය ඇතුළු නගර පණහක "නූතන ප්‍රවාහන කේන්ද්‍ර ක්‍රමයක්" ඇති කරමි. එහි ඇති ප්‍රතිඵලය

නම් දුම්රිය නැවතුම, රජයේ සහ පෞද්ගලික බස් නැවතුම් පොළ, ත්‍රීරෝද රථ නැවතුම, කුලී රථ නැවතුම සහ පෞද්ගලික වාහන නැවතුම් අංගනයක් ද එකම ස්ථානයක පිහිටුවීමෙන් මහමග රස්තියාදු නොවී වඩා පහසු සහ කාර්යක්ෂම සේවයක් ජනතාවට හිමිවනු ඇත.

- නවීන කඩ සාප්පු, ආපන ශාලා, විවිධ සේවා සැල් සහ කුඩා සිනමා ශාලාවක්, නාන තටාකයක් සහ ළමා ක්‍රීඩා මධ්‍යස්ථානයක් සහිත "ස්මාට් ආකේඩ්" 50 ක් මෙම ප්‍රවාහන කේන්ද්‍රය ආසන්නයේම ඇති කරමි.

## රිය අනතුරු අවම රටක්

- යමෙක් අකාලයේ මියගිය පසුව පවුලේ සාමාජිකයනට දැනෙන වේදනාවත් ජීවිත කාලය පුරාවටම එම පවුල්වලට මුහුණ දීමට සිදුවන අප්‍රමාණ දුෂ්කරතාවනුත් මම දනිමි. 2020 වන විට රිය අනතුරක් යනු ඉතාමත් විරළ සිදුවීමක් බවට පත් කිරීමට අරමුණු කර ගන්නෙමි.

- රියදුරන් මාර්ග නීති අකුරට පිළිපදින සහ නිසි විනයෙන් යුතු රියදුරන් බවට පත් කිරීම සඳහා "ජාතික ප්‍රවාහන පුහුණු කේන්ද්‍රයක්" වහාම පිහිටුවමි.

- රියදුරු වෘත්තිය පහත් රැකියාවක් යන සමාජ මතය වෙනස් කිරීමට සහ එම වෘත්තිය සඳහා අවශ්‍ය සමාජ වටිනාකම එක් කිරීමේ වගකීම ද එම පුහුණු කේන්ද්‍රයට පවරමි.

- සංවර්ධන ක්‍රියාදාම වේගවත්වීමත් සමඟ බරවාහන රියදුරන්ට හොඳ ඉල්ලුමක් ඇතිවී තිබෙන බැවින් මනා පෞරුෂයකින් යුත් බර වාහන රියදුරන් ලෙස තරුණයින් මෙම රැකියාවට යොමුකිරීම සඳහා වෘත්තීය බරවාහන රියදුරු පාඨමාලාවක් ආරම්භ කරමි.

- රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියා සඳහා රියදුරන් බඳවා ගැනීමේදී ජාතික ප්‍රවාහන අධිකාරියේ යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටීම අනිවාර්ය කරමි.

- නවක රියරන් අතින් සිදුවන අනතුරු අවම කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අලුතින් නිකුත් කරන සෑම රියදුරු බලපත්‍රයක්ම වසරක පරිවාස කාලයකට යටත් කරමි.

- රිය අනතුරුවලින් ගෘහ මූලිකයින් මිය යාම නිසා අසරණභාවයට පත්වී සිටින පවුල්වල ගෘහ මූලිකා විසින් ලබා ගෙන ඇති නොගෙවා පවතින නිවාස ණය සඳහා අයකරනු ලබන දඩපොලිය සම්පූර්ණයෙන් කපා හැරීමටත් ඉතිරි මුදල අලුත් ණයක් ලෙස පවුලේ වෙනත් සාමාජිකයෙකුගේ නමට හැරවීමටත් සියලුම රාජ්‍ය බැංකුවලට නියෝග කරමි.

- රිය අනතුරු නිසා සදාකාලික අබ්බගාත භාවයට පත්වී සිටින්නන් වෙනුවෙන් මසකට රුපියල් 3000ක ආධාර මුදලක් පිරිනමමි.

- එම පවුල්වල ඉගෙනුම ලබන දරුවන් සඳහා ශිෂ්‍යාධාර මුදලක් ගෙවීමට ද අධ්‍යාපන අමාත්‍යාංශයට උපදෙස් දෙන්නෙමි.

## මහමඟ රස්තියාදුව වළකමු

- රථවාහන වැරදි වෙනුවෙන් උසාවි යන්නට සැලැස්වීම මගින් වැඩ කරන්නට ඇති පැයවලින් වැඩිහරියක් උසාවි ගානේ රස්තියාදු වෙමින් ගෙවා දමන්නට සිදුවන බව මම දනිමි. එබැවින් අදාළ දඩ මුදල් ජංගම දුරකතනයෙන් SMS මගින් ගෙවීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන නොපමාව සලසා දෙන්නෙමි.

- මරණීය හෝ තුවාල සිදුනොවන රිය අනතුරු සඳහා රක්ෂණ මුදල් ලබා ගැනීම පිණිස සහ උසාවි ගානේ රස්තියාදුවීම වැළැක්වීම සඳහාත් සුළු නඩු විසඳීම සඳහාත් ප්‍රජා උසාවි ක්‍රමයක් ස්ථාපනය කරමි. යමෙකු ප්‍රජා උසාවි තීන්දුවට එකඟ නොවේ නම් ඉහළ අධිකරණයට යාමේ අවස්ථාව හිමිවනු ඇත.

- වාහන ලියාපදිංචිය, බලපත්‍ර අලුත් කිරීම හෝ රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට කොළඹටම පැමිණීමෙන් ඔබට සිදුවන හිරිහැරය මම දනිමි. එසේ අපතේ යන්නේ රට වෙනුවෙන් වැඩ කිරීමට ඔබට ඇති වටිනා කාලයයි. එබැවින් ඉහත සේවාවන් පළමුව සෑම දිස්ත්‍රික් කාර්යාලයකින්ම ද පසුව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් ද ලබා ගත හැකි තත්ත්වයක් ඇති කරමි.

- පළාත් සභාවන්ට අයවිය යුතු බලපත්‍ර ගාස්තු ඇතුළු සෑම ගෙවීමක්ම අන්තර්ජාල පහසුකම් ඉටුකිරීමට හැකිවන පරිදි ප්‍රවාහන අමාත්‍යාංශයේ සියලු කටයුතු පරිගණකගත කරමි.

- පාසල් සිසුනට හා රජයේ සේවකයින්ට තමන්ගේ දුම්රිය හෝ බස්රථ සීසන්පත ලබා ගැනීම සඳහා ඩිපෝ ගානේ රස්තියාදු වෙන ක්‍රමය වෙනුවට "ස්මාට් කාඩ් ක්‍රමයක්" හඳුන්වා දී ඒ මගින් SMS හරහා "රීලෝඩ් ක්‍රමයට" ගෙවීම් කිරීමට අවස්ථාව සලසමි.

# 14 පණ සේ සුරකින පරිසරය

මිනිසා විසින් පරිසරය පරාජය කිරීම සඳහා කරන සදාතනික අරගලයේ මිළ අනාගත පරම්පරාව විසින් ගෙවිය යුතුය. ඒ පරිසරය අප අනාගතයෙන් ලබා ගන්නා ණයක් වන හෙයිනි. එබැවින් මිනිසා සහ ස්වභාව ධර්මය අතර පැවතිය යුත්තා වූ අනුඋල්සනීය සබඳතාව නොබිඳෙන පරිදි 2005 මහින්ද චින්තනයේ පොරොන්දු වූ පරිදිම හෙටත් මම පරිසරයේ භාරකාරයා ලෙස සඳහා කටයුතු කරන්නෙමි.

## අප රකිනා වනන්තරේ

- ශ්‍රී ලංකාවේ පිහිටි සියලු වනාන්තර මිනුම් කොට මායිම් සලකුණු කිරීම සඳහා වන මිනුම් කොමිසමක් පත්කරමි.
- රජයේ සහ පෞද්ගලික අංශයේ ද ඉඩම් උපයෝගී කරගෙන හෙක්ටයාර් තුන්ලක්ෂ පනහස් දහසක අලුතින් වන වගා කරන අතර විනාශ වීමේ තර්ජනයට මුහුණ පා තියෙන ස්වභාවික වනාන්තර නැවත ප්‍රතිෂ්ඨාපනය කරමි.
- වල්ලපට්ටා, සුදු හඳුන් සහ ගල්සියඹලා වැනි මූල්‍ය වටිනාකම සහිත ගස් වර්ග 15 වානිජ හා ගෘහාශ්‍රිත වගාවන් ලෙස ව්‍යාප්ත කිරීමට සහ එහි අස්වනු බාධාවකින් තොරව නෙළාගැනීමට අවශ්‍ය නීති සංශෝධනය කිරීමට පියවර ගන්නෙමි.
- දැව කර්මාන්තය සඳහා අවශ්‍ය වන තේක්ක, නැඳුන් වැනි ගස් වර්ගවලින් යුත් ගෘහ වනවියන් වගාව ව්‍යාප්ත කරමි.
- කාබන් දහනය සාමාන්‍ය ගසකට පනස් ගුණයකින් වැඩි කඩොලාන සංවර්ධනය සඳහා සොබා සෞන්දර්ය සංචාරක කර්මාන්තයේ යෙදෙන ලොකු කුඩා සංචාරක ව්‍යාපාරිකයන් ද සම්බන්ධ කරගන්නෙමි.

- වන වගාව ඇසුරෙන් අලුතින් ඇතිවන කාබන් සංචිතයේ වැඩිවීම වාර්ෂිකව ගණනය කර එක්සත් ජාතීන්ගේ “දේශගුණික වෙනස්වීම් පිළිබඳ ප්‍රඥාප්තියේ” සඳහන් ගෙවීම් අනුව පරිසරය විනාශ කරන රටවලින් අප රටට ලබා ගැනීමට කටයුතු කරමි.

- පරිසර සංරක්ෂණය සහ පරිසර අපරාධ වැළැක්වීම සඳහා දැනට ඇති නීති පිළිබඳ සලකා බලා අනාගතයටත් ගැළපෙන පරිදි අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා “පරිසර නීති සම්පාදක කමිටුවක්” පත් කරමි.

## පංච කේන්ද්‍රීය පරිසර සංරක්ෂණ ප්‍රතිඥාව

නිදහසේ ඉහළට ගන්නා සුසුමෙහි පවා විස මුසු වී තිබේ නම්, පොළොවෙන් උණන ජලයෙහි සහ පසෙහි වස මුසු වී තිබේ නම්, මිහිරි විය යුතු ශබ්දය අප පෙළයි නම්, නා නා විසූක දස්සන අප දෙනෙත් වෙහෙසයි නම් මිහිමත ජීවිතය මිනිසාට සොඳුරු නොවන බව මම දනිමි. එබැවින් වායු, ජල, පාංශු, ශබ්ද සහ දෘෂ්ටි යන පංචවිධ පරිසරය දූෂණය මාර්ග වසා දැමීම සඳහා “පංච කේන්ද්‍රීය පරිසර සංරක්ෂණ ප්‍රතිඥාවක්” සකස් කරමි.

- ඕසෝන් ස්ථරයට හානිකර සියලුම ආකාරයේ වායුවර්ග රට තුළ භාවිතය 2020 වන විට සම්පූර්ණයෙන්ම නවතා දමමි. ඒ වෙනුවට ශීතකරණ, වායු සමීකරණ, විදුලි පංකා, විවිධ මෝටර් වර්ග ආදිය දේශීයව නිපදවීමේදී අහිතකර වායුවර්ග භාවිතය වැළැක්වීම සඳහා “තරු ලකුණු සහතික ක්‍රමයක්” හඳුන්වා දෙන්නෙමි.

- විදුලි බුබුළුවල ඇති රසදිය සහ තීන්තවල ඇති ඊයම් මනුෂ්‍ය ශරීරයට අහිතකර බැවින් වඩාත් පරිසර හිතකාමී විදුලි නිෂ්පාදන රට තුළ බහුල කිරීම සඳහා ආකර්ෂණීය බදු සහන ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

- භූගත හා මතුපිට ජලයට මුසුවන කාර්මික මෙන්ම කෘෂි රසායනික නිසා සිදුවන ජල දූෂණය වැළැක්වීමේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාවේ යොදවන්නෙමි.

- මැණික් පතල් කර්මාන්තය මගින් භූගත ජලයට මෙන්ම ජල උල්පත්වලටත් සිදුවන හානි අවම කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ එම කර්මාන්තය පිළිබඳ අධීක්‍ෂණය පුළුල් කිරීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ශක්තිමත් කරමි.

- පළිබෝධ නාශක සහ රසායනික පොහොර මගින් විෂ සහිත බර ලෝහ පරිසරයට එකතුවීම වැළැක්වීම සඳහා ඊට අදාළ නීති රීති නොපමාව ශක්තිමත් කරමි.

- වකුගඩු රෝගවලට හේතුවන බවට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශ කරන ලද පළිබෝධ නාශක ආනයනය සහ භාවිතය නැවැත්වීමට කඩිනමින් අවශ්‍ය පියවර ගන්නෙමි.

- කසළ සම්පතක් ලෙස යොදාගත හැකිවන අයුරින් කසළ කළමණාකාරීත්ව වැඩපිළිවෙළ ඉදිරි වසරේදී අනිවාර්ය සංවර්ධන කාර්යයක් ලෙස ක්‍රියාවට නංවමි.

- ශබ්ද දූෂණය වැළැක්වීම සඳහා නියමිත ප්‍රමාණයට වඩා ශබ්දයෙන් වාහන නළා හැඬවීම වලක්වන්නෙමි. නාගරික හෝ ජනාශ්‍රිත ප්‍රදේශයන්හී පැවැත්වෙන අධික ශබ්දය පතුරවන සියලු ක්‍රියාකාරකම් සඳහා භාවිත කල හැකි ශබ්ද පරිමාවන් හඳුන්වා දෙන්නෙමි.

- ප්‍රචාරණවාදය වඩ වඩා පැතිරීමත් සමඟ අපට ඇස ගැටෙන්නට සලස්වා ඇති විවිධ දර්ශනයන් හා වර්ණ දෘෂ්ඨි දූෂණයවීමට බලපාන ප්‍රධාන හේතුවකි. නිතර ඇස ගැටෙන තැන්හී ආලේපිත වර්ණ ද එසේය. එබැවින් දෘෂ්ටි දූෂණය වැළැක්වීම සඳහා මාර්ගෝපදේශ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කරමි.

- මෙම පංච දූෂණ ක්ෂේත්‍රයන් ආශ්‍රිතව පර්යේෂණ කිරීමට ඉදිරිපත්වන විද්‍යාඥයින්ට රජයේ පූර්ණ අනුග්‍රහය ලබා දෙන්නෙමි.

- පාසිකුඩා, නිලාවැලි, උණවටුන වැනි ලෝකයේ අතිරමණීය වෙරළ තීරයන් කීපයක උරුමය ලැබීමට අප ලත් භාග්‍යය මතු පරපුරට ද දායාද කිරීම උදෙසා වෙරළාශ්‍රිත නීතිය ශක්තිමත් කරන අතර මහජනයා සහ පරිසර විද්වත් සංවිධාන එක් කොට පරිසර ආරක්ෂක බලමුලුවක් ගොඩ නගමි.

## ගජ මිතුරු ආරවුල

- අනාරක්ෂාවට ලක්වී ඇති සියලු ගම්මානවලට අලිවැට නොපමාව ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, වාහන සහ අනෙකුත් සම්පත් අදාළ අංශ වෙත ලබාදීමට පියවර ගන්නෙමි.

- විසි හතර පැය පුරා ගම්මානවලට වන සතුන් ඇතුළ්වීම වැළැක්වීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ අදාළ රාජ්‍ය අංශ සහ ග්‍රාමීය ස්වෙච්ඡා සමිති සහ රාජ්‍ය නොවන සංවිධාන ආදියෙන් සැදුම්ලත් "*ප්‍රජා වන ආරක්ෂක බලකායක්*" පිහිටුවමි. මිනිසුන්ට සිදුවන හානි වැළැක්වීම මෙන්ම වන සතුන්ට හානි නොකිරීම එම බලකායේ වගකීමක් බවට පත් කරමි.

- එවැනි අනතුරුවලින් ගෘහ මූලිකයා මියගිය පවුල්වලට මාසික දීමනාවක් ලබාදීමටත් එම ප්‍රදේශවල සෑම පුද්ගලයෙකුම නොමිලේ ජීවිත රක්ෂණයක් ලබා දීමටත් කටයුතු කරමි.





# 15 තිරසර ජන සෙවන

ශ්‍රී ලංකාවේ සෑම පවුලක්ම නිවසක් හිමි පවුලක් විය යුතු බවට විශ්වාසය තබමින් ජාතික නිවාස ප්‍රතිපත්තියක් එළිදැක්වීමට හැකිවීම නිවාස හා ජානාවාස ක්ෂේත්‍රයේ අප ලැබූ සුවිශේෂි ජයග්‍රහණයකි. ඒ යටතේ නිවසක් අහිමි සෑම පවුලක් සඳහාත් අනාගත පරපුර සඳහාත් තමන්ගේම නිවසක් හිමිකර දීමේ වැඩසටහන මුළු ශ්‍රී ලංකාවම පුරාම ඒකාබද්ධ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරමි.

- සියලුම නගරවල නාගරික පැල්පත් හා මුඩුක්කු ජනාවාසීන්ට සියලු දෙනාට සියලුම අභ්‍යන්තර පහසුකම් හා පොදු සහසුකම්වලින් සැපිරුණු නිවසක අයිතිය සහතික කරන නාගරික ප්‍රතිජනනීය වැඩසටහන යටතේ ඉදිරි හය වසර තුළ දී නිවාස ඒකක 60000 ක් ඉදිකිරීමට කටයුතු කරමි.

- වතුකරයේ ජීවත්වන සෑම පවුලකටම පර්චස් 07 ඉඩමක් සහ තමන්ගේම නිවසක් ලබාදීම සඳහා නාගරික සංවර්ධන සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ දැනටමත් මූලික කටයුතු ආරම්භ කර ඇති අතර එම වැඩසටහන යටතේ 2015/2016 තුළ වතු නිවාස 50,000ක් ඉදිකරමි.

- හඳුනාගෙන ඇති සියලුම අවදානම් සහගත ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාවට නොපමාව ආරක්ෂිත ප්‍රදේශවල නිවාස හිමි කරදීමේ කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- ස්ථාවර ආදායම් මාර්ගයක් ප්‍රකාශ කිරීමට නොහැකි සහ අවශ්‍ය සුරැකුම් නොමැති ග්‍රාමීය නාගරික අඩු ආදායම්ලාභීන්ට ජන සෙවන වැඩසටහන් යටතේ නිවාස ණය පහසුකම් ලබා දීමේ වැඩසටහනක් තව දුරටත් ශක්තිමත් කරමි. මූල්‍ය පහසුකම්වලට අමතරව අඩු වියදම් නිවාස ඉදිකිරීමේ තාක්ෂණික පහසුකම් සපයන්නෙමි.

## මධ්‍යම පංතියට මැඳුරු මහල් නිවාස අයිතිය

- නාගරික ප්‍රදේශවල ජීවත්වීමට කැමති ඉහළ මැදි ආදායම් කාණ්ඩයේ ජනතාවට නවීනත්වයෙන් යුත් අලංකාර නිවාස යෝජනා ක්‍රමයක් රාජ්‍ය බැංකුවල ආයෝජන මගින් ක්‍රියාත්මක කරමි. එම නිවාස සඳහා 90% දක්වා වසර 30ක කාලයක් සඳහා බැංකු ණය ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

- රාජ්‍ය බැංකුවලින් නිවාස ණය ලබා දීමේදී දැනට ක්‍රියාත්මක වන සංකීර්ණ සහ කල්ගතවන ක්‍රමවේදය වෙනුවට අඩු ලියකියවිලි ප්‍රමාණයක් සහ බැංකුව මගින්ම ලියකියවිලි සකස්කර දීමේ සේවාවක් ද හඳුන්වා දීමට කටයුතු කරමි.

# 16 යටිතල පහසුකම් විප්ලවය නොනැවතී ඉදිරියට

ත්‍රස්තවාදය විසින් උතුරු නැගෙනහිර පමණක් නොව රටපුරාම සියලු යටිතල පහසුකම් සංවර්ධනයට නැවතීමේ තිත තබා තිබුණි. ඒ වෙනුවට දිනපතා අපේ නෙත ගැටුණේ ගිනිගත් කඩා බිඳ දමන ලද ගොඩනැඟිලි සහ පුපුරවා හන ලද පාරවල්ය. කඩා දමන ලද විදුලි කණුය. ගමට කිසිදු පහසුකමක් නොවූ අතර නගරය කුණෙන් දූවිල්ලෙන් අපිරිසිදුකමෙන් පිරී තිබුණි. මම යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ විශ්මජනක විප්ලවයක් කළෙමි. මම මේ නෙත් සිත් නොඅදහන විලප්ලවය ඉදිරියටම ගෙනයන්නෙමි.

## ලස්සන නගරයක්

වට පවුරෙන් වසා දමා නෙත කොටුකළ කොළඹ නගරයේ බැමි බිඳ දමා මම එය ඔබේ දෑසට විවර කළෙමි. කොළඹ නගරය, දියවන්නා පෙදෙස, බෙල්ලන්විල සහ නුගේගොඩ වැනි නාගරික සංවර්ධන ව්‍යාපෘති ඔබේ අප්‍රමාණ ප්‍රීතියට හේතු වී ඇති බව මම දනිමි.

- 2020 වන ට කොළඹ නගරය දකුණු ආසියාවේ අලංකාරම නගරය බවටත් ශ්‍රී ජයවර්ධනපුර ප්‍රදේශය දැකුම්කලු හා ක්‍රමානුකූලම පරිපාලන අග නගරය බවටත් පත්කරමි.

- ඊට සමගාමීව දිවයිනේ සෑම නාගරික ප්‍රදේශයක්ම පරිපාලන ගොඩනැගිලි, හෝටල්, නිවාස ව්‍යාපෘති, නාගරික උද්‍යාන, විනෝද කටයුතු, නගර අලංකරණ ව්‍යාපෘති හෝ මිශ්‍ර සංවර්ධන කටයුතුවලින් යුත් පරිසර හිතකාමී සහ ජීවත්වීමට ප්‍රිය උපදවන සැබෑම නගර බවට පත් කරමි.

- මූලික පහසුකම් පවා නොමැති, නමුත් විවිධ ග්‍රාමීය ප්‍රදේශ එකට යාකරන ජනතාවගේ සේවා පහසුකම් සැපයුම් මධ්‍යස්ථාන බවට පත්වී ඇති කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ නගර 100 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- දැනටමත් ක්‍රියාත්මක වන වෙළඳුන්ට සහ පාරිභෝගිකයිනට අවශ්‍ය පහසුකම් සියල්ලෙන්ම සපිරි නාගරිකපොළ සංවර්ධන වැඩසටහන යටතේ මුළු දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් නගර 75ක පොදු පොළවල් ඉදිකරමි.

- මහජන අවශ්‍යතාව අනුව නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නව නාගරික ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා ප්‍රකාශිත කලාපවල සංවර්ධන සැලසුම් පිළියෙළ කරමි. එම බලතල යටතේ මහත්මා ගාන්ධිතුමන් විසින් 1943 දී ලංකාවට පැමිණ හමුවක් පැවැත්වූ ගැස්පහ හන්දිය සංවර්ධනය කර මහත්මා ගාන්ධි චතුරස්‍රය ලෙස නම් කරමි.

- මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වලට අයත් නගර හෝ නාගරික ප්‍රදේශ සංවර්ධන කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සම්පාදන සහාය නාගරික සංවර්ධන අධිකාරියෙන් සහය ලබාදීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරමි.

## මහ මං පුනරුදය

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නිශ්චිත මාර්ග සිතියමක් හා සංවර්ධන සැලැස්මක් සහිතව මාර්ග ඉදිකිරීම් ආරම්භ කරන ලද්දේ මම මහා මාර්ග ඇමතිවරයාව සිටි අවදියේ සිට ම බව මම සදහන් කරන්නේ ආඩම්බරයෙනි. ගම නැගුම යටතේ ගමේ පාර කොන්ක්‍රීට් කිරීමෙන් ඇරඹුණ ඒ මාර්ග පුනාරෝදය මේ වන විට අධිවේගී මාර්ග දෙකක් බිහි කිරීම දක්වා විහිදී ඇති බව ඒවායේ යන එන ඔබ හොඳින්ම දන්නා බව මට විශ්වාසය.

- දක්ෂිණ අධිවේගී මාර්ගය, මත්තල ගුවන් තොටුපොළ සහ හම්බන්තොට වරායන් යා කරමින් දීර්ඝ කරමි.

- දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිට පැල්මඩුල්ල දක්වා රත්නපුර අධිවේගී මාර්ගය ඉදි කරමි.

- පිටත වටරවුම් මාර්ගයෙන් ආරම්භ වී වයඹ, උතුරු මැද, නැගෙනහිර පළාත් හරහා යාපනයට දිවෙන උතුරු අධිවේගී මාර්ගය ඉදි කරමි.

- උතුරු අධිවේගී මාර්ගයෙන් ඇරඹෙන මහනුවර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නොපමාව ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු කරමි.

- සියළු අධිවේගී මාර්ග එකට යා කරන කොළඹ පිටත වටරවුම් මාර්ගයයේ කඩුවෙල සිට කඩවත දක්වා කොටස 2015 දී විවෘත කරමි.

- 2020 වන විට මත්තල ගුවන්තොටුපලේ සිට යාපනයටම අධිවේගී මාර්ග වලින්ම යා හැකි පෙරළිය මම කරමි.

- පසුගිය කාලය තුළ ක්‍රියාත්මක කරන ලද මහ මාර්ග පලාත් සභා, ප්‍රාදේශීය සභා සහ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමෙන් පසුව ඔබ කොහේ ජීවත් වුවද ඔබේ නිවසේ සිට පැය හයක් ඇතුළත ලංකාවේ ඕනෑම තැනකට යාහැකි මාර්ග සිතියම මම දිග හරිමි.

- ජාත්‍යන්තර රළුභාවය මැනීමේ දර්ශකයට අනුව අපේ මාර්ග වල තත්ත්වය 2020 දී 100% දක්වා වැඩි කිරීමට අරමුණු කරමි.

## සැමට ජලය

ජලය සඳහා සැමට ඇත්තේ සමානවූත් ශුද්ධවූත් අයිතියකි. මම ඒ අයිතිය පිළිගන්නෙමි. වාරි ජලය මෙන්ම 2020 වන විට සැමට පිරිසිදු පානීය ජලය ලබා දීමෙන් ඒ අයිතිය සහතික කරමි.

- කවදත් ජලසම්පතින් පොහොසත් අපේ සමස්ත ජනතාවටම නල ජලය ඇවැසි නොවන නමුත් නාගරික ජනයාගේ ජල අවශ්‍යතාව ඒ මත රඳාපවතින බැවින් ඉදිරිවසර දෙක ඇතුලත

සියලුම නාගරික නිවාසවලට නළ ජලය සැපයීමට කටයුතු කරමි.

- කොළඹ නගරය හා උපනාගරික ප්‍රදේශවල පානීය ජලධාරිතාව ඉහළ නැංවීම සඳහා පියවර ගන්නෙමි.
- ඒ යටතේ 2015 දී සේවා දිගු කිරීමේ පහසුකම් ඇති ප්‍රදේශවල නව ජල සම්බන්ධතා 400,000 ක් ලබා දෙන්නෙමි.
- පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කල පරිදිම අනුරාධපුර දිස්ත්‍රික්කයේ වකුගඩු රෝග නිවාරණය කිරීමේ පියවරක් ලෙස 2015 දීම නල ජල සැපයුම 100% බවට පත් කරමි.

## බලශක්තිය

අනාගත කාර්මික ආර්ථික සංවර්ධනයේ ගාමක බලවේගය වන්නේ බලශක්තිය බව මම දනිමි. එබැවින් ඊට ගැලපෙන ආකාරයට බල ශක්ති ක්ෂේත්‍රය තව දුරටත් ශක්තිමත් කරමි.

## ඛණිජ තෙල් කර්මාන්තය

- විද්‍යාත්මක කළමනාකරණ වෙනස්කම් තුළින් පාඩුපිට පාඩු ලබමින් තිබූ ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ලාභ ලබන ආයතනයක් බවට කිරීම නිසා සාමාන්‍ය ජනතාවට සහන සැලසීමට කටයුතු කරමි.
- රජයේ සහනාධාර නොමැතිව වසර පුරා ස්ථාවර මිළක් පවත්වාගෙන යමින් භූමිතෙල් අඩු මිළක පවත්වාගෙන යාමට කටයුතු කරමි.

- ඛණිජ තෙල් අවශ්‍යතාවයට ගැළපෙන පරිදි සහ නූතන තාක්ෂණයට ගැලපෙන අයුරින් ඛණිජ තෙල් පිරිපහදුව නවීකරණය කිරීමෙන් පිරිපහදු ධාරිතාව දෙගුණ කිරීමෙන් ඉන්ධන සුරක්ෂිතතාවය තහවුරු කරමි.

- දිවයින පුරාම හිඟයකින් තොරව ඉන්ධන බෙදා හැරීම සඳහා කලාපීය ඉන්ධන ගබඩා ස්ථාපනය කරමි.

## විදුලි බලය

මහින්ද චින්තන ඉදිරි දැක්මේදී මා පොරෙන්දු වූයේ 2016 දී සැමට විදුලිය ලබා දීමටය. මේ වසර අවසානය වන විට එම පොරොන්දුව ඉටුකරන්නට ලැබීම මා ලැබූ ජයග්‍රහණයකි. ජාතික බලශක්ති නිෂ්පාදනය සඳහා 2010 දී සැලසුම් කළ සියලු යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීමෙන් ලැබුණු ලාභය ජනතාව අතට පත් කිරීම 2020 දී මගේ අරමුණයි.

- අඩු ආදායම්ලාභී පවුල් සඳහා නව විදුලි සම්බන්ධතා ලබාදීමේදී අඩු පොලී ණය මුදලක් වසර 6ක් තුළ විදුලි බිලෙන් අඩුකර ගැනීමේ පදනම මත ලබා දෙන්නෙමි.

- කුඩා සහ මධ්‍යපරිමාණ කර්මාන්ත, ජාත්‍යන්තර කර්මාන්ත වර්ගීකරණයට අනුකූලව සහනදායී මිලකට විදුලිය ලබාදීමට කටයුතු කරමි. එමගින් අඩුවන විදුලි ගාස්තුව මගින් එම ව්‍යවසායකයන්ට විශාල සහනයක් අත්වනු ඇත.

- 2020 වන විට පිරිමැසුම්දායී විදුලි පරිභෝජන සඳහා පාරිභෝගිකයන් දිරිමත් කරනු පිණිස අඩුවිදුලියක් වැයවන භාණ්ඩ ආනයනය හා නිෂ්පාදනය දිරිගන්වන අතර එකී භාණ්ඩ හඳුනා ගැනීම සඳහා බලශක්ති කාර්යක්ෂම ලේබල් (Energe Efficenccy) ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

- සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාර මගින් 2020 දී මුලු විදුලි උත්පාදනයෙන් 25% දායකත්වයක් ලබා ගැනීමට කටයුතු කරමි.

- යෝජිත සාක් කලාපීය විදුලි ජාලය හා සම්බන්ධවීමෙන් ලංකාව සහ ඉන්දියාව අතර බලශක්ති වෙළඳාමට සම්බන්ධවීමට අපේක්ෂා කරමි.

## සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය

ශ්‍රී ලංකාව තොරතුරු තාක්ෂණය සඳහා ඉතා ශක්තිමත් අඩිතාලමක් දමා ඇති බැවින් තාක්ෂණය සහ සන්නිවේදනය අපේ ආර්ථික වර්ධනයේ ඊළඟ දොරටුවයි.

- සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය පාවිච්චි කරමින් ජනතාවට ලබා දෙන සේවාවන් වඩාත් සුහදව සහ කාර්යක්ෂමව ලබාදීමට බලාපොරොත්තු වෙමි.

- සෑම දිස්ත්‍රිකයකම සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන අතර BPO මධ්‍යස්ථාන 100 ක් සහ මහින්දෝදය සහ මිස්සක ඊ නැණ පියස විද්‍යාගාර 400 ක් ඉදි කරමි.

- එමගින් නව රැකියා අවස්ථාවන් 10000 බිහි කරන අතර අප රටේ සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව 2020 දී 100% ඉහළ නංවමි.

- සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් වෙනුවෙන් වෘත්තිමය ආයතනයක් පිහිටුවමි.

- රජයෙන් ලබා දෙන සේවාවන් 300 ක් අන්තර් ජාල සේවාවන් බවට පත් කරන අතර ඒ ආකාරයට සියළුම පුද්ගලයින්ගේ තොරතුරු සහ ඉඩම් පිළිබඳ තොරතුරුද අන්තර්ජාල ගත කිරීමට කටයුතු කරමි.

## අභ්‍යවකාශ තාක්ෂණික ක්ෂේත්‍රයේ පුළුල් වන නිම් වලල්ල

ජාතික ආර්ථිකය නවෝත්පාදන මගින් සවි බල ගැන්වෙන දැනුම් ආර්ථිකයක් බවට පත් කිරීමේ කාර්යයෙහි ලා ප්‍රමුඛයා වන්නේ අභ්‍යවකාශ තාක්ෂණය බව මම දනිමි. මෙම ක්ෂේත්‍රය පිළිබ අපේ ප්‍රතිපත්තිමය දිශානතිය නම් මෙම අංශයෙන් ඉහළම ශක්‍යතාවන් අත්කර ගෙන සිටින රාජ්‍යයන් සමග ප්‍රසස්ත තාක්ෂණික සහයෝගීතාවක් පවත්වාගෙන යාමයි.

- අධි තාක්ෂණික චන්ද්‍රිකා පෘතුවි මධ්‍යස්ථාන පහසුකම් වලින් යුත් ලෝකයේ ක්‍රියාත්මක වන පෘතුවි නිරීක්ෂණ චන්ද්‍රිකා වලින් දුරස්ථ සන්නිවේදන දත්ත ප්‍රතිගහනය කරගෙන බෙදා හැරීමේ ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවමි.

- ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් හා විද්‍යාඥයින් සැලසුම් කොට නිර්මාණය කරනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රථම පෘතුවි නිරීක්ෂණ දුරස්ථ සන්නිවේදන චන්ද්‍රිකාව 2020 වන විට කක්ෂගත කිරීමට කටයුතු කරමි.

- තවද කෘෂිකර්මය, ස්භාවික සම්පත් කළමණාකරණය, නාගරික සංවර්ධනය, පරිසරය, කාළගුණය, දේශගුණික විපර්යාස අධ්‍යනය, සමුද්‍රීය පරිසරය, ප්‍රවාහනය, ගුවන් හා නාවික කටයුතු වැනි සංවර්ධනයට අදාළ විවිධ ක්ෂේත්‍රයන්හි කාර්‍යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීමේ ලා අභ්‍යාවකාශ තාක්ෂණික භාවිතයන් උපයෝගී කර ගැනීමේ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

# 17 විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදනය

අප දැන් එළඹ සිටින්නේ වේගවත් ආර්ථික සංවර්ධනයක් කරා ගමන් කිරීමේ මොහොතටය. පිබිදෙන ආසියාවේ අංක එකේ පංගුකාරත්වය දිනා ගැනීමට නම් අප නියත ලෙසම විද්‍යාව තාක්ෂණය අතින් පෙරමුණ ගත යුතුමය.

- විද්‍යාත්මක සාක්ෂරතාවය සහිත දැනුම් සමාජයක් බිහි කිරීමේ ක්‍රියාවලියට නායකත්වය සැපයීම සඳහා ජාතික විද්‍යා මධ්‍යස්ථානක් පිහිටුවමි.

- දැනුම මත පදනම් වූ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනයට සහය වනු පිණිස ශ්‍රී ලංකා නවෝත්පාදන අරමුදලක් ස්ථාපිත කෙරෙනු ඇත.

- ශ්‍රී ලංකාව විද්‍යාව හා සංවර්ධනය පිළිබඳ ආසියානු කේන්ද්‍රයක් බවට පත් කිරීමෙන් විද්‍යාත්මක දැනුම මුදල් බවට පරිවර්තනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- 2020 වන විට අධිතාක්ෂණික අපනයනයන් 15% ක් දක්වා ඉහළ නැංවීමේ සැලැස්ම බලගන්වමි.

- ආනයනික භාණ්ඩ වෙනුවට තාක්ෂණික වටිනාකමකින් යුත් දේශීය භාණ්ඩ නිපදවීම සඳහා විද්‍යාත්මක දැනුම එක් කිරීමට යෝජනා කරන අතර ඒ සඳහා වැයවන ප්‍රාග්ධන ආයෝජන වෙනුවෙන් බදු සහනයක් ලබා දෙන්නෙමි.

- 2006 දී අරඹන ලද ජාතික නැනෝ තාක්ෂණික මූලාරම්භය ඔස්සේ දැනුම් ආර්ථිකයක් උදෙසා දායකවීමට අපේ විද්‍යාඥයින්ට හැකිවන ආකාරයට විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදක බලකායක් පිහිටුවමි.

- කාර්යසාධනය මත දිරි දීමනා ලැබීමට හැකිවන ජාතික පර්යේෂණ බලමුළුවක් නිර්මාණය කරමි. එමඟින් බුද්ධි ගලනය වෙනුවට බුද්ධි ලාභයක් රටට හිමි වන අතර මෙරට හා විදේශයන්හි ජීවත්වන ශ්‍රී ලාංකීය විද්‍යාඥයන්ට එම බලමුළුවට එක්වීමට ආරාධනා කරමි.

- අපගේ රටේ සමාජ ආර්ථික සංවර්ධනය සිදු කිරීමට ජීවවිද්‍යාත්මක සම්පත් යොදා ගැනීමේදී අපගේ පොහොසත් ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සහ සුරක්ෂිත කිරීම මම සහතික කරමි.

- අධිතාක්ෂණික නිෂ්පාදන සහ කර්මාන්ත උද්‍යාන රට තුළ බිහි කිරීමෙන් අගය එකතු කිරීමේ කර්මාන්ත සංවර්ධනය තුළින් අපනයනය දිරිගැන්වීමේ ක්‍රියාවලියක් ආරම්භ කරමි.

# 18 කලා කෙත අස්වනු මංගල්‍යය

විඳීම වෙනුවට විඳවීමේ උරුමය කරපින්නාගෙන ජීවත් වූ අඳුරු අවදියේ සිනමා හල්, රංගන ශාලා, සංදර්ශන වේදිකා පාළුවට ගොස් තිබුණි. රඟ දැක්වූ එකම නාට්‍යය මර බිය පමණි. මම ජාතික ආරක්ෂාව තරණය කළෙමි. අද නෙළුම් පොකුණේ දහසක් කලා මල් පිපෙයි. චිත්‍රපට, ටෙලිනාට්‍ය තරගයට නිමවෙයි. පොත්පත් ලියන්නෝ මෙන්ම කියවන්නෝ ද සුලභය. මේ කලා කෙත අස්වනු නෙළන සමයයි.

## සාහිත්‍යය

- ළමා සහ යෞවන සාහිත්‍ය කෘති ඇගයීම සහ ප්‍රචලිත කිරීම සඳහා සුවිශේෂී රාජ්‍ය යාන්ත්‍රණයක් හඳුන්වා දීම සඳහා අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වැය ශීර්ෂයක් වෙන් කරමි.

- සාහිත්‍ය සහ අනෙකුත් කලාකෘති නිර්මාණය සඳහා කළාකරුවන්ට සහන පොළියක් යටතේ බැංකු මගින් ණය ලබාදීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ ඊට අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා සරල සහ පහසු ක්‍රමවේදයක් සහිතව ජාතික මට්ටමින් එම ක්ෂේත්‍රවල විද්වතුන් සහ ප්‍රවීණ කලාකරුන්ගෙන් සමන්විත ජාතික නාමලේඛණයක් සකස් කරමි.

- කෙටි කතා, කවි පොත් සඳහා ඇති ඉල්ලුම පහත වැටී ඇති බැවින් එවැනි සාහිත්‍ය පොතපත මුද්‍රණය ඉහළ නැංවීම සඳහා මුද්‍රණ කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාරිකයින්ට නිශ්චිත බදු සහනයක් ලබාදීමට කටයුතු කරමි.

- තමන් විසින් කෘති ප්‍රකාශයට පත් කරන ලේඛකයින් හට මූල්‍යාධාර ලබා දීමේ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.





- ඒ ඒ ජනවර්ගයන් අතර තම හැඟීම් සහ සිතුවිලි හුවමාරු කර ගැනීම සඳහා සාහිත්‍ය සම්මාන උළෙලවලදී සම්මානයට පාත්‍රවන පොතපත සිංහල දෙමළ ඉංග්‍රීසි යන භාෂාවලට පරිවර්තනය කර රජයේ වියදමින් මුද්‍රණය කිරීමට කටයුතු සලසමි.

- දීර්ඝ කාලයක් මුළුල්ලේ නිහඬව පරිවර්තන කාර්යයේ යෙදෙන ලේඛක ලේඛිකාවන් මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි කර ඔවුනට එම වැඩසටහනේ ප්‍රමුඛතාව දෙන්නෙමි.

## නාට්‍යය කලාව

- ටවර් හෝල් රඟහල පදනම ආශ්‍රිතව ශ්‍රී ලාංකීය නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය උදෙසා ජාත්‍යන්තර නාට්‍ය මධ්‍යස්ථානයක් ඇති කිරීමට කටයුතු කරමි.

- නෙළුම් පොකුණ මෙන් සෑම පළාතකටම එක් අංගසම්පූර්ණ රංග ශාලා පරිශ්‍රය බැගින් ඉදිකරමි. නාට්‍ය පුහුණුවීමේ ස්ථාන හා කලාකරුවන්ට නවාතැන් ගැනීම සඳහා නේවාසිකාගාර ඊට ඇතුළත් කරමි.

- අනාගත නිර්මාණකරුවන් වේදිකාවට පය ගසන පාසල් රංගභූමි සංවර්ධනයට සංස්කෘතික අමාත්‍යාංශය යටතේ විශේෂ වැඩසටහනක් ආරම්භ කරමි.

## සිනමාව

- චිත්‍රපට ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා වාණිජ සිනමාව මෙන්ම කලාත්මක සිනමාවක් ද පවත්වාගෙන යාම අවශ්‍ය නමුත් එවැනි චිත්‍රපට සඳහා ආයෝජනය කරන නිෂ්පාදකවරුන් හිඟ බව මම දනිමි. එම නිසා ඒ සඳහා චිත්‍රපට සංස්ථාව හරහා ප්‍රාග්ධන ආයෝජන අරමුදලක් නිර්මාණය කරමි. කලාත්මක චිත්‍රපට නිර්මාණය සඳහා එමගින් සැබෑ නිෂ්පාදන වියදමෙන් 60% ක සහන පොලී ණය මුදලක් ලබා දෙන්නමි.

- කලාත්මක චිත්‍රපට පෙන්වීම සඳහා පස්වන මණ්ඩලය ද, තරුණ සිනමාවේදීන්ගේ නිර්මාණ සඳහා අවස්ථාව ලබාදීම සඳහා නවතම සිනමා ප්‍රදර්ශන මණ්ඩලයක් ස්ථාපිත කරමි.
- නාගරික හෝටල් නිවාස සංකීර්ණ හා විසල් සාප්පු සංකීර්ණ ආදී පොදු ස්ථානවල උසස් ගණයේ කුඩා සිනමා ශාලා ආරම්භ කිරීමට හැකිවනු පිණිස අදාළ අණ පනත් සංශෝධනය කරමි.
- සියලුම රංගශාලා සහ සිනමාශාලා නිසි ප්‍රමිතිකරණයට ලක් කරමි.
- ශ්‍රී ලාංකීය දෙමළ සිනමාවක් ගොඩනැගීම සඳහා කැපවන නිර්මාණකරුවන්ට පූර්ණ රාජ්‍ය අනුග්‍රහකත්වය ලබා දෙන්නෙමි.
- තරුණ කලාකරුවන් දිරිමත් කිරීම සඳහා ඔවුන්ගේ නිර්මාණ කාර්‍යයන් සඳහා තරුණ බැංකුව හරහා රුපියල් මිලියනයක් දක්වා ණය පහසුකම් ලබා දෙන්නෙමි.

## වැඩිහිටි කලාකරුවන්

- කලා ක්ෂේත්‍රය වෙනුවෙන් මුළු ජීවිතයම කැප කර වර්තමානයේ හුදකලාවීම සහ අසරණභාවයට පත් වී සිටින කලාකරුවන්ට ජීවිතයේ සැඳෑ සමය සාමකාමීව ගත කිරීම සඳහා කලාකරු කෘතගුණ නිවාස ක්‍රමයක් ආරම්භ කරමි.
- නිර්මාණ කාර්යයේ යෙදෙන නිර්මාණවේදීන් අනිවාර්ය විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක කර ගැනීම සහ ඒ තුළින් ඔවුන් වියපත් කළ අනුන්ට අත නොපා ජීවත්වීමට සුදුසු ආදායම් මාර්ගයක් සකස් කිරීම මගේ යුතුකමක් සේ සලකමි.
- ගීත නිර්මාණ ක්ෂේත්‍රයේ ගායක ගායිකාවන්ට හා ගීත රචකයන්ගේ නිර්මාණ අයිතිය සුරැකීම හා ඔවුන්ට හිමි ප්‍රතිලාභ ලබාදීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගනිමි.

# 19 සමාජ ආරක්ෂණය

වයෝවෘද්ධ දෙමව්පියන් රැකබලා ගන්නේ වැඩිහිටි දරුවන්ය. ඒ අපේ රටේ ඇති සමාජ ආරක්ෂණ ක්‍රමයයි. එහෙත් වර්තමානයේ ඇතිවී තිබෙන ඇතැම් විෂමතා නිසා කිසියම් පිරිසක් අසරණභාවයට පත්වන බව මම දනිමි. වැඩිහිටි වියේදී දැනෙන හුදෙකලාව ඔවුන් තුළ සියුම් හා සංකීර්ණ මනෝභාවයන් ඇති කරන බව මම දනිමි. එම නිසා අසරණභාවයට පත් වූවන් මෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ද කලාකරුවන්ට සුරක්ෂිත වැඩපිළිවෙළක් මම ක්‍රියාවට නංවමි.

- ආර්ථික සංවර්ධනයේ සහ සෞඛ්‍ය සංරක්ෂණයේ යහපත් ප්‍රතිඵලයක් වන්නේ ආයු අපේක්ෂාව ඉහළයාම සහ විශ්‍රාම වයසේදීත් නිරෝගීව වැඩ කිරීමට ඇති හැකියාව දියුණු වීමය. ඒ නිසා රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම විශ්‍රාමිකයින් නැවත වැඩෙහි යෙදිය හැකි “සංවර්ධන බලකායක්” මම නිර්මාණය කරමි. රටේ සංවර්ධන කාර්යන්හිදී අවශ්‍ය මගපෙන්වීම උපදේශනය සහ ඔවුගේ දැනුම හා අත්දැකීම් අදාළ කාර්යයට ලබාදීම ඔවුනට පැවරෙන කාර්යභාරයයි.

- විශාම වැටුප් සහ දැනට ක්‍රියාත්මක වන විවිධ සමාජ ආරක්ෂණ ක්‍රමයන් ආශ්‍රිතව ඇති ගැටලු සොයා බලා නොපමාව විසඳීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කරමි.

- දැනට ඇති සමාජ ආරක්ෂණය මණ්ඩලය පුළුල් බලතල සහිත නියාමන අධිකාරියක් බවට පත්කරමි.

- උපතින් හෝ අනතුරු මගින් ආබාධිත වී සිටින සෑම සාමාජිකයෙකුටම නිසි සමාජ ගෞරවය හා ආරක්ෂා සැලසෙන අයුරින් අධ්‍යාපනය ලැබීමට කිසියම් ජීවන වෘත්තියක නියැළීමට අවශ්‍ය “දිවි දිරිය වැඩසටහන” ක්‍රියාවට නංවමි.

- දිවාකාලය කාංසියෙන් තොරව ගත කිරීම සඳහා ශරීර සුවතාව පහසුකම් හා විනෝද පහසුකම්වලින් පරිපූර්ණ “දෙටුපුර අභිමන් සැල” මධ්‍යස්ථාන සෑම ප්‍රාදේශීය කොට්ඨාසයකම පිහිටුවමි.

- පැවති රජයන් 1977, 2001 යන මැතිවරණයන්ට පසුව සිදුකළ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් හට විවිධ හේතු නිසා අදාළ වන්දි මුදල් නොලැබී ඇති බව මට දැනගන්නට ලැබී ඇත. සියලු හේතු පසෙකලා එම ගෙවීම් වහාම සිදුකිරීමට පියවර ගන්නෙමි.

- වසර 20 කට වඩා වැඩි කාලයක් ජ්‍යොතිෂය සහ බලිතොවිල් විෂයන්හී හෝ සම්ප්‍රදායික දේශීය වෛද්‍ය ක්‍රමයන්හි නියැළෙන පිරිස්වලට අනෙකුත් කලාකරුවන්ට හා දේශීය වෛද්‍යවරුනට ලබාදෙන රාජ්‍ය අනුග්‍රාහකත්වය ලබා දෙන්නෙමි.

## ආපදා කළමණාකරණය

- නිතර ඇතිවන විවිධාකාරයේ ස්වභාවික අපදා කලින් හඳුනාගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් තරම් අතිනවීන තාක්ෂණික උපකරණ අදාළ අමාත්‍යාංශයට ලබා දෙන්නෙමි. එමඟින් විපතට පෙර අදාළ ජනතාව ආරක්ෂිත ස්ථාන වෙත යොමු කිරීමේ ක්ෂණික කාර්ය සාධන ඒකකයක් ස්ථාපනය කරමි.

- අපදාවලට මුහුණ දෙන ජනතාව ඉක්මනින් යථා තත්ත්වයට පත් කර ඔවුන්ගේ ජීවන පැවැත්මට හානි නොවන සේ ක්‍රියාත්මක වීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කරමි.

## මතින් අසරණ වූවන්

- මත්ද්‍රව්‍යවලට අබ්බැහිවී සිටින දුවා දරුවන් එයින් නිදහස් කර ගැනීම ජාතියේ යුතුකමකි. ඒ සඳහා දීර්ඝකාලීන මෙන්ම

කෙටිකාලීන ක්‍රමවේදයක් නිර්මාණය කොට ක්‍රියාත්මක කිරීම සඳහා "කාර්ය සාධන බලකායක්" වහාම ආරම්භ කරමි.

- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ තරුණ තරුණියන් සඳහා සෑම දිස්ත්‍රික්කයකම ආගමික සිද්ධස්ථානය කේන්ද්‍රකරගෙන පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපනය කරමි.

- ළමා අපරාධකරුවන් සහ සිරගතව සිටින තරුණයින් නිවැරදිව සමාජගත කිරීම සඳහාත් අපරාධකාරීත්වයේ විෂම චක්‍රයෙන් ඔවුන් ගළවා ගැනීම සඳහාත් ඔවුන්ගේ ජීවන අභිලාෂයන් ඉහළ නැංවීමට හැකිවන ආකාරයේ නව පුනරුත්ථාපන මධ්‍යස්ථාන ජාලයක් ස්ථාපනය කරමි.

# 20 සාමයේ සංහිඳියාවේ ප්‍රතිලාභ ජනතාවට

- ත්‍රස්ත ක්‍රියා සම්බන්ධයෙන් සැකපිට රඳවාගන සිටින, දැනට නඩු පවරා නැති සියලුම උතුරේ තරුණ තරුණියන්ට නඩුපැවරීම හෝ නොපැවරීම සම්බන්ධයෙන් සොයා බලා නොපමාව ක්‍රියා මාර්ගයක් ගැනීම පිණිස විශ්‍රාමික විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පූර්ණ බලතල සහිත කමිටුවක් පත් කරමි.

- ලෝකයේ කිසිදු රටක සිදු නොකළ පරිදි ඉතිහාසයේ පළමුවරට මානුෂීය මෙහෙයුමේදී ජනතාව අතහැර ගිය වාහන ද සඟවා තැබූ රන් අභරණ ද හමුදා නිසැරදි අනන්‍යතාව තහවුරු කර ගැනීමෙන් පසුව නැවත පවරා දීමේ කාර්යය ද මේ වසර තුළ සම්පූර්ණ කරමි.

- ත්‍රස්තවාදී තර්ජන පැවති අවස්ථාවේ ආරක්ෂක හමුදා විසින් පරිහරණයට ගනු ලැබූ තමන්ට අයත් නැති ඉඩකඩම් හා ගොඩනැගිලි ද මානුෂීය මෙහෙයුම අවසන් වීමෙන් පසු නැවත හිමිකරුවන්ට පවරා දීමේ කටයුතු මේ වන විට සෑහෙන දුරට නිමාකර ඇත්තෙමි. ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන පරිදි නිශ්චිත කාල රාමුවක් තුළ එම කටයුත්ත අවසන් කරමි.

- ත්‍රස්තවාදය හේතුවෙන් කලක් ප්‍රධාන සංවර්ධන ධාරාවෙන් බැහැරවී සිටි උතුරු නැගෙනහිර තරුණ තරුණියන් ජාතික සංවර්ධන ක්‍රියාදාමයට සමාන හවුල්කරුවන් ලෙස දායක කරගැනීම පිණිස සමාජ අනතර්ග්‍රහණ සහ සංහිඳියා ක්‍රියාවලිය වේගවත් කිරීම පිණිස මධ්‍යකාලීන කාල රාමුවක් තුළ නිශ්චිත වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

- ඉදිරි වසර තුළ දැයට කිරුළ උතුරු සහ නැගෙනහිර පළාතේ පැවැත්වීමට කටයුතු යොදමි.

- දිවයිනේ කවර පලාතක හෝ ත්‍රස්තවාදය නිසා අවතැන්වී සිටින කවර ජන කොට්ඨාශයකට හෝ අයත් වන්දි නොලැබී ඇති පවුල් වලට හිමි නිර්දේශිත වන්දි මුදල් ලැබී නොමැති නම් ඒවා වහාම ගෙවීමට කටයුතු කරමි.

- උතුරු සහ නැගෙනහිර පළාත්වලින් අවතැන්වූ සහ කඳවුරුගතව සිටින සිංහල, දෙමළ හෝ මුස්ලිම් ජනකොටස්වලට අයත් පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් කොට ඒ සියලූ දෙනාමට තමන්ගේම නිවසක පදිංචි වීමේ අයිතිය නොපමාව උදා කර දෙන්නෙමි.

- අවාසනාවන්ත ලෙස අතළොස්සක් වූ ජාතිවාදී හෝ අගම්වාදී පිරිස් විසින් ඇතිකරනු ලැබ ඇති සමාජ ගැටුම් අනාගතයේදී සම්පූර්ණයෙන්ම නැවැත්වීමට කටයුතු කරමි. එවැනි ගැටුම්වලට මැදිවී ඇති සිංහල, දෙමළ හෝ මුස්ලිම් සෑම ජනකොටසකටම අයත් පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ ආගම ඇදහීමේ අයිතිය තහවුරු කරමි.

- වතු ආශ්‍රිත ප්‍රදේශ වල දැනට ඇති ග්‍රාම සේවා කොට්ඨාශ වල විශාලත්වය නිසා ඒවායේ ජීවත්වන ජනතාවට තමන්ට අවශ්‍ය පරිපාලන කටයුතු කර ගැනීමේදි විවිධ ගැටලූ වලට මුහුණ දීමට සිදුවන බව මම දනිමි. එම නිසා එම කොට්ඨාශ නැවත සකස් කිරීමට කටයුතු කරමි.

- දිවයිනේ එක් එක් පළාත්වලට ඇති අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම්, යටිතල පහසුකම් හා පොදු පහසුකම් එක සමාන මට්ටමට ගෙන ඒම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමි.



## මහින්ද චින්තනයේ ආදර්ශය ලොවටම

2005 දී මහින්ද චින්තනය ඉදිරිපත් කරන විට ලෝකයේ කිසිදු රටකට තනිව නැගිටීමට නොහැකිය යන මතය දැරූ ජාත්‍යන්තර ආයතන අද පෞද්ගලීකරණය වෙනුවට කළමනාකරණ වෙනස්කම් සිදුකිරීම සම්බන්ධයෙන් උපදෙස් දෙන ඒකක ආරම්භ කර තිබීමේ ආදර්ශය අපේය. එමනිසා තම රටවල සංවර්ධන ප්‍රාර්ථනා ඉටුකර ගැනීමට කැමති රටවලට මහින්ද චින්තන ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ආකාරය පිළිබඳව මගපෙන්වීම සඳහා මහින්ද චින්තන ලේකම් කාර්යාලය නිර්මාණය කරමි.

**ඔබ සියලු දෙනාගේ ජන වරමින් මේ සියල්ල යථාර්ථයක් බවට පත් කිරීමට මට ඔබගේ අනුමැතිය, සහයෝගය, හා ශක්තිය අවශ්‍යය.**

**අප දිනූ රට, ගොඩ නැගූ ආදරණීය මාතෘභූමිය, ආසියාවේ අසිරිය**

**සහ**

**ලොව දිනූ අභිමානනීය දේශය බවට පත් කරමු.**

**මා ඔබට සුරක්ෂිත රටක සුබ අනාගතයක් පතමි.**





# සටහන්